

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

පටුන

(01) ආයතනික පැතිකඩ 1
1.1 ආයතනික තොරතුරු 2
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, මූලික වටිනාකම් සහ අරමුණු 3
1.3 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2022 5
1.4 කර්මාන්ත සඳහා සපයනු ලබන ප්‍රධාන සේවා සහ පහසුකම් 6
1.5 ආයතනික ව්‍යුහය 7
1.6 මණ්ඩලයේ ප්‍රධාන අංශ 8

(02) කළමනාකරණ සමාලෝචනය 9

(03) විශේෂ කාර්යසාධන අවස්ථා - 2022 12
3.1 ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය 13
3.2 ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල 2022 14
3.3 ඒකල කාර්මික ජනපදයේ කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා වන නියමු ව්‍යාපෘතිය 15
3.4 පශ්චාත් ඉංජිනේරු තාක්ෂණය භාවිතයෙන් විදුලි මෝටර් රථයක දේශීය මූලාකෘති නිෂ්පාදනය කිරීම 15
3.5 IDB සහ මහින්ද්‍රා අයිඩියල් පුද්ගලික සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම 16
3.6 “Getup – Start Up for a Wealthy Nation” ජාතික වැඩසටහන 16
3.7 කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අතර අවබෝධතා ගිවිසුම 17
3.8 ඛනිජ සම්පත් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම 18
3.9 භෞතික ප්‍රගතිය – 2022 18
3.10 අංශවල ආදායම - 2022 26
3.11 2023 වර්ෂය සඳහා අනාගත සැලසුම් 27

(04) අංශවල ප්‍රගතිය විශේෂ අවස්ථා 28
4.1 පරිපාලන අංශය 29
4.2 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS) 32
4.3 ඉංජිනේරු අංශය 38
4.4 කාර්මික ජනපද අංශය 50
4.5 අලෙවි අංශය 57
4.6 සැලසුම් අංශය 63
4.7 ප්‍රාදේශීය සංවර්ධන අංශය 67
4.8 තාක්ෂණික සේවා අංශය 76
4.9 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය 82
4.10 රබර් භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය 87

(05) මූල්‍ය සමාලෝචනය 93
5.1 විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 95
5.2 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 96
5.3 හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය 97
5.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 98
5.5 වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 99

(06) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ සමාලෝචනය 127

කෙටි යෙදුම් ලේඛනය

AD	-	පරිපාලන අංශය
ATRDC	-	යෝග්‍යතා තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
BMICH	-	බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
BPVB	-	ලංකා බොයිලර් සහ පීඩන යන්ත්‍ර මණ්ඩලය
BSC	-	පිත්තල භාණ්ඩ සේවා මධ්‍ය ස්ථානය
CDLPF	-	සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය
CEDACS	-	ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය
CNC	-	පරිගණක සංඛ්‍යාත්මක පාලනය
CSC	-	පොදු සේවා මධ්‍යස්ථානය
CTB	-	ලංකා ගමනාගමන මණ්ඩලය
DS	-	ප්‍රාදේශීය ලේකම්
ED	-	ඉංජිනේරු අංශය
E-commerce	-	ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය
EnMS	-	බලශක්ති කළමනාකරණ පද්ධතිය
EPC	-	විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය
EU	-	යුරෝපා සංගමය
FD	-	මූදල් අංශය
GDP	-	දළ දේශීය නිෂ්පාදනය
HDFC	-	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව
HODs	-	අංශ ප්‍රධානීන්
ICC	-	ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය
ICT	-	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
IDB	-	කාර්මික සංවර්ධන මණ්ඩලය
IEC	-	ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණික කොමිෂන් සභාව
IED	-	කාර්මික ජනපද අංශය
INBAR	-	ජාත්‍යන්තර උණ සහ වේවැල් සංවිධානය
IoT	-	අන්තර්ජාල දේවල්
ISO	-	ජත්‍යන්තර ප්‍රමිති සංවිධානය
IT	-	තොරතුරු තාක්ෂණය
JAS	-	ජපන් කෘෂිකාර්මික ප්‍රමිති
KPIs	-	ප්‍රධාන කාර්ය සාධන දර්ශක
Ltd	-	සීමාසහිත
MD	-	අලෙවි අංශය
MFIF	-	මධ්‍යම සංඛ්‍යාත ප්‍රේරක උදුන
MOU	-	අවබෝධතා ගිවිසුම
MPI	-	ක්‍රම සම්පාදන හා ආයෝජන අමාත්‍යාංශය
MSMEs	-	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
MT		මෙට්‍රික් ටොන්
NAITA	-	ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය
NBT	-	ජාතිය ගොඩනැගීමේ බදු
NMRA	-	ජාතික ඖෂධ නියාමන අධිකාරිය
NVQ	-	ජාතික වෘත්තීය සුදුසුකම්
PD	-	සැලසුම් අංශය
PPP	-	පුද්ගලික පොදු හවුල්කාරිත්වය
RDD	-	ප්‍රාදේශීය සංවර්ධන අංශය
RPDSC	-	රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය
R&D	-	පර්යේෂණ සහ සංවර්ධන
SCX	-	උපකොන්ත්‍රාත් හුවමාරුව
SDB	-	සණස සංවර්ධන බැංකුව
SEs	-	ස්වයං රැකියා නියුක්තිකයන්
SoP	-	උසස්වීම් යෝජනා ක්‍රමය
SoR	-	බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය
TSD	-	තාක්ෂණික සේවා අංශය
TVEC	-	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
UNIDO	-	එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය
UNOPS	-	ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය
USAID	-	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය
USDA	-	එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
Vat	-	එකතු කළ අගය මත බදු



(01) ආයතනික පැතිකඩ

1.1 ආයතනික තොරතුරු

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) 1966 දී 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ආරම්භ කරන ලද අතර ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය එහි වර්තමාන ස්වරූපයෙන් 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාගත කර ඇත. මෙම පනතට අනුව කාර්මික සංවර්ධනයේ නියැලී සිටින ආයතන ප්‍රවර්ධනය කිරීම සඳහා කර්මාන්තකරුවන්ට මූල්‍ය, තාක්ෂණික සහ පරිපාලන සහාය ලබා දෙන අතරම, රටේ කාර්මික අංශයේ සංවර්ධනයේ වගකීම පැවරී ඇති ප්‍රධාන ක්‍රියාකාරී හස්තය සහ ප්‍රමුඛතම ආයතනය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වේ. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීමයි. වර්තමානයේ එය රටේ ආර්ථිකයේ පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ සියලුම කර්මාන්ත ව්‍යාපාරවල නිසි සම්බන්ධීකරණයක් සහ අන්තර් සම්බන්ධිත වර්ධනයක් සඳහා සහාය වීම සඳහා විවිධ සේවාවන් සපයයි. තවද ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්තවල භාවිතා වන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රම වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා සුදුසු තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම සහ වඩා හොඳින් භාවිතා කිරීම සඳහා ක්‍රියාවලි සහ අපද්‍රව්‍ය නිෂ්පාදන ක්‍රම සොයා ගැනීම සිදු කරයි. මීට අමතරව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රයේ විදේශීය වෙළඳපල වෙත දේශීය කාර්මික නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය කරන අතර ශ්‍රී ලංකාවේ ඕනෑම කාර්මික ව්‍යාපාරයකට හෝ කාර්මික ආයතනයකට හෝ ඊට අදාළව අවශ්‍ය සේවා සහ පහසුකම් සපයයි. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය එහි ආරම්භයේ සිට පසුගිය වසර 53 තුළ රජයන් වෙනස්වීමත් සමඟ අමාත්‍යාංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක විය. දැනට කර්මාන්ත අමාත්‍යාංශයේ පරිපාලන විෂය පථය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ක්‍රියාත්මක වේ.

අපව අමතන්න

615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.

0112605111

0112605111

www.idb.lk

dg@idb.gov.lk

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, මූලික වටිනාකම් සහ අරමුණු

දැක්ම

"ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත සංවර්ධනය කිරීම"

මෙහෙවර

"ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික හා වාණිජ්මය පදනම සකසා දීම"

මූලික වටිනාකම්

- **පාරිභෝගික සේවා:**

"පාරිභෝගිකයා සතුටින් තබා ගැනීම"

- **වගවීම සහ අඛණ්ඩතාව:**

"ක්‍රියාවකට කැපවීම, වගකිව යුතු වීම සහ අවංකකම"

- **ඉගෙනීම සහ සංවර්ධනය:**

"වඩා හොඳ කාර්ය සාධනයක් සඳහා සේවකයාගේ කුසලතා, දැනුම සහ නිපුණතාවය වැඩි දියුණු කිරීම"

- **කණ්ඩායම් වැඩ:**

"පොදු ඉලක්කයක් සාක්ෂාත් කර ගැනීම සඳහා සාමූහික උත්සාහය"



ප්‍රධාන අරමුණු



1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ අර්ථ දක්වා ඇති මණ්ඩලයේ අරමුණු පහත පරිදි වේ:

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිගැන්වීම, ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා සහාය වීම.
- රටේ ආර්ථිකයෙහි පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සියලු කාර්මික ආයතනවල නිසි සම්බන්ධීකරණය හා අන්තර් සම්බන්ධතාවය වර්ධනය කිරීම සඳහා සහාය වීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝගී කර ගැනීම, කර්මාන්තවල භාවිතා වන තාක්ෂණික ක්‍රියාවලීන් හා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා සුදුසු තාක්ෂණය හා උපකරණ සංවර්ධනය කිරීම සහ අපද්‍රව්‍ය කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා ක්‍රියාවලි සහ ක්‍රමවේදයන් සොයා ගැනීම යන අරමුණු පෙරදැරිව කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- දේශීය කාර්මික නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- කාරක ප්‍රාග්ධනය, ණය, අලෙවිකරණ, කළමනාකරණ, තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් ලබාදීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති කවර හෝ කාර්මික ආයතනයකට හෝ ව්‍යාපාරයකට සම්බන්ධව හෝ ඊට අදාළව අවශ්‍ය වන සෑම ආකාරයකම සේවා සහ පහසුකම් සැපයීම.

මණ්ඩලයේ ක්‍රියාකාරකම්


- මණ්ඩලයේ අභියෝගාත්මක රාජකාරි සහ වගකීම් පරාසයන් හාර ගැනීමේ ක්‍රියාකාරී සහ මෙහෙයුම් ප්‍රවේශයන් පිළිබිඹු කරන විශේෂිත ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර පිළිබඳව මණ්ඩලය විසින් විවිධ අංශ සහ නියෝජිතායතන පිහිටුවා ඇත.

- 2020 වසරට පෙර ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය අමාත්‍යාංශ කිහිපයක අධිකාරිය යටතට පත් වුවද එතැන් සිට, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතී.

1.3 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2022

අංකය	තනතුර	නම	ආයතනය	කාල පරිච්ඡේදය	
				පත්වීමේ දිනය	පත්වීමේ අවසන් දිනය
1.	සභාපති	උපසේන දිසානායක මහතා	කාර්මික සංවර්ධන මණ්ඩලය	2020.01.01	2022.03.23
2.	සභාපති	සුනිල් ගුණවර්ධන මහතා	කාර්මික සංවර්ධන මණ්ඩලය	2022.03.24	2022.09.14
3.	සභාපති	වෛද්‍ය සාරංග අලහප්පෙරුම	කාර්මික සංවර්ධන මණ්ඩලය	2022.09.15	2025.09.15
4.	මණ්ඩලයෙහි නිලබලයෙන් පත්වන සාමාජික	චතුර මොහොට්ටිගෙදර මහතා	මුදල් අමාත්‍යාංශය	2021.01.27	2022.03.02
5.	මණ්ඩලයෙහි නිලබලයෙන් පත්වන සාමාජික	කේ.ජී.ආර්.ජී.ආර්. වික්‍රමවර්ධන මහතා	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව	2020.08.28	2023.08.28
6.	මණ්ඩලයේ සාමාජික	ආලෝක එන්. වහලවත්ත මහතා	-	2020.01.01	2023.03.17
7.	මණ්ඩලයේ සාමාජික	ඒ.ඒ.එන්. බුද්ධික විමලසිරි මහතා	-	2020.01.01	2023.01.01
8.	මණ්ඩලයේ සාමාජික	එම්.ආර් විමල් ජයවර්ධන මහතා	-	2020.01.01	2022.03.24
9.	මණ්ඩලයේ සාමාජික	එච්.ආර්.පී. පීරිස්	-	2020.01.01	2023.01.01
10.	මණ්ඩලයේ සාමාජික	කේ. අතුල හපුතන්ත්‍රි මහතා	-	2021.12.15	2022.03.24
11.	මණ්ඩලයේ නිරීක්ෂක	එන්. ජී. පන්ඩිතරත්න මහතා	කර්මාන්ත අමාත්‍යාශය	2021.01.22	2022.03.24
12.	මණ්ඩලයෙහි නිලබලයෙන් පත්වන සාමාජික	බී.කේ.ආර්.බාලසූරිය මහතා	මුදල් අමාත්‍යාංශය	2022.03.23	2023.01.25
13.	මණ්ඩලයේ නිරීක්ෂක	කේ.ජී.ආර්.විමලසූරිය මහතා	කර්මාන්ත අමාත්‍යාශය	2022.06.01	2025.06.01
14.	මණ්ඩලයේ සාමාජික	සුරංග මෙන්ඩිස් මහතා	-	2022.07.30	2025.07.30
15.	මණ්ඩලයේ සාමාජික	එච්.එම්. රංජිත් කිරිඇල්ල මහතා	-	2022.08.08	2025.08.08


1.4 කර්මාන්ත සඳහා සපයනු ලබන ප්‍රධාන සේවා සහ පහසුකම්



මණ්ඩලයේ සමස්ත කාර්යයන්

- මණ්ඩලයේ අරමුණු තුළ හොඳින් සිතා බලා අන්තර්ගත කර ඇති සේවාවන් සැපයීම.
- රජයේ කාර්මික ප්‍රතිපත්ති සහ වැඩසටහන් සැකසීමට සහ ක්‍රියාත්මක කිරීමට සහය වීම.
- කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය සම්බන්ධ සියලු කටයුතු සම්බන්ධයෙන් කර්මාන්ත හාර අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම.

1.5 ආයතනික ව්‍යුහය



1.6 මණ්ඩලයේ ප්‍රධාන අංශ

අංකය	අංශයේ නම		අංශ ප්‍රධානී
01	පාලන අංශය (AD)	-	චමින්ද රාමසුන්දර මහතා
02	ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD)	-	පී.පී.පී.එස්. දික්වැල්ල මහතා
03	සැලසුම් අංශය (PD)	-	ජේ.ඩී.හේමකුමාර සිල්වා මහතා
04	අලෙවි අංශය (MD)	-	එච්.එම්.එස්. සමරකෝන් මහතා
05	කාර්මික ජනපද අංශය (IED)	-	ඩබ්ලිව්.ඒ.ලාල් ප්‍රියන්ත මහතා
06	ඉංජිනේරු අංශය (ED)	-	ඩබ්.ඒ.පී.කපිල නිෂාන්ත මහතා
07	ව්‍යවසායකත්ව සංවර්ධන හා උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS)	-	ටී.එම්. කුමාර මහතා
08	තාක්ෂණ සේවා අංශය (TSD)	-	එච්.ඒ.පී. ගුණවර්ධන මහතා
09	මූල්‍ය අංශය (FD)	-	උපුල් අබේසූරිය මහතා
10	සම්භාණ්ඩ නිෂ්පාදන හා පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF)	-	අමරනාත් විමලසිංහ මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ)
11	රබර් නිෂ්පාදන සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය (RPDSC)	-	ටී.එස්.ඩී. ද සිල්වා මහත්මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ)

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සියලුම අංශ විසින් සිදු කරනු ලබන කාර්යයන් මෙහෙයුම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ වර්ගීකරණය කර ඇත. මෙහෙයුම් අංශ වන්නේ සැලසුම්, පරිපාලන සහ මූල්‍ය අංශ වන අතර අනෙකුත් අංශ මණ්ඩලයේ සංවර්ධන කටයුතු සිදු කරනු ලබයි. කාර්යාල 25ක් සහිත දිස්ත්‍රික් කාර්යාල ජාලය ප්‍රාදේශීය සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන අතර, කාර්මික ජනපද 16 කාර්මික ජනපද අංශය යටතේ ක්‍රියාත්මක වේ. දේශීය ව්‍යවසායකයින්ට නිෂ්පාදන හා ක්‍රියාවලි සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම සහ දැනුම හුවමාරු කිරීම සම්බන්ධයෙන් ඉංජිනේරු සහ තාක්ෂණික සේවා අංශ මැදිහත්ව කටයුතු කරනු ලබයි.



(02) කළමනාකරණ සමාලෝචනය

- සභාපතිතුමන්ගේ පණිවුඩය
- අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

සභාපතිතුමන්ගේ පණිවුඩය



කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), ශ්‍රී ලංකාවේ වඩාත්ම තරඟකාරී ව්‍යාපාර සංවර්ධන සේවා සපයන රාජ්‍ය ආයතනය ලෙස, දශක පහකට වැඩි කාලයක් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීමේ වගකීම දරනු ලබයි. 2022 වසර සඳහා IDB හි වාර්ෂික කාර්ය සාධනය සිහිපත් කිරීම සහ සමාලෝචනය කිරීම මට මහත් සතුටකි.

IDB හි 2022 වාර්ෂික වාර්තාව සඳහා මා මෙම පණිවිඩය ලියන අවස්ථාව වන විට ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයකට මැදිව සිටින අතර එය ජනතාවගේ ජීවනෝපායට දැඩි ලෙස බලපා ඇත. වසංගතයේ බලපෑම හේතුවෙන් ඇතිවූ දුබලතා සහ ඉන් පසුව ඇති වූ ආර්ථික අර්බුදය රටේ ආර්ථික විකශනය කෙරෙහි බලපා ඇති අතර, එම බලපෑමෙන් IDB නිදහස් වී නොමැත. මෙම අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ, ශ්‍රී ලාංකීය ජීවිත සහ ව්‍යවසායන් සවිබල ගැන්වීමේ සහ වඩාත් සඵල කිරීමේ අපගේ ආචාර ධර්ම අඛණ්ඩව පවත්වා ගන්නා අතරම, මෙම ආර්ථික අර්බුදය තුළ කර්මාන්ත සඳහා අපගේ උපරිමය ලබාදීම පිණිස අපි අවලව කැපවී සිටිමු. අපගේ IDB කණ්ඩායම සහ ව්‍යාපාරික හවුල්කරුවන් විසින් අඛණ්ඩව ලබා දෙන සහයෝගය සහ කැපවීම පිළිබඳව මම අතිශයින් ආඩම්බර වන අතරම, එමඟින් අර්බුදය පුරාවට කර්මාන්ත, ව්‍යාපාර, ප්‍රජාවන් සහ ජාතියට විශාල වශයෙන් සහාය වීම සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීමට අපට හැකි විය. IDB විසින් සේවාවල ගුණාත්මකභාවය ඉහළ නංවමින් විභව කර්මාන්තකරුවන් වෙත ආධාර සැපයීම සඳහා වැඩසටහන් සහ ව්‍යාපෘති රැසක් ආරම්භ කර ක්‍රියාත්මක කර ඇත. ඇතුළත් සහ ප්‍රවේශ විය හැකි සේවා සහ තිරසාර මූලපිරීම් හරහා කර්මාන්ත සහ ප්‍රජාවන්ට සහාය වීම වෙනුවෙන් ආරම්භ කර ඇති අපගේ වැඩසටහන්වල ප්‍රතිලාභ මේ වන විට අපි දකින්නෙමු. මෙය 2022 වර්ෂයේ දී IDB හට නැවත වරක් කැපී පෙනෙන කාර්ය සාධනයක් ලබා දීමට හේතු වී ඇත. නව, පවතින සහ ඉදිරියේදී ඇති වන කර්මාන්තවල වැඩි වන ඉල්ලුමට විසඳුම් සෙවීම සඳහා අපගේ සේවාවන් වර්ධනය කළ යුතු බව අපට පෙනුණි. සම්පත් සහ ධාරිතාව ඉහළ නැංවීම සඳහා කාර්මික අංශයේ නියුතු වූවන් සමඟ අපි උපායමාර්ගික හවුල්කාරිත්වයන් (MOUs) කිහිපයකට ද එළැඹුණි. අප විසින් IDB කාර්මික ජනපදයන්හි නිෂ්පාදන කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, මූල්‍ය ප්‍රවේශය, වෙළඳපල වෙත ප්‍රවේශය සහ ව්‍යාපාර සංවර්ධන සහාය සඳහා ප්‍රවේශය යන කරුණු සම්බන්ධයෙන් මෙම හවුල්කාරිත්වයන් බලාත්මක කරන මෙම වැඩසටහනේ තාක්ෂණික හවුල්කරුවා වීමට USAID කැමැත්ත පළ කර ඇත. තවද, මහින්ද්‍රා වාහන උපාංග දේශීයව නිෂ්පාදනය කිරීම ආරම්භ කිරීම, තත්ත්ව පාලන ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික පරීක්ෂණ පැවැත්වීම සහ තෙවන පාර්ශවීය තත්ත්ව සහතික කිරීම සඳහා මහින්ද්‍රා අයිඩියල් ලංකා පුද්ගලික සමාගමට අනුකූලතාවයක් ලබා දී ඇත. වසරේ තවත් වැදගත් සිදුවීමක් වූයේ දේශීය හා ජාත්‍යන්තර ප්‍රදර්ශකයින් විශාල සංඛ්‍යාවක් ඒකරාශී වූ "කර්මාන්ත 2022" ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයයි. මෙම උත්සවය ශ්‍රී ලංකාවේ සියලුම කර්මාන්තවල හැකියාවන් සහ ධාරිතාවන් පුළුල් කිරීම සඳහා සැලසුම් කරන ලද අතර, විශාල සමාගම් සහ බහුජාතික සමාගම් ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට එක් විය. සමාලෝචිත වර්ෂය වෙන කවරදාකටත් වඩා අභියෝගාත්මක වූ අතර, IDB කණ්ඩායමේ කාර්ය සාධනය අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහ අනෙකුත් ප්‍රාදේශීය කාර්යාලවල විශිෂ්ටත්වය අත්කර ගැනීමට සහ එක් කණ්ඩායමක් ලෙස අනාගතය නිර්මාණය කිරීමට එක්ව කටයුතු කරන කැපවීම, පරිශ්‍රමය සහ සුවිශේෂී කාර්ය සාධනය පිළිබිඹු කිරීමකි.

ඉහත සියල්ලටම නායකත්වය ලබා දෙමින් IDB රටේ ප්‍රමුඛතම කුඩා, මධ්‍ය හා විශාල කර්මාන්ත සංවර්ධනය කිරීමේ ආයතනය බවට පත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් පී.එල්.යූ. රත්නමලල මහතා දැක්වූ දායකත්වය, මැදිහත්වීම සහ කැපවීම කෘතවේදීව සිහිපත් කිරීමට කැමැත්තෙමි. වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරන ලද කැපවීම සහ මගපෙන්වීම සිහිපත් කරන්නට ලැබීම පිළිබඳව මම ඇත්තෙන්ම සතුටට පත් වෙමි. තවද, 2022 වර්ෂයේදී IDB හි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළ කළමනාකාරිත්වය, අධ්‍යක්ෂවරුන්, දෙපාර්තමේන්තු සහ අංශ ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩලය ඇතුළු අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය විසින් කරන ලද සේවාවන් වෙනුවෙන් මම ඔවුන්ට ස්තූතිවන්ත වෙමි.

සුනිල් ගුණවර්ධන
සභාපති
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



දේශීය කර්මාන්තය මුහුණ දෙන සමකාලීන අභියෝග පිළිබඳ කාර්මික සංවර්ධන මණ්ඩලයේ මැදිහත්වීම පිළිබඳ කෙටි අවබෝධයක් ලබාදෙන අතරම 2022 සඳහා වන කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සඳහා මගේ අදහස් සහ මතය බෙදා ගැනීමට ලැබීම පිළිබඳව මම සතුටට පත්වෙමි.

COVID-19 වසංගතය අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්වූයේ වුවද, 2022 වසර දේශීය කර්මාන්තයට තවදුරටත් සැනසිලිදායක වසරක් නොවීය. රටේ අහිතකර වෙළඳ ශේෂය සාමාන්‍ය ජනතාවගේ ජීවිතවලට මෙන්ම දේශීය කර්මාන්තවල, විශේෂයෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපාන විශේෂිත ක්ෂේත්‍ර ගණනාවකින් පිළිබිඹු විය. දීප ව්‍යාප්ත ඉන්ධන හිඟය කර්මාන්ත මුහුණ දුන් එවැනි එක් තීරණාත්මක ගැටළුවක් වූ අතර, බොහෝ කර්මාන්තවලට තම එදිනෙදා කටයුතු සඳහා ඉන්ධන ලබා ගැනීමේදී රජයේ විශේෂ සැලකිල්ලක් ලබා ගැනීම සඳහා යොමු කරවීමට සහ සහාය වීමට IDB සහයෝගය ලබා දෙන ලදී. මීට අමතරව, කර්මාන්ත 450 කට සිය නිෂ්පාදන සහ සේවා ප්‍රදර්ශනය කිරීමට පහසුකම් සපයමින් 2022 වසරේ වාර්ෂික ප්‍රදර්ශනය BMICH හිදී දින 4ක් පුරා සාර්ථකව පැවැත්වීමට IDB සමත් විය. ත්‍යාග ප්‍රදානෝත්සවයේ කැපී පෙනෙන කර්මාන්තවල අවසන් තරඟකරුවන්හට දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක නියෝජනය කරමින් ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශකයින් ලෙස සහභාගීවන ලෙස ආරාධනා කරන ලදී. දේශීය කර්මාන්ත ක්ෂේත්‍රවල පුළුල් පරාසයක් ආවරණය කරමින් 2022 ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල සාර්ථකව පැවැත්විණි. අත්හිටවූ හෝ තාවකාලිකව අත්හිටවූ පදනම මත බොහෝ භාණ්ඩ ආනයනය තහනම් කිරීම මෙරට විදේශ සංචිත හිඟයේ තවත් ප්‍රතිඵලයකි. ආනයනය කරනු ලබන නිශ්චිත භාණ්ඩ වර්ගීකරණය කිරීමේදී, ආනයන තහනම ක්‍රියාත්මක කිරීමෙන් දේශීය කර්මාන්තයට ඇති වන බලපෑම අවම කිරීම සඳහා IDB අදාළ රාජ්‍ය ආයතනවලට සහය විය. හදිසි ආර්ථික බලපෑම් සහ ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සහ සංරවක ආනයනය කිරීමේදී දේශීය කර්මාන්තවලට සහය වීමට IDB හට සිදු විය. මේ අතරතුර, IDB හි අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය හරහා ආදායම වැඩි කර ගැනීමට කළමනාකාරීත්වය අමතර උත්සාහයක් දැරීය. නව සභාපතිවරයා යටතේ IDB විසින් රේඛීය අමාත්‍යාංශය සමඟ එක්ව දේශීය කර්මාන්තවල තීරණාත්මක ගැටලුවලට විසඳුම් ලබා දෙමින් "Get Up Start Up for a Wealthy Nation" ජාතික වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන යටතේ ඉඩම් ගැටළු, ද්‍රවශීලතාවය, බලපත්‍ර ලබා දීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ කර්මාන්තකරුගේ දෘෂ්ටි කෝණයෙන් ගත්කළ රටපුරා ව්‍යවසාය සංස්කෘතිය පිළිබඳ ගැටළු වලට ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. මෙම නව ප්‍රවේශය සමඟින්, උපායමාර්ගික සැලකිල්ලක් ලබා ගැනීමට සහ දේශීය කර්මාන්ත සංවර්ධනය කෙරෙහි ජාතික සංවර්ධන අමාත්‍යාංශවල අවධානය යොමු කරවීමට මහා භාණ්ඩාගාරය සහ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් ඇතුළු සියලුම පාර්ශව රාජ්‍ය ආයතන සමඟ IDB සාකච්ඡා පවත්වන ලදී. එසේම, IDB කළමනාකාරීත්වය විසින් වර්ෂය පුරා මනා පරිපාලන හා මූල්‍ය විනයක් පවත්වා ගැනීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී.

මෙම වර්ෂය මුළුල්ලේ ලබාදෙන ලද උපදෙස් සහ මගපෙන්වීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාට සහ අමාත්‍යාංශ ලේකම්තුමාට මාගේ කෘතඥතාව පළ කරමි. එසේම, IDB කාර්ය මණ්ඩලය සාර්ථකත්වය කරා රැගෙනයාම සඳහා මූලපිරීම් සහ මහ පෙන්වීම් වෙනුවෙන් සභාපතිවරුන් තිදෙනාට සහ මණ්ඩලයට මම කෘතඥ වෙමි. IDB හි වත්මන් සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම මහතාගේ නායකත්වය යටතේ හඳුන්වා දුන් නව ප්‍රවේශයන් දේශීය කර්මාන්තයට මෙන්ම IDB වෙත ද මනා පිටුවහලක් ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. අවසාන වශයෙන්, කර්මාන්ත ක්ෂේත්‍රය තුළ IDB හි පැවැත්ම සාර්ථක කර ගැනීම සඳහා දක්වන කැපවීම සහ සහයෝගීතාවය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහ IDB කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාව පුද කරමි.

ජී.එල්.යූ. රත්නමලල
අධ්‍යක්ෂ ජනරාල්
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය



(03) විශේෂ කාර්යසාධන අවස්ථා – 2022

3.1 ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය

3.2 ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල 2022

3.3 ඒකල කාර්මික ජනපදයේ කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා වන නියමු ව්‍යාපෘතිය

3.4 පශ්චාත් ඉංජිනේරු තාක්ෂණය භාවිතයෙන් විදුලි මෝටර් රථයක දේශීය මූලාකෘති නිෂ්පාදනය කිරීම

3.5 **IDB** සහ මහින්ද්‍රා අයිඩියල් පුද්ගලික සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

3.6 "**Getup - Start Up for a Wealthy Nation**" ජාතික වැඩසටහන

3.7 කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අතර අවබෝධතා ගිවිසුම

3.8 ඛනිජ සම්පත් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම

3.9 භෞතික ප්‍රගතිය - 2022

3.10 අංශවල ආදයම් ව්‍යාප්තිය ප්‍රස්ථාරිකව නිරූපණය කිරීම

3.11 2023 වර්ෂය සඳහා අනාගත සැලසුම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රගති සමාලෝචනය

2022 වර්ෂයේදී IDB විසින් මෙරට ව්‍යාපාරික ප්‍රජාව ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ ආධාර සහ උපකාරක සේවාවන් සපයා ඇත. තවද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) සංවර්ධනය, ප්‍රවර්ධනය සහ දිරිගැන්වීම සම්බන්ධයෙන් උපාය මාර්ග සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය බැඳී සිටී. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සහ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විභව ව්‍යාපාර සඳහා වෙළඳපල පුළුල් කිරීම සඳහා, අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති ආරම්භ කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට IDB සම්බන්ධ වී ඇත.

විශේෂ වැඩසටහන් / ව්‍යාපෘති

3.1 ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

"කර්මාන්ත-2022" ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්විණි. හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සහ හිටපු කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් එය සමාරම්භ කෙරිණි.

දේශීය හා ජාත්‍යන්තර ප්‍රදර්ශකයින් විශාල සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් මෙය පැවැත්විණි. මෙම ප්‍රදර්ශනය ශ්‍රී ලංකාවේ සියලුම කර්මාන්තවල හැකියාවන් සහ ධාරිතාවන් පුළුල් කිරීමට සැලසුම් කර තිබූ බැවින්, විශාල සමාගම් සහ බහුජාතික සමාගම් ඔවුන්ගේ අමුද්‍රව්‍ය, මෙවලම්, උපකරණ, යන්ත්‍රෝපකරණ, සංරචක සහ උපාංග ප්‍රදර්ශනය කිරීම සඳහා මෙයට සම්බන්ධ විය. මෙහි ප්‍රධාන අරමුණු වූයේ,

- ***නිෂ්පාදන සහ සේවා ප්‍රදර්ශනය*** - දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා නිෂ්පාදන, සේවා සහ තාක්ෂණයන් නිෂ්පාදනය කිරීමේදී දේශීය කර්මාන්තවල මනා හැකියාවන් සහ ධාරිතාවන් ප්‍රදර්ශනය කිරීම.

- ***ව්‍යාපාර ගැලපුම් සැසි*** - බහුජාතික සමාගම්, මහා පරිමාණ කර්මාන්ත, රජයට සම්බන්ධ සමාගම් ආදිය

සමඟ ව්‍යාපාරික සම්බන්ධතා හරහා ගෝලීය වෙළෙඳපොළ සැපයුම් දාමයන් සමඟ සම්බන්ධ වීමට දේශීය කර්මාන්තවලට අවස්ථාව සැලසීම.

- ***නිෂ්පාදන ආරම්භ කිරීම සහ ඉදිරිපත් කිරීම*** - දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළට නව නිෂ්පාදන සහ සේවා හඳුන්වා දීම වෙනුවෙන් දේශීය කර්මාන්ත සඳහා වේදිකාවක් සැපයීම.

- ***නිෂ්පාදන සංවර්ධනය සහ සැලසුම් මෙන්ම තාක්ෂණය සහ නවෝත්පාදන පිළිබඳ තොරතුරු සහ අදහස් හුවමාරු කර ගැනීම*** - ශ්‍රී ලංකාව තුළ තරඟකාරී, නවෝත්පාදක සහ ඔරොත්තු දෙන කාර්මික අංශයක් සංවර්ධනය කිරීමේදී නව්‍ය සහ නිර්මාණාත්මක අදහස් වැඩිදියුණු කිරීම.

- ***කර්මාන්ත විශිෂ්ටතා හඳුනාගැනීම*** - කර්මාන්තවල කැපී පෙනෙන කාර්ය සාධනයන් දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටම් නියෝජනය කරමින් හඳුනාගෙන ත්‍යාග පිරිනැමීම.

3.2 ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල 2022



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රකාශයෙන් අපේක්ෂා කළ පරිදි, "රටට පණ දෙන කර්මාන්ත පුනරුදයකට" මංපෙත් සලසන තවත් ඉදිරි පියවරක් ලෙස හිටපු කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ සංකල්ප හා මාර්ගෝපදේශකත්වය ද කර්මාන්ත අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් ද 'ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන 2022' උළෙල ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබීය.

හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේදී සම්මාන උළෙල පැවැත්විණි.

මෙහි අරමුණු අතරින් කිහිපයක් වූයේ,

- තෝරාගත් කර්මාන්ත අංශ 20ක් ඔස්සේ රට පුරා විසිරී සිටින විශිෂ්ට කර්මාන්තකරුවන් සොයා, ඔවුන් ඇගයීමට ලක් කිරීම සහ සම්මාන පිරිනැමීම.

- මෙරට අගනුවර පැවැත්වෙන ප්‍රසිද්ධ ප්‍රදර්ශන සඳහා පළාත් ජයග්‍රාහකයින්ට සහභාගී වීමට අවස්ථාව සලසා දීමෙන් විකුණුම් ප්‍රවර්ධන කටයුතු සඳහා කර්මාන්තකරුවන්ට සහාය වීම.

- ව්‍යාපාර වැඩිදියුණු කිරීම් සහ පුළුල් කිරීම් සඳහා කර්මාන්තකරුවන්හට මාර්ගෝපදේශ සැපයීම.

3.3 ඒකල කාර්මික ජනපදයේ කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා වන නියමු ව්‍යාපෘතිය

ඒකල කාර්මික ජනපදයේ කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ නියමු වැඩසටහනේ තාක්ෂණික හවුල්කරුවෙකු වීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) කැමැත්ත පළ කර ඇත.

විදුලි ගාස්තුවල පිරිවැය ප්‍රත්‍යවේක්ෂකභාවය වැඩි දියුණු කිරීම; පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩි කිරීම; ඉල්ලුමට අදාළ කළමනාකරණය වැඩි දියුණු කිරීම; සහ උසස් තාක්ෂණයන් යොදාගැනීම සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා එක්සත් ජනපද නියෝජිතායතනයේ ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවා Chemonics International ආයතනය වන අතර, IDB විසින් USAID – S/L බලශක්ති වැඩසටහනේ සහයෝගීතාවයෙන් ජා-ඇල, ඒකල IDB කාර්මික ජනපදයේ කර්මාන්ත 15 ක බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ නියමු ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

3.4 පශ්චාත් ඉංජිනේරු තාක්ෂණය භාවිතයෙන් විදුලි මෝටර් රථයක දේශීය මූලාකෘති නිෂ්පාදනය කිරීම



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පශ්චාත්-ඉංජිනේරු තාක්ෂණය භාවිතා කරමින් ලාභදායී විදුලි මෝටර් රථයක දේශීය මූලාකෘති නිෂ්පාදනය සඳහා ගිවිසුමක් අත්සන් කර ඇත. මෙම ගිවිසුම Dilango Cars පුද්ගලික සමාගමේ සම නිර්මාතෘ ඩිලන්ත මාලගමුව සමඟ අත්සන් කර ඇත. මෙම නිෂ්පාදනය ජපාන මෝටර් රථ නිෂ්පාදන සමාගමක අනුග්‍රහය යටතේ Dilango Cars පුද්ගලික සමාගම සමඟ එක්ව සිදු කෙරේ.

3.5 IDB සහ මහින්ද්‍රා අයිඩියල් පුද්ගලික සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

කර්මාන්තය තුළ සාර්ථක ගමනාරම්භයක් සඳහා මහින්ද්‍රා අයිඩියල් ලංකා පුද්ගලික සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹ ඇත. මෙම වැඩසටහන හරහා මහින්ද්‍රා වාහන උපාංග දේශීයව නිෂ්පාදනය කිරීමටත්, තත්ත්ව පාලන ප්‍රමිතීන් පවත්වා ගැනීමට අවශ්‍ය තාක්ෂණික පරීක්ෂණ පැවැත්වීමටත්, තෙවන පාර්ශවීය තත්ත්ව සහතිකයක් ලබා දීමටත් අපේක්ෂා කෙරේ.

3.6 "Getup – Start Up for a Wealthy Nation" ජාතික වැඩසටහන



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

මෙරට කර්මාන්ත හා ව්‍යාපාරවල නවෝත්පාදන ඇති කිරීමේ අරමුණින් කර්මාන්ත අමාත්‍යාංශය, කාර්මික සංවර්ධන මණ්ඩලය සහ සියලු රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය ඇතිව 'Get Up - Start Up for a Wealthy Nation' ජාතික වැඩසටහන වැවිලි හා කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කෙරිණි. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී සමරු උත්සවය පැවැත්විණි.

කාර්මික ආර්ථිකයක් සහිත ධනවත් ජාතියක් බිහිකිරීමේ අරමුණින් මෙම ජාතික වැඩසටහන දියත් කර ඇති අතර, වැඩසටහන් කිහිපයක්ද ආරම්භ කර ඇත. ජංගම යෙදුමක් (IDB Mobile APP) භාවිතා කරමින් ව්‍යවසායකයින් සහ ආයෝජකයින් සඳහා නව තාක්ෂණික වේදිකාවක් නිර්මාණය කිරීම, කර්මාන්ත ක්ෂණික ඇමතුම් අංකයක් 1995, WhatsApp අංකයක් 0705001995 සහ "ව්‍යාපාර සායන" වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මෙම වැඩසටහන් වලට අයත් වේ. තවද, උසස් පාසල් සිසුන්ට 9 ශ්‍රේණියේ සිට ව්‍යවසායකත්ව දැනුම ලබාදීම සඳහා පාසල්වලට "ව්‍යවසායක කව" හඳුන්වා දීම, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ කර්මාන්තවල ආයෝජනය කිරීමට මහා පරිමාණ ආයෝජකයින්ට අවස්ථාව සැලසීමේ අරමුණින් IDB සඳහා "ආයෝජක සංචිතයක්" පිහිටුවීම, ව්‍යවසායකයින් සඳහා අඩු පොලියට ණය පහසුකම් ලබාදීම සඳහා HDFC බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සිදු කෙරිණි. රටේ ආර්ථිකයට සැලකිය යුතු මට්ටමකින් දායක විය හැකි සාර්ථක ව්‍යවසායකයින් බවට පත්වීම සඳහා තාක්ෂණික දැනුම ලබාදීම වෙනුවෙන් ත්‍රිරෝද රථ රියදුරන් සඳහා ව්‍යවසායක පුහුණු වැඩසටහන් හඳුන්වා දෙන ලදී.

සණස සංවර්ධන බැංකුව (SDB) සමඟ සහයෝගයෙන් ඩිජිටල් බැංකුකරණය සහ සංවර්ධන සැපයුම් දාම කළමනාකරණය, IDB විසින් Dialog Enterprise සමඟ එක්ව SMEs ඩිජිටල්කරණය කිරීම. "පොහොසත් ජාතියක් සඳහා මගපෙන්වීමක්" පොත් පිංච ප්‍රකාශයට පත් කිරීම, ජර්මානු කර්මාන්ත සහ වාණිජ නියෝජිතයින් සමඟ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වෙළඳ ප්‍රදර්ශන පහසුකම් සැපයීම. තවද, නව කර්මාන්ත දියුණු කිරීම සඳහා තවත් බොහෝ සංවිධාන සමඟ විවිධ ගිවිසුම්වලට එළඹෙමින් තවත් සුවිශේෂී කාර්යයන් රාශියක් සිදු කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකාව තුළ විවෘත ආර්ථිකය ක්‍රියාත්මක කිරීමට පෙර කාර්මික සංවර්ධනයේ තත්ත්වය සහ නිෂ්පාදන කර්මාන්ත ව්‍යවර්තනය කිරීම අපනයන අඩුවීමට සහ ආනයන ඉහළ යාමට හේතු වූ අතර එය මෙරට ආර්ථිකයට බලපා ඇති බව කර්මාන්ත අමාත්‍යවරයා පෙන්වා දෙන ලදී. එසේම, “Get Up – Start Up for a Wealthy Nation” ජාතික වැඩසටහන මඟින් රටේ නිෂ්පාදන ඉහළ නැංවීම සහ ආනයන ආදේශන නිෂ්පාදන වැඩි කරන අතරම ආනයන අඩු කිරීම මගින් අපනයන සංවර්ධනය කිරීම බලාත්මක කිරීම සඳහා පාසල් ව්‍යවසායකත්ව කවයන්හි සිට කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ඇතුළු සියලුම ව්‍යවසායකයින් ආවරණය වන පරිදි සමස්ත ප්‍රජාවම සවිබල ගන්වනු ලබයි.

මෙම අවස්ථාවට මාලදිවයින, ඉන්දුනීසියාව, ඊජිප්තුව, නේපාලය, ඉරානය ආදී රටවල මහ කොමසාරිස්වරුන් සහ තානාපතිවරුන්, රාජ්‍ය අමාත්‍ය චාමර සම්පත් දසනායක, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර, අතිරේක ලේකම්වරුන්, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සුදන්ත ලියනගේ, කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන්, ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානවල නිලධාරීන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගි වූහ.

3.7 කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අතර අවබෝධතා ගිවිසුම



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර, එමඟින් ව්‍යාපාරයක මෙහෙයුම් සහ අඛණ්ඩ පැවැත්මට බලපාන ව්‍යාපාර ආශ්‍රිත අවදානම් අවම කිරීම සඳහා කාර්මික අංශයට රක්ෂණාවරණයක් සැපයීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් කර්මාන්ත සඳහා අදාළ කර්මාන්ත අංශයට අනුව රක්ෂණ පැකේජ ලබා දෙනු ඇත. කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම මහතා විසින් කාර්මික සංවර්ධනයේ ඉදිරි මාවත සහ ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් ආරම්භ කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන ලදී. IDB අධ්‍යක්ෂ ජනරාල් පී.එල්.යූ. රත්නමලල, AGM හි මහේෂ් ගමගේ මහතා, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නිළධාරීන් ඇතුළු පිරිසක් මෙම රැස්වීම සඳහා සහභාගී වූහ.

3.8 ඛනිජ සම්පත් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණික සේවා අංශය විසින් සංවිධානය කරන ලද අංශ දැනුවත් කිරීමේ සමුළුවක් කොළඹදී පැවැත්විණි. කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එල්.ඒ.පතිරාජ, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ජී.එල්.යූ.රත්නමලල, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සභාපති ආර්.සජීවන්, අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති සුරේෂ් ද මෙල්, සීමාසහිත ලංකා මිනරල් සෑන්ඩ්ස් හි සභාපති ආචාර්ය උදේනි දසනායක ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සමාරම්භක උත්සවයට සහභාගී විය. රැස්වීම අමතමින් IDB හි සභාපතිවරයා විසින් ඛනිජ සම්පත් සඳහා වැඩි අගයක් එකතු කිරීමේ හැකියාව සහ මෙරට අදාළ කර්මාන්ත අංශයේ දැනුම ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන ලදී.

මෙම අවස්ථාවේදී, කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආචාර්ය එල්.පී.එස්.රෝහිත සහ එච්.ආර්.පරණවිතාන විසින් තාක්ෂණික සේවා අංශය විසින් සම්පාදනය කරන ලද "මයිකා හි අගය එකතු කළ කාර්මික යෙදුම්" (Value Added Industrial Application of MICA) සහ "ක්වාර්ට්ස් හි අගය එකතු කළ කාර්මික යෙදුම්" (Value Added Industrial Applications of Quartz) පොත් නිකුත් කරන ලදී. සම්මන්ත්‍රණය පුරාවටම දේශීය කර්මාන්ත සඳහා භාවිත කළ හැකි ඛනිජ වර්ග සහ ශ්‍රී ලංකාව තුළ දීම නිෂ්පාදනය කළ හැකි නිමි භාණ්ඩ පිළිබඳව විශේෂ දැනුවත් කිරීමක් සිදු කෙරිණි.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ (ඛනිජ සමීක්ෂණ) නලින් ද සිල්වා, දම්සිල රිසෝසස් පුද්ගලික සමාගමේ සභාපති ආචාර්ය සදුන් දල්පදාදු, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආචාර්ය එල්.පී.එස්.රෝහිත, එච්.එම්.ටී.ජී.පිටිවල සහ ඛනිජ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ විශේෂඥයෙකු වන රයන් රොක්වුඩ් යන මහත්වරු මේ අවස්ථාව සඳහා එක් විය.

සම්මන්ත්‍රණය අවසානයේ කාර්මික සංවර්ධන මණ්ඩලය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජාතික ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව යන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සමඟ ක්ෂේත්‍රයේ පවතින ගැටලු සම්බන්ධයෙන් විවෘත සාකච්ඡාවක් පැවැත්වීමට සහභාගිවන්නන්ට හැකි විය.

3.9 භෞතික ප්‍රගතිය – 2022

ආයතනයට හිතකර තීරණ ගැනීමට කළමනාකරුවන් පෙළඹවීම සඳහා කාර්ය සාධන මිනුම් භාවිතා කරනු ලැබේ. මනා කාර්ය සාධන මිනුම් තාක්ෂණයක් තිබීමේ වැදගත්කම වනුයේ යථාර්ථවාදී සහ විශ්වාසදායක ඉලක්ක තැබීමයි. ප්‍රධාන සේවා-නැඹුරු ආයතනයක් ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලය, ආයතනයේ ශක්තිය සැලකිල්ලට ගනිමින් ආදායම්, පිරිවැය සහ දිගුකාලීන වත්කම් ප්‍රසම්පාදනය සහ අනෙකුත් භව්‍ය සාධක වැනි

පාලනය කළ හැකි සාධක භාවිතා කරමින් කළමනාකරුවන් සඳහා ව්‍යාපෘති ඉලක්ක සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සකසා ඇත.

3.9.1 වගුව: දැනට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය

අංකය	ව්‍යාපෘතිය	ප්‍රතිපාදන රු.මි.	වියදම රු.මි.	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
01	IDB හි කාර්මික ජනපද වල යටිතල පහසුකම් නැවත සක්‍රීය කිරීම සහ නවීකරණය කිරීම	25	17	68	75

3.9.2 වගුව: පුහුණු වැඩසටහන්

විස්තර	2022	
	පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
තාක්ෂණ හුවමාරු සහ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන්	317	5315

3.9.3 වගුව: IDB හි ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

#	ක්‍රියාකාරකම	**2022/12/31** දිනට ප්‍රගතිය
01	නව කර්මාන්ත ඇති කිරීමට සහාය වීම	164
02	පවතින කර්මාන්ත දියුණු කිරීමට සහාය වීම	460
03	තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම	403
04	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	14
05	අමුද්‍රව්‍ය ලෙස ලෝහ ආශ්‍රිත කර්මාන්ත සඳහා ලෝහ අවශේෂ සැපයීම	1392 මෙට්‍රික් ටොන්
06	රබර් නිෂ්පාදන කර්මාන්ත සඳහා රබර් සංයෝග සැපයීම	කි.ග්‍රෑ. 28841
07	ආහාර රසායනාගාරය මගින් ආහාර පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම	314 (ව්‍යවසායකයින්)
08	ලක්කම් අලෙවි මධ්‍යස්ථානය හරහා අලෙවි පහසුකම් ලබාදීම	330 (ව්‍යවසායකයින්)
09	යන්ත්‍රෝපකරණ සැකසීම, තක්සේරු වාර්තා, CNC පහසුකම් ආදිය සඳහා ඉංජිනේරු සේවා සැපයීම.	241 (ව්‍යවසායකයින්)


නිෂ්පාදනය, විකුණුම්, අලෙවිකරණය, ශ්‍රම භාවිතය සහ වියදම් සම්බන්ධ දත්ත සටහන් කර ගැනීම, ආයතනයේ මේ වන විට හොඳින් ක්‍රියාත්මක වන ක්ෂේත්‍ර සහ වැඩි අවධානයක් ලැබිය යුතු ක්ෂේත්‍ර මොනවාද යන්න තීරණය කිරීමට උපකාරී වේ. අනෙක් අතට ආයතනික ප්‍රගතිය සමාලෝචනය කිරීම සේවකයින් දිරිමත් කිරීමට උපකාරී වේ. ආයතනයේ ඉලක්කගත ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය තක්සේරු කිරීමේදී සේවකයන්ට සමාගමේ සාර්ථකත්වය සඳහා ඔවුන්ගේ දායකත්වය පිළිබඳව අදහසක් ලබා ගත හැකි අතර එය වැඩි රැකියා තෘප්තියක් සඳහා ද හේතු වේ. සේවකයින් සඳහා විශ්වාසදායක ඉලක්ක ලබාදීම, ප්‍රතිඵල මැනීම සහ ඒවා කාර්ය මණ්ඩලයට ක්‍රමවත්ව සන්නිවේදනය කිරීම මඟින් තම කාර්යයන් හොඳින් කරගෙන යන හෝ

ආයාසයෙන් කරගෙන යන සේවකයින් දිරිමත් කිරීමට උපකාරී වේ. මෙම අභිප්‍රේරණය, දිගු වේලාවක් වැඩ කිරීමට කාර්ය මණ්ඩලය දිරිගැන්වීම, වැඩිදියුණු කිරීමට මාර්ග සාකච්ඡා කිරීම, සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා විසඳුම් ඉදිරිපත් කිරීමෙන් ඔබ්බට යනු ඇත.

3.9.4 වගුව: ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අංකය	ප්‍රතිඵලය	KPIs	සමුච්චිත	
			ඉලක්කය	ජයග්‍රහණ
1	ස්ථාපිත නව කර්මාන්ත (ආරම්භක)	ස්ථාපිත නව කර්මාන්ත සංඛ්‍යාව (ආරම්භක)	300	153
2	පවතින කර්මාන්ත වැඩිදියුණු කිරීම	වැඩි දියුණු කරන ලද පවතින කර්මාන්ත සංඛ්‍යාව	700	452
3	ස්ථාපිත / වැඩිදියුණු කරන ලද ක්ෂුද්‍ර කර්මාන්ත	ස්ථාපිත / වැඩිදියුණු කරන ලද ක්ෂුද්‍ර කර්මාන්ත සංඛ්‍යාව	500	533

3.9.1 ප්‍රස්තාරය : IDB ප්‍රතිඵලයේ සාරාංශය - 2022



2022 වර්ෂයේදී කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙරට ව්‍යාපාරික ප්‍රජාව ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ ආධාර සහ උපකාරක සේවාවන් ලබා දී ඇත. තවද, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම, ව්‍යවසායකත්ව සංවර්ධනය සම්බන්ධයෙන් උපාය මාර්ග සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය බැඳී සිටී. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විභව ව්‍යාපාර වෙනුවෙන් වෙළඳපල පුළුල් කිරීම සඳහා, අමාත්‍යාංශය හා ඒකාබද්ධව විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට IDB කටයුතු කරනු ලබයි. වියදම්, විකුණුම් හෝ ලාභ වැනි ක්ෂේත්‍රවල පහළම ප්‍රතිඵල දෙස බැලීමෙන් අපට එම ප්‍රතිඵල ලැබී ඇත්තේ කෙසේද හෝ ඇයිද යන්න හෝ අපගේ කාර්ය සාධනය වැඩිදියුණු කරන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමට උපකාරී නොවේ. වසර අවසාන ප්‍රතිඵල අත්‍යවශ්‍යයෙන්ම නොපෙන්වන ක්ෂේත්‍රවල ඉලක්ක තැබීම සහ ප්‍රගතිය මැනීම ලාභයේ සාතීය වර්ධනයට තුඩු දෙන බොහෝ ක්ෂේත්‍රවල මෙහෙයුම් වැඩි දියුණු කිරීමට උපකාරී වනු ඇත.

3.9.5 වගුව: ප්‍රගති සාරාංශය - 2022

අංකය	ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	කාර්ය සාධන දර්ශක	සමුච්චිත ඉලක්කය	සමුච්චිත ජයග්‍රහණ
01	කාර්මික අවශ්‍යතා තක්සේරු කිරීම (දිස්ත්‍රික් පදනමින්)	ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද සැසි සංඛ්‍යාව	25	4
			සහභාගී වූ ව්‍යවසායකයින් සංඛ්‍යාව	1500	156
		වෙනත් අංශ මගින් හඳුනාගත් / පුහුණු කරන ලද කර්මාන්ත සංවර්ධනය කිරීමට සහාය වීම	හඳුනාගත්/ පුහුණු කර ඇති කර්මාන්ත සංඛ්‍යාව	125	77
		කර්මාන්ත තෝරාගැනීමේ වැඩසටහන් - නව / පවතින / ක්ෂුද්‍ර කර්මාන්ත	හඳුනාගත් කර්මාන්ත සංඛ්‍යාව	1600	2692
02	ව්‍යාපාර සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම	කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම (අලෙවිකරණය, තාක්ෂණික, කළමනාකරණය, ඵලදායිතාව, ඇසුරුම්කරණය, ආදිය)	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	406	403
			සහාය දැක්වූ ව්‍යවසායකයින් / කර්මාන්ත සංඛ්‍යාව	6305	7704
		කාර්මික සහතික පුහුණු පාඨමාලා පැවැත්වීම (තාක්ෂණ හා ඩිජිටල් අලෙවිකරණය)	පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව	7	14
			පුහුණු වූ ව්‍යවසායකයින් / කර්මාන්ත සංඛ්‍යාව	124	247
		දේශීය හා විදේශීය තාක්ෂණයන් අත්පත් කර ගැනීම සහ බෙදා හැරීම	අත්පත් කර ගත් සහ / හෝ බෙදා හරින ලද තාක්ෂණයන් සංඛ්‍යාව	5	6
03	කාර්මික සහාය සහ උපදේශනය ලබා දීමෙන් හිතකර මෙහෙයුම් පරිසරයක් නිර්මාණය කිරීම	ඉංජිනේරු සහ තාක්ෂණික ආධාර සැපයීම - නව/ පවතින/ ක්ෂුද්‍ර කර්මාන්ත	හඳුනාගත් කර්මාන්ත සංඛ්‍යාව	850	684
		රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ නිෂ්පාදන ක්‍රියාවලියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පිළිබඳ උපදේශනය	නිෂ්පාදන සංඛ්‍යාව	3	8
		- කසළ අවම කිරීම - කසළ ප්‍රතිචක්‍රීකරණය - බලශක්ති සංරක්ෂණය සඳහා නිෂ්පාදන මාර්ග සංවර්ධනය කිරීමට සහාය වීම	කර්මාන්ත සංඛ්‍යාව	4	-
		දේශීය රබර් වැවිලිකරුවන්ගේ ස්වභාවික රබර් සඳහා අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම (MPI සමඟ අවබෝධතා ගිවිසුම යටතේ)	වැඩසටහන් සංඛ්‍යාව	2	2
		ව්‍යවසායකයින්ට / ආයතනවලට තාක්ෂණික සහ අලෙවිකරණ තොරතුරු සැපයීම	ව්‍යවසායකයින්/ ආයතන සංඛ්‍යාව	12	26
		සිවිල් ඉංජිනේරුමය උපදේශන සේවා සැපයීම	සම්පූර්ණ කරන ලද සේවා සංඛ්‍යාව	150	113
		විදුලි ඉංජිනේරුමය උපදේශන සේවා සැපයීම	සම්පූර්ණ කරන ලද සේවා සංඛ්‍යාව	100	91
		ව්‍යාපෘති සඳහා තාක්ෂණික උපදේශන සැපයීම	ව්‍යාපෘති සංඛ්‍යාව	2	3
		ලෝහ කර්මාන්ත සංවර්ධනය සහ මෝටර් රථ අමතර කොටස් නිෂ්පාදනය සඳහා අගය එකතු කිරීම සංවර්ධනය කිරීමට ඉංජිනේරුමය සහාය	කර්මාන්ත සංඛ්‍යාව	6	-

අංකය	ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	කාර්ය සාධන දර්ශක	සමුච්චිත ඉලක්කය	සමුච්චිත ජයග්‍රහණ
04	අමුද්‍රව්‍ය සැපයීම හරහා සැපයුම් දාමය ශක්තිමත් කිරීම සහ තත්ත්ව ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම	කිතුල් මදින්නන් සඳහා කැස්පර් බෝතල් විකිණීම	අලෙවි කළ බෝතල් සංඛ්‍යාව	5000	2544
		වාත්තු කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීම	කර්මාන්ත සංඛ්‍යාව	400	387
			ප්‍රමාණය (මෙ.ටොන්)	2000	1114
		අර්ධ වාණිජ ක්‍රියාකාරකම් (වියළි රබර්)	ප්‍රමාණය (kg)	36000	28841
05	දේශීය සහ ගෝලීය වෙළෙඳපොළ පැවැත්ම ශක්තිමත් කිරීමට සහාය වීම	සන්නාමකරණය, ඇසුරුම්කරණය/ ලේබල් කිරීම/ අනිවාර්ය සහතික කිරීම්, ලියාපදිංචි කිරීම් සහ ගැණුම්කරුවන්ගේ ප්‍රමිතීන්/ රේගු සහ තීරුබදු/ මුහුදු සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහනය/ අපනයන සැලසුම්කරණය සහ ප්‍රොත්සෝමා ඉන්වොයිසිය යනාදිය සඳහා අලෙවිකරණ සහාය ලබා දීම - නව/ පවතින/ ක්ෂුද්‍ර කර්මාන්ත	සහය සපයන ලද සංඛ්‍යාව	675	1480
		"ලක්කම්" ප්‍රදර්ශන කුටි හරහා වෙළඳපල අවස්ථා ලබා දීම	කර්මාන්ත සංඛ්‍යාව / සපයා ඇති අවස්ථා සංඛ්‍යාව	20	9
06	ව්‍යාපාර තරහකාරිත්වය වැඩි දියුණු කිරීමට පහසුකම් සැලසීම	මානව, මූල්‍ය සහ භෞතික සම්පත්වල උපායමාර්ගික සැලසුම්, තීරණ ගැනීම, සංවිධානය කිරීම, නායකත්වය දීම, අභිප්‍රේරණය සහ පාලනය/ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියේදී සහාය ලබා දීම. - නව/ පවතින/ ක්ෂුද්‍ර කර්මාන්ත	සහය සපයන ලද සංඛ්‍යාව	500	374
		ව්‍යාපාර හිමිකරුවන් සඳහා කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන	පවත්වන ලද සැසි සංඛ්‍යාව	5	1
			ව්‍යාපාර හිමිකරුවන් සංඛ්‍යාව	150	35
07	අරමුදල් හෝ වෙනත් අරමුණු සඳහා ව්‍යාපාර වාර්තා සංවර්ධනය කිරීම	තක්සේරු වාර්තා, ව්‍යාපෘති ශක්‍යතා වාර්තා, නිෂ්පාදන සහතික, පරීක්ෂණ වාර්තා, තාක්ෂණික වාර්තා/ අත් පොත් ආදිය සෝදිසි කිරීම, පරීක්ෂා කිරීම සහ සකස් කිරීම.	වාර්තා සංඛ්‍යාව	355	127
		කර්මාන්ත සංවර්ධන ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ බාහිර අරමුදල් (විදේශීය සහ දේශීය) සඳහා ව්‍යාපෘති යෝජනා/ සංකල්ප සටහන් සකස් කිරීම	සකස් කරන ලද / ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා / සංකල්ප සටහන් සංඛ්‍යාව	43	17
		වාර්ෂික වාර්තාව සකස් කිරීම	සකස් කළ වාර්තා සංඛ්‍යාව	1	1
		IDB සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	සකස් කළ වාර්තා සංඛ්‍යාව	2	2
		මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමෙන් අනතුරුව වාර්ෂික අධීක්ෂණ සහ ඇගයීම් වාර්තාව සකස් කිරීම	සකස් කරන ලද මාසික ප්‍රගති සමාලෝචන වාර්තා සංඛ්‍යාව	12	12
			සකස් කරන ලද ඇගයීම් වාර්තා සංඛ්‍යාව	1	1


අංකය	ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	කාර්ය සාධන දර්ශක	සමුච්චිත ඉලක්කය	සමුච්චිත ජයග්‍රහණ
08	දේශීය සහ ගෝලීය සම්මතයන් සමඟ ව්‍යාපාර අනුකූලතාව වැඩි දියුණු කිරීමට පහසුකම් සැලසීම	පවතින නීති රීතිවලට අනුකූලව කර්මාන්ත සිදු කිරීමට පහසුකම් සැලසීම සහ සහාය වීම (ව්‍යාපාර ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර සහ අවසර පත්‍ර ලබා ගැනීම/ අලුත් කිරීම, කම්කරු නීති, බදු ලියාපදිංචිය, රේගු ලියකියවිලි, බුද්ධිමය දේපල නීතිය යනාදිය) නව/ පවතින/ ක්ෂුද්‍ර කර්මාන්ත	සහය වූ අවස්ථා සංඛ්‍යාව	1300	674
		පසු විපරම් සහාය ලබා දීම	පසු විපරම් සංඛ්‍යාව	5000	833
		කර්මාන්තකරුවන්ට සැකසුම් පහසුකම් ලබාදීම	පහසුකම් සපයන කර්මාන්ත සංඛ්‍යාව	120	144
		උපාධි අපේක්ෂකයින්/ NAITA අභ්‍යාසලාභීන් සඳහා පුහුණුව ලබා දීම	පුහුණුවන්නන් සංඛ්‍යාව	12	12
		කර්මාන්ත අවශ්‍යතා සඳහා යාන්ත්‍රණය, පිරිසැකසුම් කිරීම, තාප පිරියම් කිරීම, වාත්තු කිරීම, විද්‍යුත් ලෝහාලේපනය, CNC යන්ත්‍රෝපකරණ සේවා සහ වෙල්ඩින් වැඩ වැනි ඉංජිනේරුමය සේවා සැපයීම	ලබා දී ඇති සේවා ගණන/ සහය දැක්වූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව	426	512
		අනෙකුත් කර්මාන්ත සඳහා මිශ්‍ර වාත්තු ද්‍රව්‍ය සහ අනෙකුත් ද්‍රව්‍ය සැපයීම	ලබා දී ඇති සේවා ගණන/සහය දැක්වූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව	120	148
		නව යන්ත්‍රෝපකරණ සහ උපකරණ සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම	නිර්මාණය කර ඇති යන්ත්‍ර සහ උපකරණ සංඛ්‍යාව	4	-
		තොරතුරු සැපයීම / බෙදා හැරීම	තොරතුරු සැපයූ පුද්ගලයන් සංඛ්‍යාව	300	526
		" කර්මාන්ත" සඟරාව ප්‍රකාශයට පත් කිරීම	වෙළුම් සංඛ්‍යාව	200	50
		කාර්මික ජනපද වල ඒකාබද්ධ දත්ත සමුදායක් වැඩිදියුණු කිරීම සහ IDB වෙබ් අඩවියට උඩුගත කිරීම	වැඩි දියුණු කළ ජනපද සංඛ්‍යාව	15	1
09	කර්මාන්ත යටිතල පහසුකම් ශක්තිමත් කිරීම	පවතින කාර්මික ජනපද නවීකරණය සහ වැඩිදියුණු කිරීම සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කාර්මික ජනපද තවදුරටත් සංවර්ධනය කිරීම	වැඩිදියුණු කරන ලද සහ සංවර්ධනය කරන ලද කාර්මික ජනපද සංඛ්‍යාව	8	-
		පොත්තපිටිය කාර්මික ජනපදයේ හිමිකාරිත්වය අත්පත් කර ගැනීම සහ සංවර්ධනය කිරීම	හිමිකාරිත්වය අත්පත් කරගැනීමෙන් පසු සංවර්ධනය වූ කාර්මික ජනපද සංඛ්‍යාව	1	-
		මිහින්තලේ පවතින කාර්මික ජනපදය පුළුල් කිරීම සඳහා යාබද ඉඩම් හඳුනාගෙන සංවර්ධනය කිරීම	සංවර්ධනය කරන ලද භූමි ප්‍රමාණය	5	-
		එක් එක් කාර්මික ජනපද වල කර්මාන්ත සඳහා ඉඩම් හඳුනා ගැනීම, තෝරා ගැනීම සහ වෙන් කිරීම	වෙන් කරන ලද කර්මාන්ත සංඛ්‍යාව	30	33
		තෝරාගත් ආයෝජකයින් සමඟ ඔවුන්ගේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සංවර්ධනය කරන ලද බිම් කොටස් / ගොඩනැගිලිවල නීතිමය ලියකියවිලි අත්සන් කිරීම	අලුතින් පිහිටුවන ලද කර්මාන්ත සංඛ්‍යාව	10	11
			සංවර්ධනය කරන ලද දැනට පවතින කර්මාන්ත සංඛ්‍යාව	10	8
			උත්පාදනය කරන ලද රැකියා සංඛ්‍යාව	500	356
		නීතිමය ක්‍රියාමාර්ග මගින් හෝ ඔවුන්ගේ කැමැත්තෙන් අසාර්ථක කර්මාන්ත අත්පත් කර ගැනීම සහ සුදුසු ආයෝජකයින් වෙත පැවරීම	කර්මාන්ත සංඛ්‍යාව	10	16
		නව කර්මාන්තකරුවන් සඳහා බදු ගිවිසුම් නිකුත් කිරීම	නිකුත් කරන ලද බදු ගිවිසුම් සංඛ්‍යාව	20	20

අංකය	ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	කාර්ය සාධන දර්ශක	සමුච්චිත ඉලක්කය	සමුච්චිත ජයග්‍රහණ
10	ආයතනික නිර්දේශ සමඟ අනුමත කිරීම	මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා නිර්දේශ - නව/ පවතින/ ක්ෂුද්‍ර කර්මාන්ත	ලබා ගත් පහසුකම් සංඛ්‍යාව	425	227
		දේශීය කර්මාන්ත විසින් භාවිතා කරනු ලබන අගය එකතු කළ නිෂ්පාදන සහ අපද්‍රව්‍ය අපනයනකරුවන් සෝදිසි කිරීම, පරීක්ෂා කිරීම සහ නිර්දේශ ලිපි නිකුත් කිරීම.	නිකුත් කළ වාර්තා සංඛ්‍යාව	24	7
		අත්හිටුවන ලද සහ තාවකාලිකව අත්හිටුවන ලද කාණ්ඩයේ කාර්මික ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා සෝදිසි කිරීම, පරීක්ෂා කිරීම සහ නිර්දේශ ලිපි නිකුත් කිරීම.	නිකුත් කළ වාර්තා සංඛ්‍යාව	6	-
		කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් විභව ජාත්‍යන්තර සංවිධාන සහ ඔවුන්ගේ ශ්‍රී ලාංකික හවුල්කරුවන් සමඟ සම්බන්ධතා ගොඩනඟා ගැනීම	ජාත්‍යන්තර සංවිධාන සමඟ ගොඩනැගුණු සම්බන්ධතා සංඛ්‍යාව	5	3
		බදු අයිතිය උකස් කිරීමට ඉඩ දීමෙන් කර්මාන්තකරුවන්ට ණය පහසුකම් ලබා ගැනීමට සහාය වීම	එසේ සහය වූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව	10	7
11	නියැදි පරීක්ෂණ සඳහා රසායනාගාර පහසුකම් සැපයීම	රබර් නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික කිරීම සහ ක්‍රියාවලි සංවර්ධනය	වාර්තා සංඛ්‍යාව	120	150
		ලෝහවල රසායනික හා යාන්ත්‍රික ගුණාංග සඳහා පරීක්ෂණ වාර්තා සෝදිසි කිරීම, පරීක්ෂා කිරීම සහ සැපයීම	නිකුත් කළ වාර්තා සංඛ්‍යාව	50	82
		ආහාර රසායනාගාර පරීක්ෂණ සිදු කිරීම	පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව	600	314
12	අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය	වෙනත් ආයතන විසින් සංවිධානය කරනු ලබන වෙළඳ සල්පිල් හා ප්‍රදර්ශනවලට සහභාගී වීම	සහභාගී වූ වෙළඳ සල්පිල්/ ප්‍රදර්ශන සංඛ්‍යාව	4	-
		උප කොන්ත්‍රාත් පහසුකම් සැපයීම	පහසුකම් සපයන ලද කර්මාන්ත සංඛ්‍යාව	20	2
		තෝරාගත් කර්මාන්ත අංශ සඳහා ගැනුම්කරු-විකුණුම්කරු රැස්වීම් පැවැත්වීම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව	4	1
			සහභාගී වූ ව්‍යවසායකයින් සංඛ්‍යාව	40	-
		වෙන් කරන ලද ලෝහ පාදක අමුද්‍රව්‍ය කර්මාන්තවලට භාර දීම	බෙදාහරින ලද මෙට්‍රික් ටොන් ගණන	1000	3559
		NVQ සහතික ලබා ගැනීමට පහසුකම් සැලසීම	පහසුකම් සපයන ලද ව්‍යවසායකයින් සංඛ්‍යාව	10	18
13	විශේෂ කර්මාන්ත සංවර්ධන අරමුණු කරගත් ක්‍රියාකාරකම්	SME සායන/ SME සති පැවැත්වීම	පවත්වන ලද SME සායන/ සති සංඛ්‍යාව	25	4
		ශ්‍රී ලංකා කර්මාන්ත ප්‍රදර්ශනය සංවිධානය කිරීම සහ විශිෂ්ට ව්‍යවසායකයින් ඇගයීම / තෝරා ගැනීම සඳහා ජාතික සම්මාන උළෙල පැවැත්වීම	පවත්වන ලද ප්‍රදර්ශන සහ සම්මාන ප්‍රදානෝත්සව සංඛ්‍යාව	1	1
		පළාත් මට්ටමේ ප්‍රදර්ශන පැවැත්වීම	පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව	-	-
		සවිස්තරාත්මක වීඩියෝ පැතිකඩක් නිර්මාණය කිරීම සඳහා ව්‍යවසායකයන්ගේ ව්‍යාපාරික ස්ථානවලට ගොස් ඔවුන්ගේ වීඩියෝ සාක්ෂි දත්ත පවත්වාගෙන යාම	වීඩියෝ පැතිකඩ සංඛ්‍යාව	2	-
		පාවහන් වෙළඳ ප්‍රදර්ශනය සංවිධානය කිරීම සහ පැවැත්වීම	පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව	1	-
		අපගේ පාරිභෝගිකයා සමඟ සම්බන්ධතාව සහ ප්‍රවේශ්‍යතාව වර්ධනය කිරීම සඳහා 'Call IDB' ජංගම යෙදුම සංවර්ධනය කිරීම	හසුරුවන ලද පාරිභෝගික විමසීම් සංඛ්‍යාව	100	1
		කාර්මික නිෂ්පාදන ගම්මාන ප්‍රවර්ධනය	ප්‍රතිලාභ ලැබූ ව්‍යවසායකයින් සංඛ්‍යාව	-	-

අංකය	ප්‍රධාන ක්‍රියාකාරකම්	උප ක්‍රියාකාරකම්	කාර්ය සාධන දර්ශක	සමුච්චිත ඉලක්කය	සමුච්චිත ජයග්‍රහණ
14	ආනයන ආදේශන නිෂ්පාදන නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම	නිෂ්පාදන වාණිජකරණය කිරීමේදී කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම (ආනයන ආදේශක)	කර්මාන්ත සංඛ්‍යාව	10	-
		ආනයන ආදේශක කර්මාන්ත ඇති කිරීම	කර්මාන්ත සංඛ්‍යාව	5	11
		දේශීය කර්මාන්ත / රාජ්‍ය ආයතන සඳහා යන්ත්‍රෝපකරණ / උපකරණ නිෂ්පාදනය සහ සැපයීම (ආනයන ආදේශක)	ආදේශ කර ඇති යන්ත්‍රෝපකරණ / උපකරණ සංඛ්‍යාව	80	-
15	කාර්මික ජනපද වල මූලික උපයෝගිතා සේවා සහතික කිරීම සහ අදාළ නිෂ්පාදන පහසුකම් පවත්වාගෙන යාම	මාසික කුලී සහ ගාස්තු එකතු කිරීම	ඉපැයූ ආදායම - කුලී (රු.මිලියන)	60	
			ඉපැයූ ආදායම - ජල ගාස්තු (රු. මිලියන)	6	-
			ඉපැයූ ආදායම - බදු ගිවිසුම් අත්සන් කිරීම (රු.මිලියන)	20	-
				0.8	-
			ඉඩම් අගය කිරීමේ ගාස්තු (මාරු කිරීම) (රු.මිලියන)	2.5	-
		ණය එකතු කිරීම	හිඟ මුදල් සහ අනෙකුත් අයවිය යුතු මුදල් එකතු කිරීම (රු. මිලියන)	20	-
			ඉපැයූ ආදායම - කාර්මික ජනපද නඩත්තු කිරීම සඳහා වක්‍රීය අරමුදලක් පිහිටුවීම	12	-
16	ආහාර රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම	අභ්‍යන්තර ඉදිකිරීම් / පහසුකම් සංවර්ධනය සහ ප්‍රතිනන ක්‍රියාවලිය	තත්ත්ව සහතික සංවර්ධනය %		100
17	ප්‍රසම්පාදන සැලසුම	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම	ව්‍යදම් තත්ත්වය %		77
		ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	ව්‍යදම් තත්ත්වය %		105
		සංවර්ධන ව්‍යදම්	ව්‍යදම් තත්ත්වය %		47

3.10 අංශවල ආදායම - 2022

3.10.1 ප්‍රස්තාරය : අංශවල ආදායම් ව්‍යාප්තිය පිළිබඳ ප්‍රස්ථාරික නිරූපණය



මෙරට ආර්ථිකය සම්බන්ධයෙන් ගත්කළ 2022 වසර ඉතිහාසයේ තීරණාත්මක සන්ධිස්ථානයක් විය. කෙසේ වෙතත්, බොහෝ දුෂ්කරතා මැද මධ්‍යස්ථ ආර්ථික තත්ත්වයක් යළි ස්ථාපිත වී ඇත. ගෝලීය ආර්ථික පසුබෑම නොතකා, ශ්‍රී ලංකාවේ ආර්ථිකය එහි ප්‍රයත්නයන් තුළ සමෘද්ධිමත් වූ අතර වේගයෙන්ම වර්ධනය වන ආර්ථිකයන්ගෙන් එකක් ලෙස ඉස්මතු විය. මෙය, මෙරට සමස්ත ආයතන සඳහාම බලපා ඇති අතර, ප්‍රධාන සේවා ඉලක්ක කරගත් ආයතනයක් ලෙස IDB මෙම කාලසීමාව තුළ විවිධ සංවර්ධන මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට සමත් වී ඇති අතර ඒවායේ ප්‍රතිඵල සමස්ත ආයතනික කාර්ය සාධනය තුළ ආකර්ෂණීය අනුපාතවලින් පිළිබිඹු විය.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ දැක්ම කරා ලඟා වීමට උත්සාහ කිරීමේ දී, ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රවර්ධනය, දිරිගැන්වීම, සංවර්ධනය සහ පහසුකම් සැලසීම වැදගත් කාර්යභාරයකි. වර්තමානයේ දී, එය ආර්ථිකයේ පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්හි සියලුම කාර්මික ව්‍යාපාරවල නිසි සම්බන්ධීකරණයක් සහ අන්තර් සම්බන්ධිත වර්ධනයක් සඳහා සහාය වීම පිණිස විවිධ සේවාවන් සපයයි. කාර්මික අංශය දිරිමත් කිරීම සහ බලගැන්වීම ඕනෑම රටකට දිගුකාලීන සාර්ථකත්වයක් අත්කර ගැනීමට අත්‍යවශ්‍ය සාධකයකි. දේශීය හා විදේශීය වෙළෙඳපොළ තුළ අපගේ නිෂ්පාදනවල තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, පිරිවැය අවම කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම සහ සන්නාම වටිනාකම වැඩිදියුණු කිරීම වඩ වඩාත් වැදගත් වේ. ජාතික ආර්ථිකයේ වර්ධනය සඳහා වන උපායමාර්ගික වැදගත්කම හේතුවෙන් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කෙරෙහි IDB හි සමස්ත ප්‍රයත්නයන් ප්‍රධාන වශයෙන් යොමු කර ඇත. ඉහත කරුණු අනුව, පසුගිය වසරේ දී අපගේ ප්‍රධානතම ප්‍රමුඛතාවය වූයේ IDB හි ආයතනික සංස්කෘතිය තුළ බෙහෙවින් අවශ්‍ය වූ ප්‍රතිසංස්කරණ සිදු කිරීමයි. එබැවින් IDB හි දිගුකාලීන අරමුණු ආවරණය කිරීම සඳහා සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ගික පරිවර්තනයක් සිදුකිරීම සඳහා සැලසුම්, පරිපාලන සහ මූල්‍ය අංශ ඇතුළු මෙහෙයුම් අංශ හැර IDB හි සියලුම අංශ සාමූහිකව කටයුතු කරන ලදී. IDB හි සංවර්ධන අංශ හරහා උපයන ආදායම සසඳන විට, කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය/ අබලි ද්‍රව්‍ය ලබා දීමෙන් ඉහළ වාර්ෂික ආදායමක් ලබමින් අලෙවි අංශය වඩාත් නිරවද්‍යව ඒ සඳහා දායක වී ඇත. IDB යනු සේවා/ පාරිභෝගික අභිමුඛ ආයතනයක් වුවද, සෑම කාර්යයක්ම සහ සේවකයෙකුම පාරිභෝගිකයාගේ ප්‍රකාශිත සහ අප්‍රකාශිත අවශ්‍යතා සපුරාලීම කෙරෙහි අවධානය යොමු කරයි. තවද, සපයනු ලබන සේවාවන් පිළිබඳව පාරිභෝගිකයින් සෑහීමට පත් වන්නේ නම් පමණක් තමන් සාර්ථක බව IDB තරයේ විශ්වාස කරනු ලබන අතර, මූල්‍ය වටිනාකම් මත වැඩි බරක් නොතබා තම ගනුදෙනුකරුවන් වෙනුවෙන් ගනු ලබන උත්සාහයන් පිලිබඳ සෑම තීරණයක්ම ඇගයීමට ලක් කරයි.

3.11 2023 වර්ෂය සඳහා අනාගත සැලසුම්

(1) ජා-ඇල ඒකල IDB කාර්මික ජනපදයේ නිෂ්පාදන කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ නියමු ව්‍යාපෘතිය 2022/2023

ව්‍යාපෘතිය මඟින් කර්මාන්ත සඳහා පහත සේවා ලබාදෙනු ඇත.

අ. විස්තීරණ බලශක්ති විගණන හරහා ඔවුන්ගේ බලශක්ති කාර්යක්ෂමතාව (විදුලිය) වැඩිදියුණු කිරීමට නොමිලේ උපදේශන සේවා. (තෝරාගත් අධි බල ශක්තියක් සහිත කර්මාන්ත සඳහා)
ආ. තෝරාගත් සියලුම කර්මාන්තවල අදාළ නිලධාරීන්/ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නොමිලේ බලශක්ති කළමනාකරුවන් පුහුණු කිරීම.
ඇ. කර්මාන්තවල දායකත්වයෙන් බලශක්ති කාර්යක්ෂමතා විකල්ප ක්‍රියාත්මක කිරීමට නොමිලේ තාක්ෂණික උපදේශන සහ සහාය ලබාදීම.
ඈ. බලශක්ති විගණනයේදී නිර්දේශ කරන ලද අවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා කර්මාන්ත අමාත්‍යාංශය හරහා මූල්‍ය ආධාර ලබා ගැනීමට සහාය වීම.
ඉ. ක්‍රමවත් පසු විපරම් සේවා.

(2) ශ්‍රී ලංකාවේ කර්මාන්තවල දේශගුණික ප්‍රතිචාරය වේගවත් කිරීම

පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති සහ සම්පත් කාර්යක්ෂමතා තාක්ෂණයන් සහ යහපරිවයන් යෙදවීම වේගවත් කිරීම සඳහා තාක්ෂණික, ප්‍රතිපත්තිමය, නියාමන සහ මූල්‍ය මෙවලම් සහ යාන්ත්‍රණ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ දේශගුණික විපර්යාස ප්‍රතිචාරය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ විශේෂිත අරමුණයි.

(3) ශ්‍රී ලංකාව තුළ ඵලදායී පසු අස්වනු ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතියක් යෝජනා කිරීම.

කාර්මික අංශය දිරිමත් කිරීම සහ බලගැන්වීම ඕනෑම රටකට දිගුකාලීන ආර්ථික සාර්ථකත්වයක් අත්කර ගැනීමට අත්‍යවශ්‍ය සාධකයකි. 2022 වර්ෂයේදී, මෙරට ව්‍යාපාරික ප්‍රජාවට බොහෝ උපකාරක සේවා සැපයීමට IDB සම්බන්ධ වී ඇත. දේශීය හා විදේශීය වෙළෙඳපොළ තුළ අපගේ නිෂ්පාදනවල තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, පිරිවැය අවම කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම සහ සන්නාම වටිනාකම වැඩිදියුණු කිරීම වඩාත් වැදගත් වේ. ජාතික ආර්ථිකයේ වර්ධනය සඳහා වන උපායමාර්ගික වැදගත්කම හේතුවෙන් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SMIs) දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කෙරෙහි IDB ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත. ඉහත කරුණු අනුව, මෙම වසරේ අපගේ ප්‍රධානතම ප්‍රමුඛතාවය වූයේ IDB හි ආයතනික සංස්කෘතිය තුල අත්‍යවශ්‍ය වූ ප්‍රතිසංස්කරණ සිදුකිරීම සහ අනාගතයේදී ද මෙම පුළුල් වගකීමට උර දීමට IDB සූදානම් කරමින්, ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් නවීකරණය කිරීම සඳහා සංවිධාන ව්‍යුහය නැවත සකස් කිරීමයි.





(04) අංශවල ප්‍රගතිය විශේෂ අවස්ථා

4.1 පරිපාලන අංශය

4.2 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය

4.3 ඉංජිනේරු අංශය

4.4 කාර්මික ජනපද අංශය

4.5 අලෙවි අංශය

4.6 සැලසුම් අංශය

4.7 ප්‍රාදේශීය සංවර්ධන අංශය

4.8 තාක්ෂණික සේවා අංශය

4.9 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය

4.10 රබර් භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය


4.1 පරිපාලන අංශය

4.1.1 හැඳින්වීම

මණ්ඩලයේ සියලුම මානව සම්පත් කළමනාකරණ (HRM) සහ මානව සම්පත් සංවර්ධන (HRD) ක්‍රියාකාරකම් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා IDB හි පරිපාලන අංශය වගකියනු ලැබේ. තවද, ව්‍යාපාර ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් කාර්යාල කටයුතු සකස් කිරීම, වර්ග කිරීම, සංවිධානය කිරීම සහ පාලනය කිරීම අංශයේ භූමිකාවට ඇතුළත් වේ. තවද, පරිපාලන අංශය ආයතනයේ සමස්ත අංශ වල කාර්යක්ෂම කාර්ය සාධනය සහතික කරන ප්‍රධාන අංශ වලින් එකකි. බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සහ උසස් කිරීමේ පටිපාටිය (SoP) සකස් කිරීම, විධිමත් බඳවා ගැනීම් සිදු කිරීම, කාර්ය සාධන ඇගයීම්, සේවක විශ්‍රාම ගැන්වීම්, විනය පරීක්ෂණ පැවැත්වීම, දේශීය පුහුණු සංවිධානය කිරීම, සේවක වන්දි යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම යනාදිය මෙම අංශයට පැවරී ඇති තවත් කාර්යයන් කිහිපයකි.

4.1.1 වගුව: සේවක මණ්ඩල කළමනාකරණය

වර්ගීකරණය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)
ජේෂ්ඨ මට්ටම	12	4	8
තෘතීක මට්ටම	252	159	93
ද්විතීක මට්ටම	184	139	45
ප්‍රාථමික මට්ටම	266	173	93
එකතුව	**714**	**475**	**239**



4.1.2 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

4.1.2 වගුව: කාල සීමාව තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන්

අංකය	වැඩසටහනේ නම	පුහුණු කාර්ය මණ්ඩල සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	මුළු ආයෝජනය (රු.)	වැඩසටහනේ ස්වභාවය (විදෙස්/ දේශීය)	ප්‍රතිදානය / ලබාගත් දැනුම
01	වියදම් සහ ගෙවීම් පටිපාටිය සහ මූල්‍ය නියාමනය	02	දින 1	18,000	දේශීය	හැකියා වර්ධනය
02	ISO 50001:2018 බලශක්ති කළමනාකරණ පද්ධතියේ (EnMS) උපදේශක සංවර්ධනය	01	දින 4	32,500	දේශීය	හැකියා වර්ධනය
03	ශ්‍රී ලංකාවේ ICC බෙරුම්කරණය පිළිබඳ දෙමුහුන් සම්මන්ත්‍රණය	02	දින 1	10,000	දේශීය	හැකියා වර්ධනය
04	සම්පත් කාර්යක්ෂමතාව සහ පිරිසිදු නිෂ්පාදනය පිළිබඳ උපදේශක සංවර්ධනය - 2022	02	දින 5	65,000	දේශීය	හැකියා වර්ධනය
05	ඕෆ්සෙට් ලිතෝග්‍රැෆි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	දින 1	30,000	දේශීය	කුසලතා සංවර්ධනය
06	ඔසු/ආහාර කර්මාන්තයේ භාවිතා වන ගිතෙල්, තල තෙල්, පොල්තෙල්, එඩරු තෙල් සහ අනෙකුත් නිර්වාෂ්පශීල තෙල්වල ඇති අපද්‍රව්‍ය හඳුනාගැනීමේ වැඩමුළුව	01	දින 1	10,800	දේශීය	හැකියා වර්ධනය
07	ඔසු/ආහාර කර්මාන්තයේ භාවිතා වන ගිතෙල්, තල තෙල්, පොල්තෙල්, එඩරු තෙල් සහ අනෙකුත් නිර්වාෂ්පශීල තෙල්වල ඇති අපද්‍රව්‍ය හඳුනාගැනීමේ වැඩමුළුව	01	දින 1	11,200	දේශීය	හැකියා වර්ධනය
08	Solidworks මූලික පාඨමාලාව	04	දින 1	60,000	දේශීය	හැකියා වර්ධනය
09	ඖෂධ පැළෑටි සහ රූපලාවන්‍ය ද්‍රව්‍යවල තත්ත්ව පාලනය පිළිබඳ වැඩමුළුව	02	දින 1	11,500	දේශීය	හැකියා වර්ධනය
10	ISO/IEC 17025:2017 අනුව රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධති හඳුන්වාදීම	01	දින 2	12,000	දේශීය	හැකියා වර්ධනය
11	නිවාඩු නිලධාරියාගේ රාජකාරි සහ වගකීම්	01	දින 1	5,000	දේශීය	හැකියා වර්ධනය
12	නවතම සංශෝධන අනුව නොතාරිස්වරයාගේ රාජකාරි	01	දින 1	1,500	දේශීය	හැකියා වර්ධනය
13	රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන ක්‍රියා පටිපාටිවල මූලධර්ම	01	දින 2	7,500	දේශීය	හැකියා වර්ධනය
14	කම්කරු නීතියේ මෑතකාලීන සංවර්ධනයන් පිළිබඳ වැඩමුළුව	03	දින 1	30,000	දේශීය	හැකියා වර්ධනය
15	අභිප්‍රේරණ වැඩසටහන	475	දින 3	1,274,784	දේශීය	හැකියා වර්ධනය
16	වෙබ්අඩවි සංවර්ධනය සහ නිර්මාණය	01	මාස 4	60,000	දේශීය	හැකියා වර්ධනය
17	ආහාර සනීපාරක්ෂාව සහ තත්ත්ව සහතිකය පිළිබඳ පුහුණු වැඩසටහන	02	දින 6	12,000	දේශීය	හැකියා වර්ධනය
18	තොග කළමනාකරණය, ඉන්වෙන්ටරි පාලනය, සමීක්ෂණ මණ්ඩලය පිළිබඳ වැඩමුළුව	01	දින 2	7,500	දේශීය	හැකියා වර්ධනය
19	ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසාධනය සඳහා වූ මාර්ග සිතියම පිළිබඳ ජාත්‍යන්තර සමුළුව	03	දින 1	30,000	දේශීය	හැකියා වර්ධනය

පුහුණුව සහ සංවර්ධනය බොහෝ ආයතනවල ප්‍රමුඛතා ලැයිස්තුවේ ඇති වැදගත්ම ක්‍රියාකාරකම් වලින් එකක් වන අතර සේවකයින් සඳහා නිසි පුහුණු සහ සංවර්ධන සැසි සංවිධානය කිරීමේ විශාල වටිනාකමක් ඇත. පුහුණුව මඟින් සේවකයින්ට නව කුසලතා ලබා ගැනීමට, පවතින කුසලතා වැඩිදියුණු කරගැනීමට, මනා කාර්ය සාධනයක් අත්පත්කර ගැනීමට සහ ඵලදායිතාව වැඩි කරගැනීමට ඉඩ සලසයි. ආයතනයේ කාර්යක්ෂමතාවය කෙරෙහි ඵලදායිතාව සහ කාර්ය සාධනය පිළිබඳ පුහුණුව ඍජු බලපෑමක් ඇති කරයි. මුලින් සඳහන් කළ පරිදි, පුහුණුව මඟින් සේවකයින්ට තම වගකීම්, දැනුම සහ රැකියාව කිරීමට අවශ්‍ය කුසලතා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා දෙයි. හැකියා ගොඩනැගීමේ පුහුණු වැඩසටහන් මඟින් සේවකයින්ට සේවා ස්ථානය තුළ වඩාත් ඵලදායී සහ තිරසාර විය හැකි නිපුණතා සහ කුසලතා වර්ධනය කරගැනීමට හැකියාව ලැබෙන අතර, එය කාර්ය සාධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි වන පරිදි ඔවුන්ගේ විශ්වාසය වැඩි දියුණු කරනු ඇත. නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් මඟින් රැකියා කාර්ය සාධනය වැඩි කිරීම, ඵලදායිතාව වැඩි කිරීම, රැකියා තෘප්තිය වැඩි කිරීම සහ සේවකයන් රඳවා ගැනීමේ අනුපාත ඉහළ නැංවීම ඇතුළු ප්‍රතිලාභ රැසක් ලැබේ. එය වෘත්තීය දියුණුව සඳහා අවස්ථා, දැඩි විශ්වාසය සහ ඉහළ ජයග්‍රහණ සඳහා ද හේතු වනු ඇත. සෑම පුද්ගලයෙකුගේම යම් යම් අඩුපාඩු ඇති අතර පුහුණුව හා සංවර්ධනය තුළින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට හැකියාව ලැබෙන අතර, පුහුණු සැසි මඟින් සේවකයින්ගේ අඩුපාඩු හා දුර්වලතා නිවැරදි කර ගත හැකිය. අදාළ පුද්ගලයින් ඉලක්ක කර ගැනීම සඳහා පුහුණු සහ සංවර්ධන අවශ්‍යතා බිඳ හෙළීම සහ නව කුසලතා ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය පුහුණු සැසි සැපයීම ආයතනයකට වැදගත් වේ. මෙම සන්දර්භය තුළ, අවශ්‍ය පරිදි එකිනෙකාගේ රාජකාරි ඉටුකළ හැකි, කණ්ඩායමක් ලෙස සාමූහිකව කටයුතු කිරීමට හෝ නිරන්තර උපකාර සහ අධීක්ෂණයකින් තොරව ස්වාධීනව කටයුතු කළ හැකි සමස්ත දැනුමැති කාර්ය මණ්ඩලයක් නිර්මාණය කිරීම සඳහා ආයතනයක පරිපාලන අංශය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි.

4.1.3 කාර්ය සාධනය - 2022

4.1.3 වගුව: 2022 දී අංශයේ කාර්ය සාධන විශේෂතා

#	ක්‍රියාකාරකම	සංඛ්‍යාව
1	**HRM – බඳවා ගැනීම්**	
(i)	බඳවා ගැනීම් (කාර්යය මණ්ඩල)	08
(ii)	ඉල්ලා අස්වීම්	19
(iii)	විශ්‍රාම ගැනීම්	17
(iv)	තනතුර හැර යාම්	04
2	**HRD – පුහුණු වැඩසටහන්**	
(i)	දේශීය පුහුණු	19
(ii)	විදේශීය පුහුණු	00
3	**HRM – සේවක සුභසාධනය**	
(i)	පාරිතෝෂික ණය – තැනැත්තන් 96	රු. 20,415,337.26
4	**ආරක්ෂක කළමනාකරණය**	
(i)	ආරක්ෂක පිරිවැය	රු. 28,110,356.10
5	**බැහැර කිරීම**	
(i)	පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ	01
6	**තැපැල් හා විදුලි සංදේශ ගාස්තු**	
(i)	තැපැල් ගාස්තු	රු. 633,220.00
(ii)	විදුලි සංදේශ ගාස්තු	රු. 5,873,377.99

4.2 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS)

4.2.1 හැඳින්වීම

ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS) 1989 දෙසැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් පේෂකර්ම හා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ විශේෂ පුහුණු අංශයක් ලෙස ස්ථාපිත කරන ලදී. මෙම අංශය මඟින් දීපව්‍යාප්ත පදනමින් කළමනාකරණ කුසලතා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ පුහුණුව ලබා දේ. CEDACS අංශය පුහුණු ඒකකය, පුස්තකාලය සහ තොරතුරු කුටිය, තොරතුරු තාක්ෂණ ඒකකය සහ මුද්‍රණ ඒකකය ලෙස ඒකක හතරකින් සමන්විත වේ. දැනට වැදගත් ව්‍යාපාර සහ නව කර්මාන්ත තේමා පිළිබඳව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අනාගත ව්‍යවසායකයින් දැනුවත් කිරීම මෙම සියලුම උප අංශවලට පැවරී ඇත.

පුහුණු ඒකකයේ ප්‍රධාන කාර්ය භාරය වන්නේ රට පුරා කළමනාකරණ කුසලතා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ විවිධ පුහුණු ලබා දීමයි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පුස්තකාල පහසුකම්, උපදේශන සේවා සහ කාර්මික තොරතුරු සැපයීම පුස්තකාල සහ තොරතුරු ඒකක නිලධාරීන්ට පැවරී ඇත. තොරතුරු තාක්ෂණ ඒකකය විසින් IDB තුළ ජාල සහ තොරතුරු පහසුකම් සපයන අතර, ව්‍යවසායකයින්ගේ ICT කුසලතා වැඩි දියුණු කිරීම සහ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සිදු කරයි. වාර්තා, අත්පොත්, පත්‍රිකා ඇතුළු ලිපි ලේඛන මුද්‍රණය කිරීම මුද්‍රණ ඒකකය විසින් සිදු කරයි. CEDACS අංශය ශ්‍රී ලංකාව තුළ නව කළමනාකරණ උපාය මාර්ග හඳුන්වාදීම, තාක්ෂණික දැනුම ලබා දීම, උපදේශන සේවා සැපයීම සහ ඩිජිටල් අලෙවිකරණය, ජංගම තාක්ෂණය, ඊ-වාණිජ්‍යය සහ IoT යනාදී ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්ගේ ICT කුසලතා වැඩි දියුණු කිරීම තුළින් නව ව්‍යවසායක සංස්කෘතියක් ඇති කිරීමට සම්බන්ධ වී ඇත. එම ඉලක්ක සපුරා ගැනීම සඳහා, CEDACS අංශය වෙත පවරා ඇති කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

CEDACS වෙත පැවරී ඇති කාර්යයන්

- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යාපාර නිර්මාණය කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ඵලදායිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- කළමනාකරණ කුසලතා සංවර්ධන කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යවසායකයින් සඳහා වාණිජ සහ ව්‍යාපාර පුහුණුව ලබා දීම.
- සමාජ මාධ්‍ය අලෙවිකරණය, වෙබ් අඩවි සංවර්ධනය, ඩ්‍රොප් ෂිපින් (drop shipping) සහ ක්‍රිප්ටෝ (Crypto) වෙළඳාම පිළිබඳ වැඩමුළු පැවැත්වීම.
- අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් පහසුකම් සැපයීම.
- ඩිජිටල් අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- ජංගම යෙදුම් සංවර්ධනය සහ මාර්ගගත මුදල් ඉපැයීමේ සම්මන්ත්‍රණ පැවැත්වීම.
- ප්‍රකාශන අළෙවිය.
- පුස්තකාල පොත් එකතුව වැඩිදියුණු කිරීම. (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
- කාර්මික තොරතුරු සංවිධානය කිරීම.
- මාර්ගගත දත්ත පදනම තුළ IDB සේවාලාභීන් ලියාපදිංචි කිරීම.
- කර්මාන්තකරුවන්, ගනුදෙනුකරුවන් සහ IDB කාර්ය මණ්ඩලය යනාදීන් වෙත කාර්මික තොරතුරු බෙදා හැරීම.
- ග්‍රන්ථ නාමාවලි දත්ත, දේශීය යන්ත්‍රෝපකරණ සහ නිෂ්පාදන නිමැවුම්කරුවන්, වාර්තා, ශ්‍රී ලංකා ප්‍රමිති, ආධාරක ආයතන, පනත් පිළිබඳ දත්ත සමුදායන් නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.
- අත් පොත්, පැකේජ, පත්‍රිකා, දර්ශක සහ පුස්තිකා යනාදී ප්‍රකාශන සම්පාදනය සහ යාවත්කාලීන කිරීම.

4.2.2 අංශය මගින් පවත්වනු ලැබූ ප්‍රධාන වැඩසටහන්

(1) අපනයන ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන





මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

(02) ගිරාඳුරුකෝට්ටේ මහවැලි සී කලාපයේ සංවර්ධන මධ්‍යස්ථානයේ දී පැවැත්වුණු තිර මුද්‍රණ (Screen Printing) පුහුණුව



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

(03) මහවැලි සංවර්ධන අධිකාරියේ වලව කලාපයේ දී පැවැත්වුණු ව්‍යාපාර නිර්මාණය කිරීමේ වැඩසටහන



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

(04) ඇඹිලිපිටිය, වලව මහවැලි කලාප පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වුණු විද්‍යුත් උපකරණ අළුත්වැඩියා කිරීමේ පුහුණුව




(05) මහවැලි සංවර්ධන අධිකාරියේ දෙහිඅත්තකණ්ඩිය කලාපයේ පැවති කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහන



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා


4.2.1 වගුව: අංශවල වසර අවසාන ප්‍රගතිය

අංකය	ක්‍රියාකාරකම්	සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.)
1	**ක්ෂුද්‍ර කර්මාන්ත ඇති කිරීම.**	
1.1	රැකියා විරහිත තරුණ තරුණියන්ට තමන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට සහ අපේක්ෂිත රැකියා සඳහා NVQ සහතිකය ලබා ගැනීමට ව්‍යාපාර සහ රැකියා උත්පාදන වැඩසටහන් සංවිධානය කිරීම සහ පැවැත්වීම.	575,000
2	**පවතින කර්මාන්ත වැඩිදියුණු කිරීම.**	
2.1	කළමනාකරණ කුසලතා සංවර්ධනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, අලෙවිකරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම.	434,000
3	**ICT සම්බන්ධ වැඩමුළු පැවැත්වීම.**	
3.1	සමාජ මාධ්‍ය අලෙවිකරණය, වෙබ් සංවර්ධනය, drop shipping සහ Crypto වෙළඳාම පිළිබඳ TVEC හි ලියාපදිංචි කරන ලද දින හතරක වැඩමුළු පැවැත්වීම.	1,785,000
3.2	සිව් දින නිපුණතා වැඩි දියුණු කිරීමේ වැඩමුළුවට සහභාගිවූවන්ගෙන් තෝරාගත් තැනැත්තන්හට ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ දින 12ක උසස් සහතිකපත්‍ර වැඩසටහන් පැවැත්වීම.	643,000
3.3	බාහිර අරමුදල් සපයන සංවිධාන සමඟ එක්ව තරුණයින් සඳහා සමාජ මාධ්‍ය අලෙවිකරණය, IoT, Fiverr, ජංගම යෙදුම් සංවර්ධනය පිළිබඳව ICT ආශ්‍රිත විවිධ වැඩමුළු පැවැත්වීම.	213,000
4	**විශේෂිත සේවා.**	
4.1	තොරතුරු සැපයීම / බෙදා හැරීම.	293,481
මුළු එකතුව		**3,943,481**



4.2.2 වගුව: වාර්ෂික සත්‍ය ආදායම සංසන්දනය කිරීම

වර්ෂය	සත්‍ය ආදායම (රු.)
2019	3,426,093
2020	2,605,850
2021	2,051,830
2022	3,943,481



ජාතික ආර්ථිකයේ වර්ධනය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SMIs) වල ඇති උපායමාර්ගික වැදගත්කම හේතුවෙන් එම කර්මාන්ත දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. එය ව්‍යවසායකයින් සහ කර්මාන්ත තාක්ෂණ තොරතුරු අතර පරතරය අඩු කරයි. වර්ෂයේ ප්‍රගතිය සලකා බැලීමේ දී පෙනී යන්නේ අඛණ්ඩව ලාභ ඉපැයීමේ හැකියාව මත මෙම අංශයේ සාර්ථකත්වය රඳා පවතින බවයි. පසුගිය වසර කිහිපය තුළ ආදායම් ඉපැයීම්වල පහත වැටීමක් සිදු වුවද, මෙරට පැවැති ආර්ථික හා සමාජ අසමතුලිතතාවයන් එයට ප්‍රධාන වශයෙන් හේතු විය. ඉහත වගුව සහ ප්‍රස්තාරය සලකා බැලීමේ දී පෙනී යන්නේ, ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස අඩපණ කර කාර්මික අංශයට ද විශාල බලපෑමක් ඇති කර ඇති COVID-19 පැතිරී යාම හේතුවෙන් 2019-2021 වර්ෂයන් තුළ සත්‍ය ආදායම පහත වැටී ඇති බවයි. එක් එක් අංශ මඟින් වසර පුරා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල සාර්ථකත්වය සහ වර්ධනය සඳහා ලාභදායීත්වය බලපාන බැවින්, එය අංශයක් සඳහා බෙහෙවින් වැදගත් වේ. 2022 වර්ෂයේදී, අංශයේ සමස්ත ආදායම ඉහළ නැංවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආශ්‍රිත වැඩමුළු සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. කාර්මික අංශය දිරිමත් කිරීම සහ බලගැන්වීම ඕනෑම රටකට දිගුකාලීන ආර්ථික සාර්ථකත්වයක් අත්කර ගැනීමට අත්‍යවශ්‍ය සාධකයකි. 2019 - 2022 කාලපරිච්ඡේදය තුළදී, මෙරට ව්‍යාපාරික ප්‍රජාවට බොහෝ උපකාරක සේවා සැපයීමට IDB සම්බන්ධ වී ඇත. දේශීය හා විදේශීය වෙළෙඳපොළ තුළ අපගේ නිෂ්පාදනයන්හි තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, පිරිවැය අවම කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම සහ සන්නාම වටිනාකම වැඩිදියුණු කිරීම වඩාත් වැදගත් වේ.

4.3 ඉංජිනේරු අංශය

4.3.1 හැඳින්වීම.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉංජිනේරු අංශය මෙරට තිරසර කර්මාන්ත සංවර්ධනයක් උදෙසා මණ්ඩලයෙහි දැක්ම ක්‍රියාත්මක කිරීමට දායක වන ප්‍රමුඛතම අංශය ලෙස ක්‍රියාත්මක වෙයි. 2022 වර්ෂයේදී, ඉංජිනේරු අංශයේ ක්‍රියාකාරකම් දැනට පවතින සහ නව/විභව කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර තෝරා ගැනීම, සැලසුම් කිරීම/සංවර්ධනය කිරීම සහ තාක්ෂණය/ක්‍රියාවලි පිළිබඳ දැනුම ලබා දීම. සඳහා යොමු කරන ලදී. තවද, රැකියා ඇනවුම් මත කර්මාන්තකරුවන්ට පිරිසැකසුම්, වාත්තු සහ නිම කිරීමේ සේවාවන් සැපයීම මෙම අංශය විසින් සිදුකරනු ලැබේ. අනෙකුත් ක්‍රියාකාරකම් අතරට ඉංජිනේරු විද්‍යාවට අදාළ විෂය ක්ෂේත්‍රවල පුහුණු වැඩමුළු පැවැත්වීම, යන්ත්‍රෝපකරණ තක්සේරු වාර්තා සැපයීම, වාත්තු අංශය සඳහා රසායනාගාර පරීක්ෂණ සේවා මෙන්ම කල්තියා සාදන ලද යන්ත්‍රෝපකරණ සහ උපකරණ අලෙවි කිරීම ඇතුළත් වේ.

ඉංජිනේරු අංශයේ ප්‍රධාන අරමුණු,

1. IDB හි අනෙකුත් අංශවලට ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සහ ආධාර හඳුනා ගැනීම සහ සියලුම පාර්ශ්වකරුවන්හට ප්‍රියජනක සේවාවන් සැපයීම සඳහා පවතින සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමෙන් එය ඉටු කිරීමට උත්සාහ දැරීම.

2. ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා සුදුසු තාක්ෂණය සහ යෙදුම් හඳුනාගෙන ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවනෝපාය තිරසාර ලෙස නඟා සිටුවීම සඳහා ඒවා ලබාදීම.

3. දේශීය කර්මාන්තවල නිෂ්පාදිත ලෝහ සහ ලෝහ නොවන නිෂ්පාදන/භාණ්ඩවල නිෂ්පාදන සාධක (ශ්‍රමය, තාක්ෂණය සහ අමුද්‍රව්‍ය) අධ්‍යයනය කිරීම සහ එම කර්මාන්තවල පවතින පරතරයන් හඳුනා ගැනීම සඳහා අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කිරීම, සහ ආනයනය අඩු කිරීම සඳහා මෙන්ම දේශීය කර්මාන්ත සඳහා විදේශීය වෙළෙඳපොළ විවෘත කිරීම පිණිස තිරසාර ලෙස පරතර සපුරාලීමට අවශ්‍ය පාරිසරික වෙනස්කම් සිදු කිරීම.

4. උපකරණ, යන්ත්‍රෝපකරණ, පිරියත සහ නිෂ්පාදන පහසුකම් තක්සේරු කිරීම සහ කර්මාන්ත සඳහා තත්ව වාර්තාව සහ තක්සේරු වාර්තා සකස් කිරීම.

5. අබලි ලෝහ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා දේශීය ලෝහ කර්මාන්ත සඳහා වාත්තු පහසුකම් සංවර්ධනය කිරීම සහ එමඟින් ලෝහ ආනයනය සහ අබලි ලෝහ අපනයනය අඩු කිරීම.

අංශයේ ප්‍රධාන ඉලක්ක


1. කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල තාක්ෂණික හා නිපුණතා පරතරය හඳුනාගෙන, තිරසාර වර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා ඒවා තිරසාර ලෙස ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

2. මූලික නිපුණතා හරහා අගය එකතු කළ භාණ්ඩ හා සේවා සැපයීම මගින් ඉංජිනේරු අංශයේ ආදායම්/මුදල් ප්‍රවාහය වැඩි කිරීම.

3. පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලීන් හඳුන්වා දීම තුළින් නව සැලසුම්, කෘෂිකාර්මික උපකරණ සහ යන්ත්‍රෝපකරණ ආනයනයන් සීමා කිරීම හා එම භාණ්ඩ මෙරට නිපදවා ගැනීමට කටයුතු කිරීම.

4. යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (ATRDC) - පන්නල

4.3.2 අංශයේ ව්‍යුහය



(1) ඉංජිනේරු කාර්යාලය හරහා සපයනු ලබන සේවා

- යන්ත්‍රෝපකරණ, උපකරණ, මෙවලම් තක්සේරු කිරීම සහ යන්ත්‍රෝපකරණ සඳහා තත්ත්ව සහ තක්සේරු වාර්තා ඉදිරිපත් කිරීම.
- කර්මාන්ත අමාත්‍යාංශයේ සහ අනෙකුත් අදාළ රාජ්‍ය ආයතනවල සහාය ඇතිව යන්ත්‍ර සහ සංරචක නිෂ්පාදනයේ අගය එකතු කිරීමේ කාර්යය සහතික කිරීම.
- දේශීය කර්මාන්ත සඳහා පිරිවැය ක්‍රම හඳුන්වා දීම.
- නිෂ්පාදන සහතික කිරීම සහ වාර්තා නිකුත් කිරීම.
- නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා පුද්ගලික පාර්ශවයන් සමඟ එක්ව ව්‍යාපාරික යෝජනා සහ අවබෝධතා ගිවිසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්ත ශක්‍යතා වාර්තා.
- ආධුනිකයින්, උපාධි අපේක්ෂකයින්, පුහුණු සහ අර්ධ පුහුණු ව්‍යවසායකයින් සහ NAITA අභ්‍යාසලාභීන් සඳහා පුහුණුව ලබා දීම.

- පරීක්ෂා කිරීමෙන් පසු ඉංජිනේරුමය අවශ්‍යතා මත කාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව අමාත්‍යාංශයට සහ රේගුව යනාදියට නිර්දේශ, ලිපි නිකුත් කිරීම.
- ව්‍යාපෘති සැකසීම සහ ඇගයීම.
- පිරියත සහ යන්ත්‍රෝපකරණ පිරිසැලසුම් සැලසුම් කිරීම.
- ක්‍රියාවලි තාක්ෂණය පිළිබඳ තාක්ෂණික දැනුම ලබා දීම.

(2) වැඩහල හරහා සපයනු ලබන සේවා

ප්‍රධාන වශයෙන් කාර්මික අංශයට ඉංජිනේරු වැඩහල් සේවා සැපයීම.





මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

- ලෝහමය කොටස් යාන්ත්‍රණය, කොටස් පට්ටල, ඇඹරීම, හැඩගැස්වීම සහ විදීම.
- ප්ලාස්ටික් අච්චු සහ රබර් අච්චු නිෂ්පාදනය කිරීම.
- වානේ උපාංග තාප පිරියම් කිරීම.
- මතුපිට ඇඹරීම සහ සිලින්ඩරාකාර ඇඹරීම.
- ලෝහ වාප සහ ඔක්සි-ඇසිටිලීන් වෑල්ඩින් මගින් නිෂ්පාදනය.
- කුඩා හා ක්ෂුද්‍ර පරිමාණ කර්මාන්ත සඳහා මෙවලම් සහ උපකරණ නිෂ්පාදනය කිරීම.
- යන්ත්‍රෝපකරණ පිරිසැකසුම් කිරීම, සැකසීම, ස්ථාපනය කිරීම පිළිබඳ උපදේශනය.
- ආයතනයේ අභ්‍යන්තර අංශ සඳහා අවශ්‍ය සේවා සැපයීම.

(3) වාත්තු ඒකකයේ ඉංජිනේරු කටයුතු

ලෝහ පාදක සංරචක නිෂ්පාදනය





මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රවෘත්ති පත්‍රිකා

- ලෝහ පාදක සංරචක නිෂ්පාදනය.
- උපකරණ සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය.
- ආනයන ආදේශක නිෂ්පාදනය.
- අළු වාත්තු යකඩ සහ ඩක්ටයිල් වාත්තු යකඩ සංරචක වාත්තු කිරීම.
- ඇලුමිනියම්, තඹ, පිත්තල සහ ලෝකඩ සංරචක වාත්තු කිරීම.
- වාත්තු සඳහා රටා සෑදීම.
- වාත්තු වැලි පරීක්ෂා කිරීම.
- ලෝහ පරීක්ෂා කිරීම.

- **ලෝහ විද්‍යාත්මක විද්‍යාගාරයෙන් සපයනු ලබන සේවා**
  - ද්‍රව්‍ය සහ නිෂ්පාදන පරීක්ෂා කිරීම සහ තහවුරු කිරීම.
  - විමෝචන වර්ණාවලීක්ෂ (Spectrometer) මඟින් ලෝහ වල රසායනික සංයුති පරීක්ෂණ සිදුකෙරේ.
  - ලෝහ පරීක්ෂණ,
    - දෘඪතා පරීක්ෂණය
    - ඇදුම් ආතතිය (ආතනය) ප්‍රබලතා පරීක්ෂණය
    - දිගු කිරීමේ (Elongation) පරීක්ෂණය
    - සම්පීඩන පරීක්ෂණය
    - ලෝහ ව්‍යුහාත්මක පරීක්ෂණ - ලෝහ සඳහා ක්ෂුද්‍ර ව්‍යුහ පරීක්ෂණය

- වාත්තු පස් අච්චු වල පරීක්ෂණ,
  - තෙතමන පරීක්ෂාව
  - සම්පූර්ණ මැටි අන්තර්ගතය පරීක්ෂණය
  - පාරගම්‍යතා පරීක්ෂණය
  - සාපල්‍ය මැටි අන්තර්ගතය පරීක්ෂණය
  - සම්පීඩන පරීක්ෂණය
  - සිලිකා වැලි අංශු ප්‍රමාණ වෙන්කරවාලීමේ පරීක්ෂණය



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

(4) CNC යන්ත්‍රෝපකරණ මධ්‍යස්ථානයේ ඉංජිනේරුමය ක්‍රියාකාරකම්





මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

- පරිගණක සංඛ්‍යාන පාලන (**CNC**) යන්ත්‍රකරණ සේවා.
- CNC 5 axis මෙහෙලුම් (milling) සහ 2 axis ලේත් (lathe) යන්ත්‍රෝපකරණ සේවා.
- ඩයි සහ අච්චු සේවා.
- ඩයි සහ අච්චු කාර්මික අවශ්‍යතා සම්පූර්ණ කිරීම සහ සුදුසු විසඳුම් ලබාදීම.
- නිර්මාණ මුද්‍රණය ඇතුළු උසස් තාක්ෂණික පුහුණු කිරීම් මඟින් ව්‍යවසායකයින් සවිබල ගැන්වීම.

(5) මාතර පොදු සේවා මධ්‍යස්ථානය (CSC) හරහා සපයනු ලබන සේවාවන්

- ලෝහමය කොටස් යාන්ත්‍රණය, කොටස් පට්ටල, ඇඹරීම, හැඩගැස්වීම සහ විදීම.
- ලෝහ වාප සහ ඔක්සි-ඇසිටිලීන් වෑල්ඩින් මඟින් නිෂ්පාදනය.
- කුඩා හා ක්ෂුද්‍ර පරිමාණ කර්මාන්ත සඳහා මෙවලම් සහ උපකරණ නිෂ්පාදනය කිරීම.
- යන්ත්‍රෝපකරණ පිරිසැකසුම් කිරීම, සැකසීම, ස්ථාපනය කිරීම පිළිබඳ උපදේශනය.
- ආයතනයේ අභ්‍යන්තර අංශ සඳහා අවශ්‍ය සේවා සැපයීම.

(6) සිවිල් ඉංජිනේරු ඒකකයේ කාර්යයන්

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින යටිතල පහසුකම් සංවර්ධනය සපයන සිවිල් වෘත්තිකයන් සිටින එකම අංශය මෙය වේ.

1. ටෙන්ඩර් ලේඛන, පිරිවිතර සකස් කිරීම.
2. කර්මාන්ත යහ පරිචයන් අනුගමනය කිරීම.
3. සියලුම අභ්‍යන්තර සහ බාහිර සිවිල් කටයුතු නඩත්තු කිරීම.
4. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(7) විදුලි ඉංජිනේරු ඒකකයේ කාර්යයන්

කර්මාන්ත සංවර්ධන පහසුකම් සැපයිය හැකි විදුලි ඉංජිනේරු වෘත්තිකයන් සිටින කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ප්‍රධාන ආයතනයකි.

- සියලුම අභ්‍යන්තර හා බාහිර විදුලි සහ වායු සම්කරණ කටයුතු පවත්වාගෙන යාම.
- ජාතික ශිල්ප සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහ කර්මාන්ත අමාත්‍යාංශය වැනි බාහිර ආයතනවලට සේවා සැපයීම.

(8) රබර් නිෂ්පාදන සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය

රබර් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා සහාය වීම අරමුණ වේ.



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

- ව්‍යාප්ති සහ උපදේශන සේවා.
- සම්මන්ත්‍රණ සහ වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන්.
- මූලික වෙළඳපල උපදෙස් සහ උප කොන්ත්‍රාත් සිදුකිරීම.
- තත්ත්ව සහතිකය සහ නිෂ්පාදන පරීක්ෂා කිරීම.
- අමුද්‍රව්‍ය, රබර් සංයෝග සහ රබර් නිෂ්පාදන පරීක්ෂා කිරීම.
- නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය.
- නියැදි නිෂ්පාදනය කිරීම.
- රබර් නිෂ්පාදන සහ සංයෝග සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම.
- අර්ධ වාණිජ කටයුතු.
- රබර් කිරි සහ වියළි රබර් සංයෝග සැපයීම.

(9) විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය (EPC), පැලියගොඩ

දේශීය කර්මාන්තවලට ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කර ගැනීම සඳහා ලෝහාලෝහ තාක්ෂණය සහ සේවාවන් මෙම මධ්‍යස්ථානය මඟින් සපයනු ලබයි. නිකල් හාඩ් ක්‍රෝමියම් සහ සින්ක් ආලේපන රසායනාගාර පරීක්ෂණ සහ පුහුණු කිරීම් මෙහි සේවාවන්ට අයත් වේ.

(10) යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (ATRDC) - පන්නල

- කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා අවැසි යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අවශ්‍යතාවන් හා වුවමනාවන් හඳුනා ගැනීමේ හැකියාව හා ශක්‍යතාව මෙම මධ්‍යස්ථානය සතුව පවතින අතර දේශීය ගොවීන් සඳහා ප්‍රශස්ත පිරිවැයකින් ඒවා සැලසුම් කිරීම හා පිරිසැකසුම් කිරීම සිදුකරනු ලබයි.
- යන්ත්‍ර සූත්‍ර, උපකරණ, පිරියත සහ වෙනත් නිෂ්පාදන පහසුකම් තක්සේරු කිරීම සහ කර්මාන්ත සඳහා තත්ත්ව වාර්තා සහ තක්සේරු වාර්තා සකස් කිරීම.
- ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සැලසුම් කිරීම, පිරිසැකසුම් කිරීම, එකලස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම මධ්‍යස්ථානය විසින් මෙහෙයවනු ලබන තවත් ක්‍රියාකාරකම් කිහිපයක් වේ.

(11) පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය – පමුණුව, පිළිමතලාව

තරඟකාරී ගෝලීය වෙළෙඳපොළට සරිලන පරිදි ශ්‍රී ලංකාව තුළ අඩු වියදමින් හා උසස් තත්ත්වයෙන් යුතු පිත්තල නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා සුදුසු තාක්ෂණය සහ දැනුම ලබා දීමෙන් පිත්තල කර්මාන්තයේ නියැලී සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නගා සිටුවීම සඳහා මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත.
ඉහත සඳහන් කළ සේවා ඒකක හැරුණු විට, දේශීය කර්මාන්ත සඳහා තිරසාර වර්ධනයක් සඳහා මෙන්ම ඉංජිනේරු අංශය ස්වයංපෝෂිත කිරීම සඳහා අපේක්ෂිත අගය එකතු කළ සේවාවන් සැපයීමට පහත සඳහන් සේවා ඒකක ඉතා වැදගත් වේ.

(12) සැලසුම් හා සංවර්ධන ඒකකය:

කර්මාන්තවල තිරසාර ආර්ථික වර්ධනය සඳහා කාර්මික අවශ්‍යතා හඳුනාගෙන උපකරණ, යන්ත්‍ර සූත්‍ර, පිරියත සහ නිෂ්පාදන පහසුකම් සැලසුම් කිරීම සහ ඒවා තිරසාර ලෙස ක්‍රියාත්මක කිරීම.


(13) තක්සේරු සහ ලෝහ පදනම් කරගත් කර්මාන්ත දත්ත විශ්ලේෂණ ඒකකය:

- ශ්‍රී ලංකාවේ පිරියත, උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ නිෂ්පාදන පහසුකම් ඇගයීම, තක්සේරු කිරීම සහ තත්ත්ව වාර්තා සකස් කිරීම.
- දේශීය කර්මාන්තවල ලෝහ හා ලෝහ නොවන නිෂ්පාදන, භාණ්ඩ නිෂ්පාදනයේ නිෂ්පාදන සාධක (ශ්‍රමය, තාක්ෂණය සහ අමුද්‍රව්‍ය) අනුපාත අධ්‍යයනය කිරීම සඳහා ප්‍රාථමික සහ ද්විතීයික දත්ත රැස් කිරීම සහ පරණ ලෝහ ආනයනය හා අපනයනය අවම කිරීමට මෙන්ම දේශීය කර්මාන්ත වලට විදේශීය වෙළෙඳපොළ විවෘත කිරීම සඳහා තිරසාර ලෙස පරතරය සපුරාලීම වෙනුවෙන් පරතර හඳුනාගෙන අවශ්‍ය පාරිසරික වෙනස්කම් සිදු කිරීම සඳහා ඒවා අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කිරීම.

4.3.3 අංශයේ ප්‍රගතිය - 2022

4.3.1 වගුව : 2022 වර්ෂය සඳහා සාරාංශ ප්‍රගති වාර්තාව

අංකය	අංශය/ඒකකය	කරන ලද වැඩවල ආදායම		එකතුව
		අභ්‍යන්තර	බාහිර	
01	ඉංජිනේරු වැඩහල, ප්‍රධාන කාර්යාලය - කටුබැද්ද	1,644,750.00	11,031,140.00	12,675,890.00
02	වාත්තු වැඩපොළ, ප්‍රධාන කාර්යාලය - කටුබැද්ද	2,775,095.00	23,095,019.00	25,870,114.00
03	තක්සේරු වාර්තා - ප්‍රධාන කාර්යාලය - කටුබැද්ද		2,355,395.00	2,355,395.00
04	A.T.R.D.C, පන්නල			3,229,108.11
05	E.P.C. පැලියගොඩ			3,369,970.00
06	පුහුණු වැඩසටහන් පැවැත්වීම			64,000.00
07	CNC ඒකකය		1,234,570.00	1,234,570.00
08	C.S.C. මාතර		5,000,000.00	5,000,000.00
09	පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය			400,672.00
10	සිවිල්			4,088,122.00
11	විදුලි	1,876,213.58	674,552.88	2,550,766.46
12	තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති උපදේශනය			2,912,490.00
එකතුව				**63,751,097.57**



නව ව්‍යාපෘතීන්

(1) මධ්‍යම සංඛ්‍යාත ප්‍රේරක උදුන (MFIF) ආශ්‍රිත සේවා



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

- කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබාදීම.
- ශ්‍රී ලංකාවේ වාත්තු පුහුණුව ලබා දෙන එකම ආයතනය ලෙස තාක්ෂණික පුහුණු සහ උපදේශන සේවා සැපයීම.
- වාත්තු ආශ්‍රිත නිෂ්පාදන කිරීමේදී නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නවීන යෙදුම් හඳුන්වා දීම සහ දේශීය නිෂ්පාදකයින්ගේ හැකියාවන් වැඩිදියුණු කරගැනීමට ඔවුන්ට අවශ්‍ය සහාය ලබාදීම.

(2) ශ්‍රී ලංකාවේ වාෂ්ප ජනක යන්ත්‍ර සහ පීඩන ග්‍රාහක පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම (BPVB)



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

- බොයිලේරු නිෂ්පාදනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සහ ඊට අදාලව ස්වාධීන පරීක්ෂණ සහතිකයක් නිකුත් කිරීම සඳහා නියාමන ආයතනයක් පිහිටුවීම.
- ජාත්‍යන්තරව පිළිගත් බොයිලේරු නිෂ්පාදන ප්‍රමිතීන් මගින් නියම කර ඇති ආරක්ෂිත මට්ටම් වලට අනුකූල වීම.
- දේශීය බොයිලේරු නිෂ්පාදන කර්මාන්තකරුවන් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබාදෙමින් ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.
- මධ්‍යස්ථානයේ කටයුතු ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.

(3) කාර්මික පුහුණු වැඩසටහන්

- පුහුණු නාමාවලිය හඳුන්වාදීම
- විවිධ කාණ්ඩ යටතේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

(4) ශ්‍රී ලංකාවේ තාක්ෂණික ව්‍යවසායකයින් දිරිගැන්වීම

- IDB පරිශ්‍රයේ දැනට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ප්‍රථම විදුලි මෝටර් බයිසිකලයේ වැඩකටයුතු සම්පූර්ණ කරන ලදී.



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුවත් පත්‍රිකා

- IDB පරිශ්‍රයේ දැනට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ප්‍රථම විදුලි ත්‍රිරෝද රථය සහ විදුලි බලයෙන් ක්‍රියාත්මක වන පැඩල් බයිසිකලය ලියාපදිංචි කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම.


(5) ශ්‍රී ලාංකීය වෙළඳපොල සඳහා අඩු වියදම් කෘත්‍රිම උපකරණ නිපදවීම

- ආකෘති සැලසුම් කිරීම, පරීක්ෂා කර සායනික අධ්‍යයන සිදු කිරීම සහ එම ආකෘති IDB ඉංජිනේරු කණ්ඩායමේ සහාය ඇතිව NMRA අනුමැතිය සඳහා යොමු කිරීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට scoliosis ප්‍රතිකාර ක්‍රමය සඳහා අස්ථි බිඳීම් සුව කිරීමට සහ කොඳු ඇට පෙළ සඳහා බාහිරින් සවිකරන මූලාකෘති සැකසීම.
- වෛද්‍ය ක්ෂේත්‍රයේ තාක්ෂණික ව්‍යවසායකයින් හඳුන්වාදීම සහ සංවර්ධනය කිරීම.

(6) ශ්‍රී ලංකා නව නිපැයුම් කොමිසම සමඟ එක්ව නව නිෂ්පාදන සංවර්ධනයට සහාය වීම.
(7) මෝටර් රථ අංශය සඳහා පෞද්ගලික පොදු හවුල්කාරිත්ව (PPP) ආකෘතිය හඳුන්වාදීම.
(8) ඇඹිලිපිටියේ කුළුබඩු සැකසුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා උපදේශන සේවා සැපයීම.
(9) පෞද්ගලික පොදු හවුල්කාරිත්වය (PPP) ස්ථාපිත කිරීම තුළින් තිරසාර කර්මාන්තකරණය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අනුයුක්ත පන්නල වැඩපොළ පහසුකම් ඵලදායී ලෙස භාවිතා කිරීම. (කර්මාන්තකරුවන් සඳහා ද්‍රව්‍ය බැංකුව)

4.3.2 වගුව : තත්‍ය ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම

වර්ෂය	තත්‍ය ආදායම (රු.)
2019	22,769,521
2020	21,806,327
2021	27,993,261
2022	63,751,098



කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉංජිනේරු අංශය මණ්ඩලයේ ස්වයංපෝෂිත අංශය බවට පත්වීමේ ප්‍රමුඛ දැක්ම සහ උපායමාර්ගික අභිප්‍රාය සහිතව, ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ සුදුසු විභව කර්මාන්තයන්හි වර්ධනය සඳහා සීමා රහිත ඉංජිනේරුමය වේදිකාවක් සපයමින් ක්‍රියාත්මක වේ. මෙම අංශයේ උපායමාර්ගික අභිප්‍රාය වන්නේ මෙරට තිරසාර කාර්මික සංවර්ධනය උදෙසා මණ්ඩලයෙහි දැක්ම ක්‍රියාත්මක කිරීමට දායක වන ප්‍රමුඛතම අංශය ලෙස ක්‍රියා කිරීමයි. එමෙන්ම මෙම අංශය කර්මාන්තකරුවන්ට තිබෙන සීමිත සම්පත් ප්‍රශස්ත ආකාරයෙන් උපයෝජනය කර ගනිමින් තම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස තාක්ෂණික සහ මෙහෙයුම් සහාය වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදේ. අංශයේ වාර්ෂික ප්‍රගතිය දෙස බැලීමේ දී, 2020 වසරේ සිට 2022 දක්වා වාර්ෂික ආදායමේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරයි. COVID 19 තර්ජනය ඔවුන්ව අවිනිශ්චිත තත්වයකට පත් කළ අතර මුළු රටම දැඩි ලෙස පීඩාවට පත් විය. වසංගත කාලපරිච්ඡේදය තුළ පනවන ලද අගුලු දැමීම සහ අනෙකුත් සීමා කිරීම් හේතුවෙන් නියමිත වැඩසටහන් බොහොමයක් අවලංගු කළ බැවින්, එය 2020 වර්ෂයේ ආදායම පහත වැටීමට හේතු විය. කෙසේ වෙතත්, පසුගිය වසරවල දත්ත සමඟ සසඳන විට, 2022 දී ඉංජිනේරු අංශය ඉහළ වර්ධනයක් අත්කරගෙන ඇත. මූලික වශයෙන්, නියමිත ඉලක්ක ප්‍රශස්ත මට්ටමකින් සපුරා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස මෙය සාක්ෂාත් කර ගෙන ඇත. මීට අමතරව, දැනට පැවරී ඇති කාර්යයන් වලට අමතරව අංශය විසින් නව ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කර ඇති අතර, ඉහළම ආදායමක් ලබා ගැනීමට එය හේතු වී ඇත. තවද, අංශය විසින් කර්මාන්තකරුවන්ගේ ලෝහ සහ ලෝහ නොවන නිෂ්පාදන/භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ මූලික නිෂ්පාදන සාධක (ශ්‍රමය, තාක්ෂණය සහ අමුද්‍රව්‍ය) සම්බන්ධව අධ්‍යයන සිදු කරයි. තරහකාරී ගෝලීය කාර්මික පරිසරය සමඟ තරහ කිරීමට ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් හරහා තරහකාරී වාසියක් ලබා ගැනීම සඳහා 2022 වර්ෂය තුළ මෙම අංශය විසින් සියලුම කර්මාන්ත සඳහා වෘත්තීය ඉංජිනේරු විසඳුම් සහ සේවා ලබා දී ඇත. අවසාන වශයෙන්, ශ්‍රී ලංකාවේ තිරසාර කාර්මික හා ආර්ථික වර්ධනය උදෙසා අපේක්ෂිත ප්‍රතිඵල ලබාදීම පිණිස, ඉංජිනේරු අංශය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ දැක්ම, මෙහෙවර සහ ඉලක්ක සමඟ සමගාමීව තම උපායමාර්ග සහ අරමුණු ඉලක්කගත කර ඇත.

4.4 කාර්මික ජනපද අංශය

4.4.1 හැඳින්වීම

මෙරට සමාජ ආර්ථික සංවර්ධනය තුළ, දිස්ත්‍රික්ක සහ කොළඹ හා තදාසන්න ප්‍රදේශ අතර ප්‍රමාණවත් කාර්මික යටිතල පහසුකම්වල පරතරයක් ඇත. එබැවින්, ප්‍රාදේශීය කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ රට පුරා කාර්මික සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා, 1960 දශකයේ දී කාර්මික ජනපද සංකල්පය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලයට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරිගැන්වීම, සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇත. පනතේ 33 (2) (අ) වගන්තිය මගින් "ලංකාවේ කාර්මික ජනපද පිහිටුවීමට, නඩත්තු කිරීමට සහ පවත්වාගෙන යාමට" මණ්ඩලයට බලය පවරා ඇත. එබැවින් කාර්මික ජනපද අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ නව කාර්මික ජනපද පිහිටුවීම සහ තම නිෂ්පාදන කර්මාන්ත සඳහා ප්‍රමාණවත් ඉඩක් නොමැති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා දිගු කාලීන කල් බදු පදනම මත ගොඩනැගිය හැකි ඉඩම් හෝ කර්මාන්තශාලා ගොඩනැගිලි/වැඩි දියුණු කළ දේපල ලබා දීමයි. මෑත කාලයේදී, නව කර්මාන්ත පිහිටුවීමට පෞද්ගලික අංශය දිරිමත් කිරීම සඳහා පවතින කාර්මික ජනපද වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට තවදුරටත් කටයුතු කර ඇත.

කාර්මික ජනපද අංශය මගින් කර්මාන්තකරුවන්ට ලබා දෙන පහසුකම්

01 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මඟින් බිම් කොටස් සහ ගොඩනැඟිලි පිළිවෙළින් වසර 30 සහ වසර 20 ක දීර්ඝ කාලීන පදනමින් තම ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ආයෝජකයින්ට ඇගයීම් කමිටුවේ අනුමැතියට යටත්ව බදු දෙනු ලැබේ.

02 යටිතල පහසුකම් ලබා දීම.

- තෙකලා විදුලිය සහ අභ්‍යන්තරව විදුලිය බෙදා හැරීමේ පද්ධතියක් පැවතීම.
- ජල සැපයුම, ජලය ගබඩා කිරීම සහ බෙදා හැරීමේ පද්ධතියක් පැවතීම.
- සන්නිවේදන සේවාවක් ලෙස ටෙලිකොම් පහසුකම් ලබාදීම.
- ප්‍රවාහන පහසුකම් සහ අභ්‍යන්තර මාර්ග සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ලබා ගත හැකි වීම. එබැවින් කාලය හා සම්පත් අපතේ නොයවා නිෂ්පාදනය වහාම ආරම්භ කළ හැකිය.

03 අනෙකුත් ආධාරක සේවා පහසුකම් පැවතීම.

කාර්මික ජනපද වල මූලික යටිතල පහසුකම් හැරුණු විට, ව්‍යාපාරික ගණුදෙනු සඳහා පහසුකම් සැලසෙන තැපැල් කාර්යාල, ආපනශාලා, පොලිස් මුරපොල ආදිය පිහිටා තිබීම.

04 අපජලය හා කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය (කාණු, මෑන්හෝල්, පොම්පාගාර ආදිය).

05 IDB කාර්මික ජනපද සඳහා අඛණ්ඩව ආරක්ෂණ සේවා සපයයි.

06 කර්මාන්තකරුවන්ට බදු දී ඇති දේපල පිළිබඳ කල්බදු අයිතිය බැංකු සමඟ තබා ගනිමින් ණය පහසුකම් සැලසීම.

07 කාර්මික ජනපදයන්හි පරිපාලන හා නඩත්තු අවශ්‍යතා සඳහා අඛණ්ඩව මැදිහත් වීම.

08 සියලුම කාර්මික ජනපද ආශ්‍රිතව පරිසර හිතකාමීව නඩත්තු කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ අවශ්‍ය අධීක්ෂණය සහ මෙහෙයවීම ලබා දීම.

09 රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත වටිනාකම් අනුව මාසික පදනමින් බදු දී ඇති කාර්මික ජනපදවල ඉඩම් කට්ටි/ගොඩනැගිලි සඳහා කර්මාන්තකරුවන්ගෙන් මාසික කුලිය සහ ආපසු ගෙවිය හැකි පදනම මත තෙවසරක ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම.

- කොන්දේසි කඩ කරන කර්මාන්තකරුවන්ට එරෙහිව පියවර ගැනීම.
- IDBහි අනෙකුත් අංශ විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික ප්‍රදර්ශන, තරඟ සහ වැඩමුළු සංවිධානය කිරීම.
- නව කාර්මික ජනපද පිහිටුවීම සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම සහ අත්පත් කර ගැනීම.


4.4.2 වෙන් කරන ලද ඉඩම් කැබැලි වල ඉතිහාසය

1965-1970 කාලය තුළ IDB විසින් පහත සඳහන් කාර්මික ජනපද තුන ආරම්භ කර ඇත.

	කාර්මික ජනපද	දිස්ත්‍රික්කය
01	ඒකල	ගම්පහ
02	පල්ලෙකැලේ	මහනුවර
03	අච්චුවේලි	යාපනය

- කළුතර දිස්ත්‍රික්කයේ හොරණ කාර්මික ජනපදය 1978 දී පිහිටුවන ලදී.
- කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල පිළිවෙලින් පන්නල සහ ලුණුවිල කාර්මික ජනපද 1980 ගණන්වල පිහිටුවන ලදී. තවද, 2022 වසරේදී II අදියර යටතේ පන්නල කාර්මික ජනපදයේ අක්කර 6.5ක සංවර්ධන කටයුතු අවසන් කර ඇත.
- "*ඉසුරු උයන කාර්මික ජනපද වැඩසටහන සහ ග්‍රාමීය කාර්මික ජනපද වැඩසටහන*" යටතේ 1990 වසරේ කොටගල, වවුළුගල, ගලිගමුව, පුස්සැල්ල, බද්දේගම, නෑගම්පහ, මිහින්තලේ, වවුනියාව, බෙලිඅත්ත සහ බුත්තල කාර්මික ජනපද පිහිටුවන ලදී.
- කොළඹ දිස්ත්‍රික්කයේ පානඵව කාර්මික ජනපදය 2006 දී පිහිටුවන ලදී. මෙම ඉඩමේ අයිතිය අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුවෙමින් පවතින අතර දැනට එය අවසන් අදියරේ පවතී.
- වසර තිහක් පුරා රටතුළ පැවති සිවිල් යුද්ධය හේතුවෙන් අච්චුවේලි කාර්මික ජනපදය සහමුලින්ම විනාශ වී තිබූ බැවින් 2013/2014 දී ඉන්දීය රජයේ සහ ශ්‍රී ලංකා රජයේ මූල්‍ය දායකත්වයෙන් සහ UNOPS ආයතනයේ අධීක්ෂණයෙන් කාර්මික ජනපදයේ ප්‍රතිසංස්කරණ හා ප්‍රතිස්ථාපන කටයුතු සඳහා පිළිවෙලින් රු. මිලියන 220ක් සහ රු. මිලියන 50ක් ලබාදී ඇත. 2014 වර්ෂයේදී අච්චුවේලි කර්මාන්තපුරය ප්‍රතිසංස්කරණය කර කර්මාන්ත කිහිපයක් සමඟ එහි ක්‍රියාකාරකම් යළි ආරම්භ කරන ලදී.
- මීට අමතරව, කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2018/2019 දී අදියර II සංවර්ධන වැඩසටහන ආරම්භ කර යටිතල පහසුකම් සංවර්ධනයට රු. මිලියන 100ක් ලබාදෙන ලදී.
- තවද, අච්චුවේලි කාර්මික ජනපදයේ II අදියර යටතේ යටිතල පහසුකම් සංවර්ධනය අවසන් කර ඇත.
- නව කාර්මික ජනපදයක් පිහිටුවීම සඳහා 2022 වර්ෂයේ දී IDB විසින් දකුණු පළාතේ 'ඇල්පිටිය සහ කඹුරුපිටිය' හඳුනාගෙන ඇත.

4.4.1 රූපය : මෙරට කාර්මික ජනපදවල පිහිටීම



4.4.1 වගුව : කාර්මික ජනපද වල පිහිටීම - (පළාත් අනුව)

කාර්මික ජනපදය	පළාත
ඒකල, හොරණ, වවුළුගල සහ පානළුව	බස්නාහිර පළාත
පල්ලෙකැලේ, කළුදැවල සහ කොටගල	මධ්‍යම පළාත
පන්නල සහ ලුණුවිල	වයඹ පළාත
ගලිගමුව සහ පුස්සැල්ලාව	සබරගමුව පළාත
නැගම්පහ සහ මිහින්තලේ	උතුරු මැද පළාත
පූන්තෝට්ටම් සහ අව්වුවේලි	උතුරු පළාත
බුත්තල	ඌව පළාත

4.4.3 අංශයේ විශේෂ කාර්යසාධන අවස්ථා

- කාර්මික සංවර්ධන මණ්ඩලය ප්‍රධාන වශයෙන් කොළඹ, තදාසන්න ප්‍රදේශ සහ ග්‍රාමීය ප්‍රදේශ කෙරෙහි සැලකිය යුතු මට්ටමකින් අවධානය යොමු කර ඇති අතර රට පුරා පිහිටි කාර්මික ජනපද 18ක් සංවර්ධනය කර ඇත. දැනට කාර්මික ජනපද 16ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අතර කාර්මික ජනපද දෙකක් එනම් බෙලිඅත්ත සහ බද්දේගම ක්‍රියාත්මක නොවේ.

- 1967 සිට සංවර්ධනය කරන ලද සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කර 305ක් පමණ වේ. එය ඉඩම් කට්ටි 733 කට බෙදා කර්මාන්තකරුවන් 377 ක් සඳහා වෙන් කර ඇත.

- කර්මාන්තකරුවන්ට බෙදා දී ඇති සංවර්ධිත බිම් කොටස් වලින් 277 ක, ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කර ඇති අතර රැකියා අවස්ථා 8595 ක් උත්පාදනය කර තිබේ. තවදුරටත් කර්මාන්ත ඒකක 48 ක් ඔවුන්ගේ කර්මාන්තශාලා ගොඩනැගිලි ඉදිකිරීමේ ක්‍රියාවලියේ විවිධ අදියරවල පවතී.

- කුඩා කාර්මික ජනපද ආශ්‍රිතව දැනට ක්‍රියාත්මක නොවන නේවාසික කටයුතු සඳහා භාවිත කරනු ලැබූ කර්මාන්ත ඒකක 23 ක් අහෝසි කිරීමට පියවර ගෙන ඇත.

- කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සාදා නිම කළ ගොඩනැගිලි 80ක් කර්මාන්ත 60ක් සඳහා වෙන් කර ඇත.

- අච්චුවේලි කාර්මික ජනපදයේ අක්කර 16ක භූමි ප්‍රමාණයක දැනට පවතින යටිතල පහසුකම් නවීකරණය හා වැඩිදියුණු කිරීම සහ තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ රේඛීය අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරයෙන් ලබාගත් රු. මිලියන 25කට ආසන්න මුදලක් කාර්මික ජනපද අංශය විසින් වැය කර ඇත.

- නව ඉඩම් කැබැලි/සාදා නිම කළ ගොඩනැඟිලි අපේක්ෂාවෙන් අයැදුම්පත් යොමුකළ දැනට පදිංචිව සිටින කර්මාන්තකරුවන් සහ නව ආයෝජකයින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලද අතර, ශක්‍යතාව සලකා බලා ඒ අතරින් කර්මාන්තකරුවන් 33 දෙනෙකු 2022 වර්ෂය සඳහා හඳුනා ගන්නා ලදී.

4.4.1 වගුව : 2022 වර්ෂය තුළ පිහිටුවන ලද කර්මාන්ත

කාර්මික ජනපදය	ඉඩම් කට්ටි / ගොඩනැගිලි වෙන් කරදීම්	අලුතින් ආරම්භ කරන ලද කර්මාන්ත	
		කර්මාන්ත	රැකියා
කොටගල	2	1	10
ඒකල	2	2	75
වවුළුගල	1	1	23
පල්ලෙකැලේ	2	2	36
ලුණුවිල	2	2	25
පූන්තෝට්ටම්			
පානළුව	1	1	12
කළුදැවල	3	2	27
එකතුව	**13**	**11**	**208**

4.4.2 වගුව : 2022 වර්ෂයේ දී සංවර්ධනය කරන ලද පවතින කර්මාන්ත

කාර්මික ජනපද	සංවර්ධනය කරන ලද පවතින කර්මාන්ත	
	කර්මාන්ත	උත්පාදනය වූ අමතර රැකියා
කොටගල	1	32
ඒකල	1	18
වවුළුගල	1	14
පල්ලෙකැලේ	2	39
හොරණ	1	25
පානළුව	1	12
කළුදැවල	1	8
එකතුව	8	148

- 2022 වර්ෂයේ දී කර්මාන්තකරුවන් සමඟ ඉඩම්/ සාදා නිම කළ ගොඩනැගිලි සඳහා බදු ගිවිසුම් 20 ක් අත්සන් කළ අතර එමඟින් රු.172,481/- ක ආදායමක් උපයා ගැනීමට හැකි විය.

- අසාර්ථක තත්ත්වයේ පසු වූ කාර්මික ජනපද 16 ක් 2022 වර්ෂය තුළ අත්පත් කරගෙන ඇති අතර ඒවා නව කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සුදුසු ආයෝජකයින් වෙත ලබාදී ඇත.

- කර්මාන්තකරුවන්ට බදු දී ඇති දේපල පිළිබඳ කල්බදු අයිතිය තබා ගනිමින් මූල්‍ය ආයතනවලින් ණය පහසුකම් ලබා ගැනීම සඳහා කර්මාන්තකරුවන් 7 දෙනෙකුට සහය වී ඇත.

- බදු දී ඇති ඉඩම් සහ ගොඩනැගිලි සඳහා 2022 වර්ෂය තුළ එකතු කරන ලද මාසික/වාර්ෂික බදුකුලිය, ජල ගාස්තු, ඉඩම් අගය කිරීමේ ගාස්තු (මාරු කිරීම) සහ හිඟ මුදල් ආදායම රු.මිලියන 91.3කි. එකතු කිරීම් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන චක්‍රීය අරමුදල, බදු ගැනුම්කරුවන්ගෙන් වසර තුනක ආපසු ගෙවිය හැකි තැන්පතු ලෙස අයකර ගනු ලැබේ. එබැවින් 2022 වර්ෂය අවසානයේදී චක්‍රීය අරමුදලේ සමුච්චිත අගය රු.මිලියන 10.83 කි.




4.4.1 පින්තූරය:
ඒකල කාර්මික ජනපදය

4.4.4 අංශයේ ප්‍රගති සාරාංශය

4.4.3 වගුව: කාර්මික ජනපද වලින් ආදායම් එකතු කිරීම

අංකය	ක්‍රියාකාරකම	සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.)
1	උපයාගත් ආදායම - බදු කුලිය	52,315,924
2	උපයාගත් ආදායම - ජල ගාස්තු	1,915,676
3	උපයාගත් ආදායම - බදු ගිවිසුම් අත්සන් කිරීම	172,481
4	ඉඩම් අගය කිරීමේ ගාස්තු (මාරු කිරීම)	2,323,106
5	හිඟ මුදල් සහ අනෙකුත් අය කිරීම්	34,625,120
6	උපයාගත් ආදායම - කාර්මික ජනපද නඩත්තු කිරීම සඳහා චක්‍රීය අරමුදල ස්ථාපිත කිරීම	10,838,896
මුලු එකතුව		**102,191,202**



කාර්මික ජනපද අංශයේ ආදායම් ව්‍යාප්තිය සලකා බැලීමේදී, බදු කුලිය හරහා උපයාගත් ආදායම, අංශයේ සමස්ත ඉපැයීම් සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයයි. ප්‍රධාන වශයෙන් කාර්මික ජනපද අංශය ස්ථාපිත කර ඇත්තේ ව්‍යවසායකයින්ට තනා නිම කළ කර්මාන්ත ශාලා ගොඩනැගිලි ඇතුළු මූලික යටිතල පහසුකම් ලබා දෙමින් කර්මාන්ත ආරම්භ කිරීමට දිරිගැන්වීම සඳහා ය. ග්‍රාමීය අංශයේ කර්මාන්ත පිහිටුවීමේ දී ඇති ප්‍රධාන බාධාවක් වන්නේ කර්මාන්ත පිහිටුවීමට සුදුසු ස්ථාන සොයා ගැනීමේ දුෂ්කරතා ය. කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා පහසුකම් සැලසීම පිණිස රට පුරා කාර්මික ජනපද පිහිටුවා ඇත.

4.4.4 වගුව: 2022.12.31 දිනට IDB කාර්මික ජනපද වල යටිතල පහසුකම් නවීකරණය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති වාර්තාව

අයවැය ප්‍රතිපාදන 2022	ක්‍රියාකාරකම	ඇස්තමේන්තුගත පිරිවැය (රු.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය 2022.12.31	
			ඉල්ලුම් කරන ලද 20% මුදල (රු.)	ඉල්ලුම් කරන ලද පළමු කොටස් ගෙවීම (රු.)	ලැබුණු ප්‍රමාණය (රු.)	භෞතික (%)	භෞතික (වචනයෙන්)
	ක්‍රියාත්මක වෙමින් පවත්නා ව්‍යාපෘති - 2021						
රු. මිලියන 25	**1** **ඒකල සහ පල්ලෙකැලේ**						
	ජල මෝටර් පොම්ප 02 ක්, ගිල්විය හැකි ජල පොම්පයක් ස්ථාපිත කිරීම, ජල නල එලීම, රැහැන්ගත කිරීම, ප්‍රධාන පුවරු සහ අදාළ උපාංග සවි කිරීම. (අවසන් ගෙවීම)	1,500,000	-	-	1,411,644.02	-	සම්පූර්ණ කර ඇත.
	නව ව්‍යාපෘති - 2022						
	(01) **ඒකල**						
	හානි වී ඇති මායිම් තාප්පයේ ඉතිරි ඉදිකිරීම් සිදුකිරීම.	9,800,000	1,689,217.20	4,968,087.40	486,000.00	70	ඉදිකිරීම් සිදුවෙමින් පවති. රේඛීය අමාත්‍යාංශයෙන් 20% සේවයේ යෙදවීමේ අත්තිකාරම් (Mobilization advance) සහ පළමු කොටස් ගෙවීම ඉල්ලා ඇත.
	(02) **පන්නල**						
	කාණු සහිත අභ්‍යන්තර මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සහ කර්මාන්ත වලට ජලය බෙදා හැරීම සඳහා නල එලීම.	6,700,000	1,733,688.00	5,030,981.19	-	75	ඉදිකිරීම් සිදුවෙමින් පවති. රේඛීය අමාත්‍යාංශයෙන් 20% සේවයේ යෙදවීමේ අත්තිකාරම් (Mobilization advance) සහ පළමු කොටස් ගෙවීම ඉල්ලා ඇත.
	(03) **කොටගල**						
	ගිල්විය හැකි ජල පොම්පයක් ස්ථාපිත කිරීම, ජල නල එලීම, රැහැන්ගත කිරීම, ප්‍රධාන පුවරු සහ අදාළ උපාංග සවි කිරීම.	3,000,000	-	1,700,000.00	-	100	රු. මිලියන 1.7 ක් රේඛීය අමාත්‍යාංශයෙන් (සම්පූර්ණ ගෙවීම) ඉල්ලා ඇත.
	(04) **ගලිගමුව**						
	බාධකයක් සහිත ආරක්ෂක කුටිය, පොම්පාගාරය සහ කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම.	4,000,000	-	-	-	-	2023 අයවැය ප්‍රතිපාදන තුළ මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.
	එකතුව	**25,000,000**	**3,422,905.20**	**11,699,068.59**	**1,897,644.02**	-	

4.5 අලෙවි අංශය

4.5.1 හැඳින්වීම

අලෙවි අංශය විසින් ප්‍රධාන වශයෙන් MSME අංශයට සහ අනාගත ව්‍යවසායකයින්ට වාණිජමය වශයෙන් ශක්‍ය ව්‍යවසායන් දක්වා වර්ධනය වීම සඳහා සේවා සපයයි. අලෙවි අංශය යනු දිවයින පුරා සිටින කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සහ ස්වයං රැකියා නියුක්තිකයන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අලෙවි කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ ක්‍රියාකාරකම් ඇතුළත් වන IDB හි ගතික බලවේගයයි. තවද, දේශීය කර්මාන්තවලට විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහ අනාගත ව්‍යවසායකයින්ට තම ව්‍යවසායන් වාණිජමය වශයෙන් වඩාත් ශක්‍ය ආයතන බවට වර්ධනය කිරීමට සහාය වන අතරම IDB විසින් සපයනු ලබන සේවාවන් ප්‍රවර්ධනය කිරීමේ වගකීම ද ඔවුන් වෙත පැවරී ඇත. අවසාන පාරිභෝගිකයා පූර්ණ තෘප්තියට පත්කරවන දිගුකාලීන අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළඳ සබඳතා ගොඩනඟා ගනිමින් එය සේවය සලසයි. තවද, දිගු කාලීන ව්‍යාපාරික සබඳතා තුළින් අදාළ නිෂ්පාදන සඳහා සන්නාම ප්‍රතිරූපය ගොඩනඟන අතරම විභව වෙළෙඳපොළ සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීමට සහය වීමේ වගකීම ද අංශය සතු වේ.

4.5.2 අංශයට පැවරී ඇති ක්‍රියාකාරකම්

- කර්මාන්ත ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පැවැත්වීම, ජාතික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම.

- දිවයින පුරා සිටින තෝරාගත් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් / කර්මාන්තකරුවන් මෙන්ම ස්වයං රැකියාලාභීන් සඳහා ජාතික සම්මාන උළෙල සංවිධානය කිරීම. එමෙන්ම කර්මාන්තකරුවන් දිරිමත් කිරීම සඳහා ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් අංශ අනුව තරඟ පැවැත්වීම.

- "ලක්කම්" අලෙවි මධ්‍යස්ථානයේ විකුණුම් පහසුකම් සැපයීම. ප්‍රධාන වශයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින්ගේ අලෙවි කළ හැකි නිෂ්පාදන හඳුනාගෙන ප්‍රවර්ධනය කිරීම සහ ඒවා දැරිය හැකි මිලකට එකම ස්ථානයක දී අලෙවි කිරීමට අවස්ථාව සලසා දීම "ලක්කම්" අලෙවි මධ්‍යස්ථානයෙන් සිදු කෙරේ.

- උප කොන්ත්‍රාත් හුවමාරුව සඳහා පහසුකම් සැලසීම. එයින් අදහස් වන්නේ, රජයේ ආයතනවලින් ඇණවුම් ලබා ගැනීම සඳහා කර්මාන්තකරුවන් / සේවා සපයන්නන් වෙනුවෙන් IDB විසින් ලංසු තැබීම සහ එම ඇණවුම් කර්මාන්තකරුවන් අතර බෙදා හැරීම වේ.

- රාජ්‍ය ආයතන විසින් ජනනය කෙරෙන ෙඅරස් සහ ෙඅරස් නොවන අබලි ද්‍රව්‍ය එකතු කර බෙදා හැරීමට සහ වාත්තු, ලුහු ඉංජිනේරු, කම්මල්කරුවන් සහ අනෙකුත් ලෝහ වාත්තු සහ අත්කම් කර්මාන්තවල නියැලී සිටින කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලෙස භාවිතා කිරීම සඳහා සහනදායී මිල ගණන් යටතේ අබලි ද්‍රව්‍ය බෙදා හැරීම.

- කර්මාන්ත / MSMEs ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශන සේවා සැපයීම. තවද, ඉල්ලීම මත නව වෙළඳපල හඳුනා ගැනීමට සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, වෙළඳ නාමකරණය, ඇසුරුම්කරණය සහ වෙළඳපල තොරතුරු වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු සහ උපදේශන වැඩසටහන් පැවැත්වීම.

- වෙළඳපල සමීක්ෂණ පැවැත්වීම සහ වෙළඳපල සමීක්ෂණ පැවැත්වීම පහසු කිරීම සඳහා වාර්තා ලිවීම සහ හඳුනාගත් ශක්‍ය නිෂ්පාදන පිළිබඳ වෙළඳපල ශක්‍යතා වාර්තා සකස් කිරීම.

- ජාත්‍යන්තර ප්‍රදර්ශන, වෙළඳ ප්‍රදර්ශන, සංසද සහ රැස්වීම් වල වෙළඳපල අධ්‍යයන චාරිකා වලට සහභාගී වීම සඳහා අපනයන අභිමුඛ SMEs සඳහා වෙළඳපල අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම.

4.5.3 අංශයේ විශේෂ කාර්යසාධන අවස්ථා

- **අබලි ව්‍යාපෘතිය**

අලෙවිකරණ අංශය විසින් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් එකඟ වූ මිල ගණන් යටතේ රාජ්‍ය ආයතනවලින් ෆෙරස්, ෆෙරස් නොවන සහ ඒ ආශ්‍රිත අනෙකුත් අබලි ද්‍රව්‍ය මිලදී ගනී. මෙම අයිතම IDB හි ලියාපදිංචි වී ඇති ලුහු ඉංජිනේරු කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලෙස විකුණනු ලැබේ. වෙනත් වචන වලින් කිවහොත්, අබලි ව්‍යාපෘතිය යටතේ, ෆෙරස්, ෆෙරස් නොවන සහ ඒ ආශ්‍රිත අනෙකුත් අබලි ද්‍රව්‍ය රාජ්‍ය ආයතනවලින් මිල දී ගෙන, නිලධාරීන් මණ්ඩලයක් විසින් පාලනය කරන සහන මිල ගණන් යටතේ ඒවා විශේෂයෙන්ම IDB හි ලියාපදිංචි වූ ලුහු ඉංජිනේරු අංශයේ කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලෙස බෙදා හරිනු ලැබේ. ලෝහ වාත්තු කර්මාන්තයේ නියැලී සිටින බොහෝ දේශීය කර්මාන්ත වලට ඔවුන්ගේ නිෂ්පාදන වෙළඳපොල තුළ වඩාත් තරඟකාරී තත්ත්වයකට පත් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලැබේ.



මුළු විකුණුම්	-	රු. 323,397,486
පහසුකම් සපයන කර්මාන්ත සංඛ්‍යාව	-	කර්මාන්ත 400
බෙදා හරින ලද අමුද්‍රව්‍ය ප්‍රමාණය	-	මෙ. ටොන් 1,160.5
බෙදා හරින ලද ට්‍රාන්ස්ෆෝමර් සංඛ්‍යාව	-	451

- **ලක්කම් අලෙවි මධ්‍යස්ථානය**

ලක්කම් අලෙවි මධ්‍යස්ථානය ඵලදායීත්වය නගාසිටුවීමේ අරමුණ ඇතිව ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සපයා දෙන අතර ම, දිවයින පුරා විසිරී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ (SMIs) සහ ස්වයං සේවකයන්ගේ (SEs) නිෂ්පාදන අලෙවි කිරීම ප්‍රවර්ධනය කරයි. මෙම මධ්‍යස්ථානය කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහ තනි ව්‍යවසායකයින්ට ඔවුන්ගේ අලෙවි කළ හැකි නිෂ්පාදන තරඟකාරී මිල ගණන් යටතේ අලෙවි කිරීම සඳහා විකුණුම් වේදිකාවක් සපයන අතරම ඒ සඳහා අවශ්‍ය සේවාවන් සපයයි. මෙමඟින් කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන වල ඵලදායිතාව ඉහළ නැංවීම සහ දීප ව්‍යාප්තව විකුණුම් සඳහා අවශ්‍ය වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රදර්ශණ සහ විකුණුම් පහසුකම් සපයයි. තවද "ලක්කම් ලාංඡනය" යටතේ එක් එක් නිෂ්පාදකයන්ගේ දේශීය නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලද අතර ඒවා දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළෙඳ පොළ තුළ අලෙවි කිරීමට පහසුකම් සලසා ඇත.

මුළු විකුණුම්	-	රු. 33,306,484.22
නව කර්මාන්ත සඳහා ලබා දී ඇති වෙළඳපල අවස්ථා ගණන	-	කර්මාන්ත 26

- **උප කොන්ත්‍රාත් ඒකකය**

1982 සිට ලෝක බැංකුව විසින් රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල සම්බන්ධීකරණයෙන්, අලෙවි අංශයේ උප-කොන්ත්‍රාත් හුවමාරුව (SCX) වෙත අරමුදල් සපයනු ලැබේ. මෙහිදී IDB විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සැපයීම සහ කර්මාන්තකරුගේ / සේවා සපයන්නන් වෙනුවෙන් ලංසු තැබීමට සම්බන්ධ වේ. ලී බඩු, වානේ, කාර්යාල පුටු සහ සෝෆා, ලෙදර් සපත්තු, සෙරෙප්පු සහ බෑග්, රබර් ආශ්‍රිත අමතර කොටස්, ටී ෂර්ට්, කැප්, තොප්පි, පාසල් බෑග්, ලිපි ද්‍රව්‍ය, ඇලුමිනියම් දොරවල්, නාමපුවරු, කාර්යාල වෙන්කිරීම් ආදිය රාජ්‍ය ආයතනවලින් ලැබෙන ඇණවුම් වලින් කිහිපයකි.

මුළු විකුණුම්	-	රු. 2,312,804
පහසුකම් සපයන ලද කර්මාන්ත සංඛ්‍යාව	-	02

- **ප්‍රදර්ශන**

දිවයිනේ වඩාත්ම කැපී පෙනෙන ව්‍යවසායකයින් හඳුනා ගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින් (MSMEs) සඳහා MSME කාණ්ඩය යටතේ ප්‍රදර්ශන සංවිධානය කරයි. තවද, කාර්මික සන්දර්භය තුළ වඩ වඩාත් තරඟකාරී රැකියා අවස්ථා ආරම්භ කිරීමට මෙම ප්‍රදර්ශන මඟින් පහසුකම් සැලසේ.

ජාතික මට්ටමේ කාර්මික ප්‍රදර්ශනය - "කර්මාන්ත - 2022"

මෙම කර්මාන්ත ප්‍රදර්ශනය මෙරට දැවැන්ත කාර්මික ප්‍රබෝධයකට අඩිතාලම දැමීම සඳහා ආරම්භ කළ ජාතික වැඩසටහනේ තවත් සාර්ථක පියවරකි. කර්මාන්ත අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද “කර්මාන්ත -2022” කාර්මික ප්‍රදර්ශනය දිවයිනේ ප්‍රමුඛතම කර්මාන්ත 20ක් නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටි 300කින් සමන්විත විය.





මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

2022 ජාතික කාර්මික ප්‍රදර්ශනයට සමගාමීව ප්‍රථම වතාවට ජාත්‍යන්තර තලයේ දේශීය වාහන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන තිබූ බැවින් මෙම අවස්ථාව ඉතා වැදගත් වූ අතර, ශ්‍රී ලංකාවේ වාහන නිෂ්පාදකයින් සහ එකලස් කරන්නන් විසින් දේශීයව නිපදවන රථ පෙළපාලියක් බෞද්ධාලෝක මාවතේ දී ඉදිරිපත් කරන ලදී.



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර, ඉන්දියාව, බංගලාදේශය සහ මැලේසියාව යන රටවල මහ කොමසාරිස්වරුන්, ඉන්දුනීසියාව සහ වියට්නාමයේ තානාපතිවරුන්, පකිස්ථානයේ නියෝජ්‍ය මහ කොමසාරිස්, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) දයා රත්නායක, කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති උපසේන දිසානායක, සහ නිලධාරීන් සහ කර්මාන්තකරුවන් රැසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.


- **විශේෂ ක්‍රියාකාරකම්**

ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය සහ කර්මාන්තකරුවන් සමඟ ෆෙරුල් සහ කප්ලිං (Ferrule & Couplings) සෑදීම සඳහා ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් සම්බන්ධ වන රැස්වීම් පැවැත්වීම.

මේ අතර, රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය ලෝහමය ද්‍රව්‍ය සහ උපාංග සම්බන්ධයෙන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්තකරුවන් සහ ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ නිලධාරීන් සමඟ ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘතියක් පිළිබඳ සාකච්ඡාවක් පැවැත්විණි. මෙම සාකච්ඡාවේදී අවශ්‍ය උපාංග හඳුනාගැනීමේ ක්‍රමවේදය සහ එම භාණ්ඩ නිෂ්පාදනය හා බෙදා හැරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳව අදාළ ආයතනය දැනුවත් කරන ලදී.


4.5.1 වගුව: අංශයේ ප්‍රගති සාරාංශය

අංකය	ක්‍රියාකාරකම	සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.)
(1)	කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීම.	266,178,999
(2)	උප කොන්ත්‍රාත් පහසුකම් සැපයීම.	2,312,804
(3)	"ලක්කම්" ප්‍රදර්ශන කුටිය හරහා වෙළඳපල අවස්ථා ලබා දීම.	22,333,889
(4)	ශ්‍රී ලංකා කාර්මික ප්‍රදර්ශනය හරහා ජාත්‍යන්තර සහ දේශීය වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමට කර්මාන්තකරුවන්ට සහාය වීම.	71,132,821
එකතුව		**361,958,513**



4.5.2 වගුව : සත්‍ය ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම

වර්ෂය	තත්‍ය ආදායම (රු.මි.)
2019	281.1
2020	259.6
2021	272.3
2022	361.9



දේශීය කර්මාන්තකරුවන්ගේ කර්මාන්ත වාණිජමය වශයෙන් ශක්‍ය ආයතන බවට පුළුල් කර ගැනීම සඳහා අවශ්‍ය සේවා ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදුකිරීමේ සහ සහාය සැපයීමේ බලය කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයට පැවරී ඇත. තවද, අලෙවිකරණ ක්‍රමෝපාය ස්ථාපිත කිරීම මඟින් කර්මාන්ත හෝ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශන සේවා සපයයි. සමුච්චිත මූල්‍ය ප්‍රගතිය වාර්ෂිකව සංසන්දනය කිරීමේදී, 2020 සිට 2022 වසර දක්වා ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරයි. සංසන්දනාත්මකව ගත් කළ, 2022 වර්ෂයේදී වාර්ෂික ආදායමෙන් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් ජනනය කර ඇත්තේ වාත්තු, ලුහු ඉංජිනේරු, කම්මල් සහ අනෙකුත් ලෝහ වාත්තු සහ අත්කම් කර්මාන්තවල නිරත කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන් යටතේ අමුද්‍රව්‍ය / අබලි ද්‍රව්‍ය ලබා දීමෙනි. 2020 වසරේ කොවිඩ් වෛරසය පැතිරී යාම මෙම වර්ධන අවධියේදී ඔවුන් මුහුණ දුන් දැඩි පහරක් විය. වසංගත කාලපරිච්ඡේදය තුළ ආදායම පහත වැටුන ද, අඩුපාඩු මහහරවාගෙන වාර්ෂික ප්‍රගතිය ධනාත්මක දිශානතියක් කරා නංවාලීම සඳහා අංශය විසින් ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කර ඇත. 2022 වසර සලකා බැලීමේ දී, ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කර්මාන්ත අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වෙමින් කර්මාන්ත ප්‍රදර්ශනයක් සහ සම්මාන ප්‍රදානෝත්සවයක් සංවිධානය කර ඇත. මෙම අවස්ථාව ඉතා සාර්ථක කර ගැනීම සඳහා IDB හි සියලුම අංශ සහ ප්‍රාදේශීය කාර්යාල ඔවුන්ගේ ප්‍රශස්ත මට්ටමින් දායක වී ඇත. ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ අංශය ලෙස අලෙවිකරණ අංශය විසින්, යන්ත්‍රෝපකරණ, තාක්ෂණය, අමුද්‍රව්‍ය සහ ව්‍යාපාර සංවර්ධන සේවාවන්හි නවෝත්පාදන සහ දේශීය කර්මාන්තයේ විශිෂ්ටත්වය දේශීය/ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රදර්ශනයේදී වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත. දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ප්‍රදර්ශන සංවිධානය කිරීම තුළින් අලෙවි අංශය සැලකිය යුතු ආදායමක් ලගා කරගෙන ඇති අතර එමඟින් කර්මාන්තකරුවන්ට අනාගත ගනුදෙනුකරුවන් වෙත ළඟාවීමට, ඔවුන් ආකර්ෂණය කර ගැනීමට සහ ඔවුන් සමඟ එක්ව කටයුතු කිරීමට අවස්ථාව සපයා දෙනු ලබයි. තවද කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් බාහිර සංවිධාන විසින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන සඳහා සහභාගී වීමටත් ඔවුන් සමඟ දිගුකාලීන සබඳතා ගොඩනඟා ගැනීමටත් අලෙවි අංශය කටයුතු කරනු ලබයි. ජාතික සහ ජාත්‍යන්තර සහභාගිවන්නන් සමඟ ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් සම්බන්ධ වන රැස්වීම් හැසිරවීම, කර්මාන්තකරුවන් දිරිමත් කිරීම සඳහා ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් ක්ෂේත්‍ර වශයෙන් තරඟ සහ ව්‍යාපාර පැවැත්වීම වසර පුරා සිදු කරන ලද අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් වන අතර අංශයේ වාර්ෂික කාර්ය සාධනය සඳහා එමඟින් සැලකිය යුතු දායකත්වයක් ලැබී ඇත.

4.6 සැලසුම් අංශය

4.6.1 හැඳින්වීම

ලෝක ආර්ථිකය වේගවත්ව වෙනස් වීම හා ව්‍යාපාර සංවර්ධන සේවාවන්හි තරඟකාරිත්වය හේතුවෙන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට වඩාත් ප්‍රබල ලෙස සේවය කිරීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් උපාය මාර්ග ප්‍රතිසැලසුම් කිරීමේ සහ ප්‍රතිනිර්වචනය කිරීමේ අභියෝගාත්මක කාර්යයන් සැලසුම් අංශය වෙත පැවරී ඇත.

අංශය සඳහා පැවරී ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ, IDB හි ක්‍රියාකාරී අංශ මගින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පරීක්ෂා කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අමාත්‍යාංශයේ දැනගැනීම සඳහා වරින් වර ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමයි. තවද, ආයතනික උපායමාර්ගික සැලැස්ම සැලසුම් කිරීම සහ සකස් කිරීම සහ භෞතික හා මූල්‍ය ඉලක්ක අනුව අංශවල ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයකි. සමාලෝචිත වර්ෂය තුළ එම වගකීම් අඛණ්ඩව ඉටු කරන ලදී. මීට අමතරව, රේඛීය අමාත්‍යාංශයේ අවශ්‍යතා අනුව, මණ්ඩලයේ කාර්ය සාධන ඇගයීම්වලට අදාළ තොරතුරු වරින් වර ලබා දෙන ලදී.

4.6.2 2022 වර්ෂය තුළ සිදු කරන ලද අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

1) බාහිර අරමුදල් (විදේශීය සහ දේශීය) සඳහා ව්‍යාපෘති යෝජනා / අයවැය යෝජනා සකස් කර ඉදිරිපත් කිරීම

2022 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා පහත දැක්වේ.

- ජා-ඇළ ඒකල IDB කාර්මික ජනපදයේ නිෂ්පාදන කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා නියමු ව්‍යාපෘතිය - 2022/2023 (IDB – USAID).

- ශ්‍රී ලංකාවේ කර්මාන්තවල දේශගුණික ප්‍රතිචාරය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය
(එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය)

2) IDB සඳහා 2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

නියමිත කාල සීමාවක් තුළ එක් එක් අංශය විසින් සම්පූර්ණ කළ යුතු ක්‍රියාකාරකම් ඇතුළත්ව ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂිකව සකස් කෙරේ. නව කර්මාන්ත (ආරම්භක) පිහිටුවීම, පවතින කර්මාන්ත සඳහා ව්‍යාපාර වැඩිදියුණු කිරීමේ වැඩසටහන්, ක්ෂුද්‍ර කර්මාන්ත ආරම්භ කිරීම / වැඩිදියුණු කිරීම, වෙළඳපල ප්‍රවේශය සහ වෙනත් සේවා, විශේෂ වැඩසටහන් සහ ආදායම් උත්පාදන සේවා ලෙස එක් එක් අංශයේ ඉලක්ක සහ ක්‍රියාකාරකම් කොටස් හයක් යටතේ වර්ගීකරණය කර ඇත.

3) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ මාසික, කාර්තුමය සහ වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කිරීම

ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව, එක් එක් අංශය විසින් අත්පත් කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මාසිකව, කාර්තුමය වශයෙන් සහ වාර්ෂිකව අධීක්ෂණය කර ඇගයීමට ලක් කෙරේ. මණ්ඩලයේ සමස්ත ප්‍රගතිය මූල්‍ය හා භෞතික වශයෙන් තක්සේරු කෙරේ.

4) මාසික/කාර්තුමය/වාර්ෂික ප්‍රාග්ධන අයවැය සහ සංවර්ධන අයවැය ප්‍රගති වාර්තා සකස් කිරීම

ඉදිකිරීම්, ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම සහ සංවර්ධන කටයුතු වැනි ප්‍රාග්ධන ආයෝජන සඳහා අරමුදල් වෙන් කිරීම ප්‍රාග්ධන අයවැයෙන් සිදුකෙරේ. මෙය කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආයෝජනය කිරීමක්, සංවර්ධනය කිරීමක් හෝ ප්‍රධාන මිලදී ගැනීමක් සඳහා සමස්ත මූල්‍ය ඉල්ලීම් ගෙනහැර දක්වන දිගුකාලීන සැලැස්මකි.

දිගුකාලීන ප්‍රයත්නයන් සමස්තයක් ලෙස ආයතනයට ලාභදායී වේද යන්න විශ්ලේෂණය කිරීම සඳහා මූල්‍ය අංශයේ මගපෙන්වීම ඇතිව මෙය සකස් කෙරේ.

5) සංකල්ප පත්‍රිකා/ සමීක්ෂණ වාර්තා යනාදිය සකස් කිරීම.

- 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත සංශෝධනය කිරීම / නැවත කෙටුම්පත් කිරීම සහ බලගැන්වීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම පිළිබඳ සංකල්ප පත්‍රිකාව.
- දේශීය කාර්මික අංශය සඳහා වෙළඳපල ප්‍රවේශය උත්පාදනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය.
- ජාතික උපාය මාර්ගික සැලැස්මක් සකස් කරමින් දේශීය ඖෂධ නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම සහ දිරිගැන්වීම.
- මූල්‍ය ආධාර අවශ්‍ය SMEs සඳහා නව ප්‍රවේශයක් හඳුන්වාදීම පිළිබඳ වාර්තාව.
- මොරටුවේ ගෘහ භාණ්ඩ නිෂ්පාදකයන් සඳහා විශේෂ නිර්දේශ සහිතව දැව ආශ්‍රිත කර්මාන්ත සඳහා උප කොන්ත්‍රාත් පහසුකම් සැපයීම.
- ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා අන්තර් අමාත්‍යාංශ කමිටුවක් පත් කිරීම මඟින් දේශීය පොල්තෙල් කර්මාන්තය සහ සමස්තයක් ලෙස පොල් ආශ්‍රිත කර්මාන්ත පද්ධතිය සහ පොල්තෙල් සන්නාමය ආරක්ෂා කිරීම සඳහා බහුවිධ ක්‍රියාමාර්ග ගැනීම.
- SME දත්ත සමුදායක් සංවර්ධනය කිරීම.

6) වාර්ෂික වාර්තාව සකස් කිරීම (2021)

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම, ආයතනික ඉතිහාසය පිළිබඳ තොරතුරු සැපයීමට සහ මණ්ඩලයේ එක් එක් අංශවල භෞතික ප්‍රගතිය සාරාංශ කිරීමට වාර්ෂික වාර්තාවක් සකස් කෙරේ. කළමනාකරණ සමාලෝචන, ආංශීය ප්‍රගතිය, මූල්‍ය කාර්ය සාධනය සහ පසුගිය වසරේ අනෙකුත් ප්‍රධාන ජයග්‍රහණ ඇතුළු අංශ කිහිපයකින් වාර්ෂික වාර්තාව සමන්විත වේ. පසුගිය වසරේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමේ අරමුණින් අවුරුදු පතා වාර්ෂික වාර්තා සකස්කරනු ලැබේ.

7) මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එක් එක් අංශයේ දායකත්වය ඇගයීම සඳහා අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් මාසිකව සහ වාර්ෂිකව ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කරනු ලැබේ.

8) මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් වලින් අනතුරුව වාර්ෂික අධීක්ෂණ සහ ඇගයීම් වාර්තාව සකස් කිරීම

9) IDB සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම

ප්‍රසම්පාදන සැලැස්ම යනු යම් කාල සීමාවක් තුළ ප්‍රසම්පාදනය කිරීමට බලාපොරොත්තු වන සෑම අංශයකම අවශ්‍යතා ලැයිස්තුගත කර ඇති වාර්ෂික ලේඛනයකි. තොරතුරු මත පදනම්ව ප්‍රසම්පාදන ලේඛනය සකස් කර ඇති අතර, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සහ අවශ්‍යතාවය සපුරාලීම දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ එක් එක් පියවර සිදු කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය, මූල්‍ය ප්‍රභවයන් සහ ප්‍රසම්පාදන ක්‍රමය සඳහන් කෙරේ.

10) ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන - 2022 සඳහා සැලසුම් අංශය CEDACS සහ RDD සමඟ එක්ව කටයුතු කිරීම. මෙම අවස්ථාවේදී ඉටු කරන ලද රාජකාරි පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

- ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන – 2022 සංවිධානය කරනුයේ රට පුරා විසිරී සිටින විශිෂ්ඨ කර්මාන්තකරුවන් හඳුනාගැනීමට සහ ප්‍රදර්ශන සංවිධානය කිරීම හා ඒවාට සහභාගි වීමට අවස්ථාව ලබාදීම මඟින් ඔවුන්ට සහාය වීම වෙනුවෙනි. අනෙක් අතට, කර්මාන්ත තවදුරටත් වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම සඳහා IDB විසින් මාර්ගෝපදේශ සැපයීම සිදුකරනු ලබයි. වැඩසටහනේ ප්‍රධාන අරමුණු වූයේ,
  - තෝරාගත් කර්මාන්ත අංශ 20ක් ඔස්සේ රට පුරා විසිරී සිටින විශිෂ්ට කර්මාන්තකරුවන් සොයා ඔවුන් ඇගයීමට ලක් කිරීම සහ සම්මාන පිරිනැමීම.
  - මෙරට අගනුවර පැවැත්වෙන සුප්‍රසිද්ධ ප්‍රදර්ශන සඳහා පළාත් ජයග්‍රාහකයින්ට සහභාගී වීමට අවස්ථාව සලසා දෙමින් විකුණුම් ප්‍රවර්ධන කටයුතු සඳහා කර්මාන්තකරුවන්ට සහාය වීම.
  - ව්‍යාපාර වැඩිදියුණු කිරීම් සහ පුළුල් කිරීම් සඳහා කර්මාන්තකරුවන් හට මාර්ගෝපදේශ සැපයීම.
- රට පුරා විසිරී සිටින කර්මාන්තකරුවන් විවිධ නිෂ්පාදන ක්ෂේත්‍ර 20ක් යටතේ තෝරාගෙන ඒවා ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්ත ලෙස වෙන් කිරීම.
- බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවති ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව හොඳම කර්මාන්තකරුවන් තේරීමේ තරඟය සංවිධානය කිරීම.

- පුවත්පත්, සමාජ ශාලා, අන්තර්ජාලය සහ විවිධ දැනුවත් කිරීමේ ක්‍රියා පටිපාටි හරහා තරඟය පිළිබඳව

අංකය.	කර්මාන්ත ක්ෂේත්‍රය
01	ඇසුරුම්කරණය සහ කඩදාසි ආශ්‍රිත කර්මාන්ත
02	සැකසූ ආහාර සහ සහල් ආශ්‍රිත කර්මාන්ත
03	කුළුබඩු ආශ්‍රිත කර්මාන්ත
04	කොහු හා කෙඳි ආශ්‍රිත කර්මාන්ත
05	අගය එකතු කළ තේ සහ බීම ආශ්‍රිත කර්මාන්ත
06	පාවහන්, සම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
07	රබර්, ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත කර්මාන්ත
08	ලෝහ, ඩයි සහ අච්චු යන්ත්‍රෝපකරණ මෙවලම් සහ අනුබද්ධ කර්මාන්ත
09	දැව, දැව ආශ්‍රිත කර්මාන්ත සහ ගෘහ භාණ්ඩ කර්මාන්ත
10	වාහන එකලස් කිරීම සහ වාහන ආශ්‍රිත කර්මාන්ත
11	විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ සහ ඒ ආශ්‍රිත කර්මාන්ත
12	බටහිර, දේශීය ඖෂධ සහ ඒ ආශ්‍රිත කර්මාන්ත
13	කළුගල්, උළු, මැටි භාණ්ඩ, පිහන් මැටි සහ ගොඩනැගිලි ආශ්‍රිත කර්මාන්ත
14	බෝට්ටු, උපාංග සහ ධීවර ආම්පන්න ආශ්‍රිත කර්මාන්ත
15	තීන්ත, රසායනික ද්‍රව්‍ය, මුද්‍රණ ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත කර්මාන්ත
16	රූපලාවණ්‍ය හා ඒ ආශ්‍රිත කර්මාන්ත
17	මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත
18	කිරි සහ කිරි ආශ්‍රිත කර්මාන්ත
19	ඛනිජ සහ ඒ ආශ්‍රිත කර්මාන්ත
20	ඇඟලුම්, රෙදිපිළි සහ ඒ ආශ්‍රිත කර්මාන්ත

ව්‍යාපාරිකයන් දැනුවත් කරන ලද අතර, අසම්පූර්ණ අයදුම්පත් ඉවත් කර අපක්ෂපාතී විනිසුරු මඩුල්ලක් විසින් කර්මාන්ත 900 ක් පරීක්ෂා කර තරඟකරුවන් සඳහා 80% ලකුණු ලබා දෙන ලදී. ඒ අතරින් ක්ෂේත්‍ර 20කට අයත් විවිධ පරිමාණයේ කර්මාන්තකරුවන් 202ක් පළාත් ජයග්‍රාහකයන් ලෙස තෝරාගෙන ඔවුන්ට කර්මාන්ත ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාමට අවසර ලබාදුන් අතර කාර්ය සාධනය ඇගයීමේදී ඉතිරි 20% ලකුණු ලබා දෙන ලදී.

- කර්මාන්තකරුවන් 117 දෙනා ලබාගත් මුළු ලකුණු ප්‍රමාණය සලකා බලා ඔවුන් රන්, රිදී, ලෝකඩ සහ ප්ලැටිනම් ජාතික සම්මාන සඳහා තෝරා ගන්නා ලදී.

- **ඇගයීම් ක්‍රියාමාර්ගය**

  - **අයදුම්පත් පරීක්ෂා කිරීම**

නියමිත දිනට හෝ ඊට පෙර එවන ලද අයදුම්පත් පරීක්ෂාවට ලක් කරන ලද අතර අසම්පූර්ණ අයදුම්පත් එවන ලද කර්මාන්ත සහ ඉල්ලුම් කරන ලද තොරතුරු ලබා දීමට අපොහොසත් වූ කර්මාන්ත පළමු අදියරේදී තරඟයෙන් ඉවත් කෙරිණි.

  - **කර්මාන්ත පරීක්ෂා කිරීම**

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ පළපුරුදු බාහිර තෙවන පාර්ශ්ව මඩුලු සාමාජිකයෙකුගෙන් විනිශ්චය මඩුල්ල සමන්විත විය. ලකුණු දීමේ නිර්ණායකයට අනුව, මඩුල්ල විසින් සමාගමේ හිමිකරුවන් සහ කාර්ය මණ්ඩලය සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා, සියලුම සේවා ස්ථාන සහ කුටි, වැඩ පරිසරය සහ වටපිටාව පරීක්ෂා කරන ලදී. ඒ අනුව ලිඛිත සාක්ෂි විභාග කර ස්වාධීනව ලකුණු ප්‍රදානය කරන ලදී. අවසානයේ දී, කර්මාන්ත පරීක්ෂාවෙන් පසු 800න් ලකුණු ලබා දෙන ලද අතර, අදාළ මට්ටම ඉක්මවා ගිය කර්මාන්තකරුවන් තරඟය හරහා තවදුරටත් ඉදිරියට ගෙන යන ලදී.

  - **කුටි පරීක්ෂා කිරීම**

කර්මාන්ත පරීක්ෂාවේදී මුළු ලකුණු ප්‍රමාණයෙන් 70%කට වැඩි ප්‍රමාණයක් ලබාගත් පළාත් ජයග්‍රාහකයන්ට බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවැති ප්‍රදර්ශනයේදී කුටියක් වෙන් කරන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් පිටත ජූරි සභිකයන් තිදෙනෙකු විසින් විවිධ උප නිර්ණායක 20ක් මත පදනම්ව මෙම කොටස යටතේ ලකුණු ප්‍රදානය කරන ලදී. ප්‍රදර්ශන කුටිය සඳහා වෙන් කර තිබූ මුළු ලකුණු සංඛ්‍යාව 200ක් වූ අතර, ප්‍රදර්ශනයේ පළමු දිනයේදී ප්‍රදර්ශන භාණ්ඩ කිසිවක් අලෙවි කිරීම තරඟයට නුසුදුසුකමක් ලෙස සැලකිණි.

11) IDB හි අනෙකුත් දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම් වලට පහසුකම් සැලසීම සඳහා පහත සඳහන් උප ක්‍රියාකාරකම් මෙම අංශය වෙත පවරා ඇත.

- IDB හි අනිවාර්ය අරමුණු වලට අනුකූලව ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සම්පාදනය කිරීම.
- ව්‍යවසාය / කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීමට පහසුකම් සැලසීම, කර්මාන්ත/ආර්ථිකය හා සම්බන්ධ සංඛ්‍යාලේඛන යාවත්කාලීන කිරීම සහ අදාළ අංශයේ සංවර්ධන සැලසුම් සකස් කිරීමට සහාය වීම.
- විදේශ අරමුදල් සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා සහ සංකල්ප පත්‍රිකා සකස් කිරීම.
- පවත්නා කර්මාන්ත ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදන කමිටු සඳහා IDB හි සහභාගිත්වය සහතික කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම.
- එක් එක් මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තා සකස් කිරීම.
- අමාත්‍යාංශය සඳහා වන ක්‍රියාකාරකම් පිළිබඳ කාර්තුමය සමාලෝචනය භාෂාත්‍රයෙන්ම සකස් කිරීම.

4.7 ප්‍රාදේශීය සංවර්ධන අංශය

4.7.1 හැඳින්වීම

IDB විසින් ආරම්භ කරන ලද සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ වගකීම IDB හි ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD) වෙත පැවරී ඇති අතර, දිවයිනේ සමස්ත දිස්ත්‍රික්ක විසිපහම (25) ආවරණය වන පරිදි සිය කලාපීය ජාලය හරහා කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත (SME) අංශය සංවර්ධනය කිරීම සඳහා RDD විසින් අතිවිශිෂ්ට කාර්යභාරයක් ඉටු කරයි. මෙම අංශයේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ ව්‍යවසායකයින්ට නව කර්මාන්ත පිහිටුවීමට සහ ව්‍යාප්ති සේවා සැපයීම මගින් පවතින කර්මාන්ත පුළුල් කිරීමට සහාය වීම සහ ප්‍රාදේශීය කාර්යාලවල රාජකාරි සඳහා අනුයුක්ත කර ඇති නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ/ සහකාර අධ්‍යක්ෂවරුන්ගේ සහ ව්‍යවසාය ප්‍රවර්ධන කළමනාකරුවන්ගේ/ ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරීන්ගේ සහයෝගය ලබාගනිමින් IDB විසින් දිස්ත්‍රික් මට්ටමින් ආරම්භ කරන ලද සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පවරා ඇති ප්‍රධාන ව්‍යාපෘති වන්නේ කලාපීය කාර්මික ආර්ථික වාර්තා සකස් කිරීම, නව MSME පිහිටුවීම, දැනට සිටින කර්මාන්තකරුවන් සංවර්ධනය කිරීම, අපනයනය සඳහා සූදානම් සමාගම් ලෙස SMEs හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය කිරීම වේ.

කලාපීය ජාලය




#	දිස්ත්‍රික් කාර්යාලය
1	අම්පාර
2	අනුරාධපුරය
3	බදුල්ල
4	මඩකලපුව
5	කොළඹ
6	ගාල්ල
7	ගම්පහ
8	හම්බන්තොට
9	යාපනය
10	කළුතර
11	මහනුවර
12	කෑගල්ල
13	කුරුණෑගල
14	මාතලේ
15	මාතර
16	මොණරාගල
17	නුවර එළිය
18	පොලොන්නරුව
19	පුත්තලම
20	රත්නපුර
21	ත්‍රිකුණාමලය
22	වවුනියාව
23	කිලිනොච්චිය
24	මුලතිව්
25	මන්නාරම

4.7.2 වසරේ කාර්ය සාධනය

4.7.1 වගුව: ප්‍රගති සාරාංශය 2022

#	ප්‍රතිඵලය	KPIs	සමුච්චිත		ප්‍රගතිය (%)
			ඉලක්කය	ජයග්‍රහණ	
1	ස්ථාපිත කරන ලද නව කර්මාන්ත (ආරම්භක)	ස්ථාපිත කරන ලද නව කර්මාන්ත (ආරම්භක) සංඛ්‍යාව	**300**	**153**	**51**
2	වැඩි දියුණු කරන ලද පවතින කර්මාන්ත	වැඩි දියුණු කරන ලද පවතින කර්මාන්ත සංඛ්‍යාව	**700**	**452**	**65**
3	ස්ථාපිත / වැඩිදියුණු කරන ලද ක්ෂුද්‍ර කර්මාන්ත	ස්ථාපිත / වැඩිදියුණු කරන ලද ක්ෂුද්‍ර කර්මාන්ත සංඛ්‍යාව	**500**	**533**	**107**
පිරිවැය / වියදම (රු.මි.)			**12.85**		
ඉපැයීම් / ආදායම (රු.මි.)			**22.04**		




2022 දෙසැම්බර් 31 දිනට ඉලක්ක සහ ජයග්‍රහණ සමඟ දිස්ත්‍රික්ක අනුව ප්‍රගති සාරාංශය

4.7.2 වගුව: කර්මාන්ත පිහිටුවීමට සහ වැඩිදියුණු කිරීමට සහාය වීම

#	දිස්ත්‍රික්කය	ප්‍රතිඵලය						පිරිවැය (රු.මි.)	ඉපැයීම් (රු.මි.)
		ස්ථාපිත කරන ලද නව කර්මාන්ත සංඛ්‍යාව		වැඩි දියුණු කරන ලද පවතින කර්මාන්ත සංඛ්‍යාව		ස්ථාපිත / වැඩිදියුණු කරන ලද ක්ෂුද්‍ර කර්මාන්ත සංඛ්‍යාව			
		ඉලක්ක	ඉටු කර ගැනීම්	ඉලක්ක	ඉටු කර ගැනීම්	ඉලක්ක	ඉටු කර ගැනීම්		
01	අම්පාර	4	4	5	7	17	20	0.03	0.12
02	අනුරාධපුරය	12	3	27	13	16	21	0.24	0.56
03	බදුල්ල	12	16	26	20	18	19	0.54	0.01
04	මඩකලපුව	6	5	25	3	18	20	0.11	0.28
05	කොළඹ	22	3	50	35	25	45	0.36	1.17
06	ගාල්ල	20	9	50	36	25	22	0.62	1.21
07	ගම්පහ	22	5	50	27	25	27	0.65	1.96
08	හම්බන්තොට	12	12	26	24	18	33	0.54	1.00
09	යාපනය	8	8	26	36	22	25	0.94	1.34
10	කළුතර	16	3	50	16	30	20	2.76	3.24
11	මහනුවර	22	8	50	33	25	37	0.76	2.12
12	කෑගල්ල	14	5	31	28	21	29	1.02	0.20
13	කිලිනොච්චිය	6	4	15	12	17	17	0.08	0.07
14	කුරුණෑගල	22	11	50	42	25	33	0.46	0.73
15	මන්නාරම	6	6	15	12	15	15	0.21	0.13
16	මාතලේ	12	6	26	8	18	16	0.78	1.31
17	මාතර	20	15	50	34	25	27	0.64	0.83
18	මොණරාගල	4	2	5	5	17	22	0.11	0.20
19	මුලතිව්	4	3	5	1	17	0	0.00	0.00
20	නුවර එළිය	4	2	5	6	17	17	0.22	0.39
21	පොලොන්නරුව	12	8	26	9	18	16	0.28	0.43
22	පුත්තලම	14	3	31	5	21	5	0.31	0.84
23	රත්නපුරය	14	3	26	20	18	21	0.63	0.90
24	ත්‍රිකුණාමලය	6	6	15	7	15	15	0.28	0.40
25	වවුනියාව	6	3	15	13	17	11	0.16	0.33

4.7.3 වගුව: අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති කර්මාන්තවල ව්‍යවසාය සංඛ්‍යාව, මුළු ආයෝජනය සහ රැකියා ප්‍රමාණය දිස්ත්‍රික්ක අනුව

#	දිස්ත්‍රික්කය	ව්‍යවසාය සංඛ්‍යාව			මුළු ආයෝජනය (රු.මි.)			රැකියා		
		නව කර්මාන්ත	ක්ෂුද්‍ර කර්මාන්ත	පවතින කර්මාන්ත	නව කර්මාන්ත	ක්ෂුද්‍ර කර්මාන්ත	පවතින කර්මාන්ත	නව කර්මාන්ත	ක්ෂුද්‍ර කර්මාන්ත	පවතින කර්මාන්ත
1	අම්පාර	3	14	7	105.6	7.35	493.9	38	36	149
2	අනුරාධපුරය	3	21	13	3.35	7.845	57.7	5	37	181
3	බදුල්ල	9	14	21	27.45	16.057	1818.11	36	18	497
4	මඩකලපුව	5	18	3	8.3	24.6	16	29	76	34
5	කොළඹ	2	37	28	55	24.845	2826.82	18	99	851
6	ගාල්ල	8	22	32	49.5	39.185	2334.3	44	54	1329
7	ගම්පහ	4	15	24	24	35.67	1914	22	59	677
8	හම්බන්තොට	7	16	15	17.46	16.92	225.64	99	31	238
9	යාපනය	6	25	19	13.62	31.25	588.5	24	81	542
10	කළුතර	3	24	16	95.25	115.6655	186.34	68	42	157
11	මහනුවර	8	34	26	38.5	75.755	830.45	32	65	852
12	කෑගල්ල	8	27	28	143.4	35.395	2284.7	50	54	981
13	කිලිනොච්චිය	3	1	8	32	3	53	17	3	63
14	කුරුණෑගල	11	31	34	197.1	42.99	1646.35	167	69	665
15	මන්නාරම	6	15	12	14.7	34.9	113.5	18	44	76
16	මාතලේ	5	13	8	52.7	15.7	197.45	39	19	73
17	මාතර	12	28	31	94.9	28.5	1419.7	28	39	1625
18	මොණරාගල	2	15	4	22.07	21.01	44.18	12	31	27
19	මුලතිව්	3	14	1	10.5	5.065		9	45	
20	නුවර එළිය	2	1	4	8.8	0.3	6.45	12	2	54
21	පොලොන්නරුව	8	10	8	13.91	18	299.5	20	16	65
22	පුත්තලම	4	4	7	386	9.7	261.2	119	17	130
23	රත්නපුරය	4	16	17	12.4	14.27	1092.6	17	26	432
24	ත්‍රිකුණාමලය	5	14	7	13.5	23.585	55.7	26	54	41
25	වවුනියාව	3	11	13	4.2	28.4	279.9	7	28	191
එකතුව		**134**	**440**	**386**	**1,444.21**	**675.957501**	**19,045.99**	**956**	**1045**	**9,930**



4.7.3 අංශය විසින් සංවිධානය කරන ලද විශේෂ ක්‍රියාකාරකම් / සිදුවීම්

- **"Get Up - Start Up for a Wealthy Nation"** – ජාතික වැඩසටහන

Getup Startup for a Wealthy Nation - ජාතික වැඩසටහනේ සමාරම්භය 2022 ඔක්තෝබර් මස 26 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පැවැත්විණි. ගරු අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ සංකල්පයකට අනුව, කර්මාන්ත අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව පුරා ව්‍යවසායකයින් සහ කර්මාන්ත සංවර්ධනය කරමින් ධනවත් ජාතියක් බිහි කිරීම මෙහි අරමුණ වේ. ඒ අනුව, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් එම අදහස ක්‍රියාත්මක කිරීම සඳහා නව සංකල්ප සහ ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. ඉලක්කගත ප්‍රේක්ෂකයින්ට උපදෙස් සහ මගපෙන්වීම් ලබා දීම සඳහා මෙම අවස්ථාවේ දී IDB ජංගම යෙදුම (Mobile APP), 1995 හදිසි ඇමතුම් අංකය, සහ වට්ස්ඇප් අංකයක් (0705001995) හඳුන්වා දෙන ලදී. තවද, ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා වූ ව්‍යාපාරික සායන සහ පාසල් ව්‍යවසායකත්ව කව යන නව සංකල්ප ද මෙහිදී හඳුන්වා දෙන ලදී. ණය සඳහා අයදුම් කිරීමේදී ව්‍යවසායකයින්ට පහසුකම් සැලසීම සඳහා HDFC බැංකුව සහ SDB බැංකුව සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම, "පොහොසත් ජාතියක් සඳහා මහපෙන්වීමක්" අත්පොත එළිදැක්වීම ප්‍රාදේශීය සංවර්ධන අංශය සමඟ සම්බන්ධ වූ මෙම අවස්ථාවේ දී සිදු වූ තවත් ක්‍රියාකාරකම් කිහිපයකි.



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

- **HDFC බැංකුව සහ IDB අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම**

සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමයට අනුකූලව HDFC බැංකුව සහ IDB අතර අවබෝධතා ගිවිසුමක් 2022 ඔක්තෝම්බර් 26 වන දින අත්සන් කරන ලද අතර, එමඟින් ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයින්ට සහ කර්මාන්තකරුවන්ට බැංකුවෙන් මූල්‍ය ආධාර සහ ණය පහසුකම් ලබා ගැනීමට මගපෙන්වීම සඳහා පහසුකම් සැලසේ. ප්‍රාදේශීය සංවර්ධන අංශය, විශේෂයෙන් දිස්ත්‍රික් කාර්යාල බැංකුව සමඟ සම්බන්ධීකරණයෙන් ව්‍යවසායකයින්ට සහාය වනු ඇත.

- **SDB බැංකුව සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම**

සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමයට අනුකූලව SDB බැංකුව සහ IDB අතර අවබෝධතා ගිවිසුමක් 2022 ඔක්තෝම්බර් 26 වන දින අත්සන් කරන ලද අතර, එමඟින් ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයින්ට සහ කර්මාන්තකරුවන්ට බැංකුවෙන් මූල්‍ය ආධාර සහ ණය පහසුකම් ලබා ගැනීමට මගපෙන්වීම සඳහා පහසුකම් සැලසේ. ප්‍රාදේශීය සංවර්ධන අංශය, විශේෂයෙන් දිස්ත්‍රික් කාර්යාල බැංකුව සමඟ සම්බන්ධීකරණයෙන් ව්‍යවසායකයින්ට සහාය වනු ඇත.

- **“Getup Startup Wealthy Nation” ජාතික වැඩසටහනට අදාළව IDB සහ දිස්ත්‍රික් ලේකම්වරුන් අතර රැස්වීම්**

Getup Startup Wealthy Nation වැඩසටහනට සමගාමීව, ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් සහ රජයේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා IDB විසින් දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ලේකම් රැස්වීම් සංවිධානය කර ඇත. IDB හි සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රාදේශීය සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ මෙම රැස්වීම් සඳහා සහභාගී වී ඇත. එහි පළමු රැස්වීම 2022 දෙසැම්බර් 13 වන දින කෑගල්ල දිස්ත්‍රික්කයේ දී පැවැත්විණි. මාතර දිස්ත්‍රික් රැස්වීම 2022 දෙසැම්බර් 15 දිනද, වවුනියාව දිස්ත්‍රික් රැස්වීම 2022 දෙසැම්බර් 20 දිනද, මහනුවර දිස්ත්‍රික් රැස්වීම 2022 දෙසැම්බර් 22 දිනද, කිලිනොච්චි දිස්ත්‍රික් රැස්වීම 2022 දෙසැම්බර් 21 දිනද පැවැත්විණි. 2023 වර්ෂයේ දී ඉතිරිව ඇති සෑම දිස්ත්‍රික්කයකම මෙම වැඩසටහන් පැවැත්වීමට නියමිතය.



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

- **ත්‍රිරෝද රථ හිමියන්ගේ සංගමය සහ IDB අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම**

ත්‍රිරෝද රථ රියදුරන්ට නව ව්‍යාපාර ආරම්භ කිරීමට පහසුකම් සැලසීම සඳහා “Getup Startup Wealthy Nation” වැඩසටහනට සමගාමීව ත්‍රිරෝද රථ හිමියන්ගේ සංගමය සහ IDB අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. ඔවුන්ට අවශ්‍ය තාක්ෂණ හා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදෙමින් ඔවුන්ට මග පෙන්වීම ප්‍රාදේශීය සංවර්ධන අංශයේ අරමුණ වේ.




4.7.4 වගුව: අංශයේ ප්‍රගතිය

ක්‍රියාකාරකම් අංකය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශකය	සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.)
1. නව කර්මාන්ත පිහිටුවීම (ආරම්භක)			
1.1	ඉංජිනේරු සහ තාක්ෂණික සහාය ලබාදීම	සපයන ලද සහාය සංඛ්‍යාව	77,300
1.2	මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීම	ලබා ගත් පහසුකම් සංඛ්‍යාව	11,000
2. පවතින කර්මාන්ත සඳහා ව්‍යාපාර වැඩිදියුණු කිරීමේ වැඩසටහන්			
2.1	පාරිසරික සහාය ලබාදීම	සහාය වූ අවස්ථා සංඛ්‍යාව	3,000
2.2	ඉංජිනේරු සහ තාක්ෂණ සංවර්ධන සහාය ලබාදීම	සපයන ලද සහාය සංඛ්‍යාව	184,240
2.3	මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීම	ලබා ගත් පහසුකම් සංඛ්‍යාව	60,350
3. ක්ෂුද්‍ර කර්මාන්ත ආරම්භ කිරීම / වැඩිදියුණු කිරීම			
3.1	පාරිසරික සහාය ලබාදීම	සහාය වූ අවස්ථා සංඛ්‍යාව	6,062
3.2	ඉංජිනේරු සහ තාක්ෂණික සහාය ලබාදීම	සපයන ලද සහාය සංඛ්‍යාව	287,881
3.3	මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීම	ලබා ගත් පහසුකම් සංඛ්‍යාව	4,100
4. වෙළඳපල ප්‍රවේශය සහ වෙනත් සේවා			
4.1	ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද සැසි සංඛ්‍යාව	122,000
4.2	පුහුණු වැඩසටහන් පැවැත්වීම (අලෙවිකරණය, තාක්ෂණික, කළමනාකරණය, ඵලදායිතාව, ඇසුරුම්කරණය ආදී)	පවත්වන ලද සැසි සංඛ්‍යාව	8,426,509
4.3	ව්‍යවසායකත්ව/ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන (ED) පුහුණුවීම් පැවැත්වීම	පවත්වන ලද සැසි සංඛ්‍යාව	57,000
5. විශේෂ වැඩසටහන්			
5.1	ව්‍යාපාර හිමිකරුවන් සඳහා කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන	පවත්වන ලද සැසි සංඛ්‍යාව	30,000
6. ආදායම් උත්පාදන සේවා			
6.1	වෙනත් විශේෂ සේවා/වැඩසටහන් (උදා. මහවැලි සහ අදාළ ව්‍යාපෘති)	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	4,881,625
6.2	කිතුල් මදින්නන් සඳහා කැස්පර් බෝතල් විකිණීම	අලෙවි කරන ලද බෝතල් සංඛ්‍යාව	2,011,475
6.3	ලෝහ පාදක අමුද්‍රව්‍ය බෙදා හැරීම	බෙදාහරින ලද මෙට්‍රික් ටොන් ගණන	4,833,966
6.4	ව්‍යාපෘති වාර්තා / තක්සේරු වාර්තා සකස් කිරීම	ආදායම් උත්පාදනය (රු./මී.)	1,013,087
6.5	අරමුදල් ලබාගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සම්පාදනය කිරීම	සම්පූර්ණ කරන ලද යෝජනා ගණන	26,200
එකතුව (රු.)			**22,035,795**

4.7.5 වගුව : ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම

#	**2019**	**2020**	**2021**	**2022**
ඉලක්කගත ආදායම	6.85	22.18	11.74	21.93
සත්‍ය ආදායම	12.46	15.76	9.88	22.04



ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD) විසින් ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් පවත්වනු ලබන සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම් මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සිදු කරයි. අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ කර්මාන්තකරුවන්ට සහ ව්‍යවසායකයින්ට දිවයිනේ විවිධ ප්‍රදේශවල තම ව්‍යාපාර ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය වීමයි. කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින මෙම ප්‍රාදේශීය සංවර්ධන අංශය මණ්ඩලයෙහි ඉලක්ක සපුරා ගැනීම සඳහා දායකත්වය සපයාදීම පිණිස මූලික ක්ෂේත්‍ර 4ක් යටතේ ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික්ක 25හි කර්මාන්ත වල ආර්ථික තත්වය හඳුනා ගැනීම, නව කර්මාන්ත නිර්මාණය කිරීම, පවතින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ප්‍රවර්ධනය සහ සංවර්ධන කිරීම, ප්‍රාදේශීය සංවර්ධන අංශයේ කාර්යය මණ්ඩලයෙහි හා ප්‍රාදේශීය කාර්ය මණ්ඩලයෙහි හැකියා සංවර්ධනය කිරීම එම ක්‍රියාමාර්ග හතර වේ. සත්‍ය සහ ඉලක්කගත ආදායම් ප්‍රවාහයේ විසරණය පිළිබඳ සැලකීමේදී, ඉහළ අපගමනයන් සහිත හිතකර මෙන්ම අහිතකර පරතරයන් දක්නට ලැබේ. 2019 වර්ෂයේදී සත්‍ය ආදායම ඉලක්ක ආදායමට වඩා වැඩි වූ අතර එය කලාපීය ජාලයේ මනා කාර්ය සාධනය පිළිබඳ හොඳ ඇඟවීමක් වේ. නමුත් 2020 වර්ෂයේදී COVID-19 වසංගත තත්ත්වය පැතිරීම හේතුවෙන් සැබෑ ආදායමේ විශාල පහත වැටීමක් සිදු විය. වසංගතය විසින් ශ්‍රී ලංකාවේ වෙළඳාම, ආර්ථිකය සහ කර්මාන්ත අංශය මත විශාල යටිකුරු පීඩනයක් ඇති කරන ලදී. වෙළඳ භාණ්ඩ වෙළඳාම, විදේශ සෘජු ආයෝජන (FDI) ප්‍රවාහ, සංචාරක ව්‍යාපාරය සහ දේශසීමා සංක්‍රමණය යනාදියෙහි පෙර නොවූ විරූ අඩුවීම ආර්ථිකය බිඳවැටීමේ ලක්ෂණ වේ. මෙය ශ්‍රී ලංකාවේ ආයතනයන්හි සහ IDB හි ක්‍රියාකාරිත්වයට ද සැලකිය යුතු ලෙස බලපා ඇත. කෙසේ වෙතත්, නව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ක්ෂුද්‍ර කර්මාන්ත ඇති කිරීම, පවතින කර්මාන්ත වැඩිදියුණු කිරීම, අපනයන සඳහා සූදානම් සමාගම් ලෙස කර්මාන්ත හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම වැනි RDD හි ප්‍රධාන කාර්ය සාධන ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ක්‍රමානුකූලව නිවැරදි මාර්ගයට පිවිසීමට අවධානය යොමු කර ඇත.

පසුගිය වසර කිහිපය තුළ බොහෝ බාධක ජයගනිමින් ඉලක්කය කරා ළඟා වූ බැවින්, 2022 වසර ප්‍රාදේශීය සංවර්ධන අංශයට සමෘද්ධිමත් වසරක් විය.

කෙසේ වෙතත්, IDB හි සමස්ත ප්‍රතිඵලය එක් එක් අංශයේ දායකත්වය මත බෙහෙවින් රඳා පවතී. RDD සහ කලාපීය ජාලය IDB හි ඉතාමත්ම ඵලදායී අංශයක් වන අතර, එබැවින් ඉලක්කගත සහ සත්‍ය ආදායම අතර විශාල අපගමනය වීම් මහහරවා ගනිමින් කාර්ය සාධනයේ සංයුතිය කළමනාකරණය කිරීමට ඔවුන් දැනුවත් විය යුතුය. කාර්ය මණ්ඩලය සිය දායකත්වය උපරිමයෙන් ලබානොදෙන්නේ නම්, තරඟකාරීව සිටීම දුෂ්කර ය. එබැවින්, කාර්ය මණ්ඩලයේ ඵලදායිතාව පිළිගත හැකි මට්ටමකට වැඩිදියුණු කිරීම සඳහා, ඔවුන් වෙනුවෙන් තවත් පුහුණු සැසි සංවිධානය කිරීම වඩාත් හිතකර වනු ඇත. අංශවල ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී අසංගතතා තුරන් කිරීම සඳහා අවසානයේ දී එය උපකාරී වනු ඇත.

4.8 තාක්ෂණික සේවා අංශය

4.8.1 හැඳින්වීම

තාක්ෂණික සේවා අංශය (TSD) යනු ශ්‍රී ලංකාවේ කාර්මික ප්‍රජාවගේ තාක්ෂණික අවශ්‍යතා සපුරාලනු ලබන කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අංශයකි. TSD හි මූලික පරමාර්ථය වන්නේ ව්‍යවසායකයින්ට නව කර්මාන්ත වලට ඒවායේ සංකල්පිතයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා සහ පවතින කර්මාන්ත පුළුල් කිරීම, නවීකරණය කිරීම, විවිධාංගීකරණය කිරීම, ගුණාත්මකභාවය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමයි. ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිගණක තාක්ෂණය යන උප අංශ 5 හරහා TSD හි සේවාවන් සපයනු ලැබේ. ශක්තිමත් ප්‍රායෝගික සංරචකයක් සහිත එක්දින තාක්ෂණ හුවමාරු වැඩමුළු සහ කාර්මික සහතික පාඨමාලා මගින් තාක්ෂණික ආධාර සැපයීම ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබයි.

4.8.2 කාර්ය සාධන විශේෂතා

TSD විසින් සිය ක්‍රියාකාරකම් සිදු කිරීමේදී 2022 ක්‍රියාකාරී සැලැස්ම සැලකිල්ලට ගෙන ඇති අතර අනාගත ව්‍යවසායකයින්ගේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීමට සහ IDB හි ප්‍රමිතිය නංවාලීම සඳහා එහි ප්‍රධාන ක්‍රියාකාරකම් සකස් කර ඇත. එම අංශය විසින් සිදුකරනු ලැබූ ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- **තාක්ෂණික පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ ආදර්ශන පැවැත්වීම**

තාක්ෂණික සේවා අංශය තුළ සහ ඉන් පිටත ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන උප අංශ යටතේ තාක්ෂණ හුවමාරු වැඩමුළු 88 ක් පවත්වන ලද අතර, සමස්ත පුද්ගලයන් 3349 දෙනෙකු පුහුණුවීම් සඳහා සහභාගී විය. මෙම වැඩමුළු තුළින් රු.14,136,000/- ක ආදායමක් උපයා ගැනීමට හැකි විය.

- මෙම අංශය පදනම් කරගත් ඉල්ලුම අනුව සකස් කරන ලද තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම

4.8.1 වගුව : වැඩසටහන් සාරාංශය

අංකය	පුහුණු වැඩසටහන / වැඩමුළුව	සහභාගී වූ සංඛ්‍යාව	ආදායම (රු.)
01	පලතුරු සහ එළවළු විජලනය - ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	25	39,600
02	වැසිකිළි පිරිසිදු කිරීමේ දියර, ටයිල් පිරිසිදු කිරීමේ දියර, අත් සේදුම් දියර, පිඟන් සෝදන දියර - ලක්මී එක්ස්පෝට්ස් (පුද්) සමාගම, අනුරාධපුරය	04	31,920
03	ඩිටර්ජන්ට් කුඩු, රෙදි සේදුම් දියර සහ අත් සේදුම් දියර	06	44,400
04	ක්ෂණික පළතුරු බීම, ජෑම් සහ සෝස් - සම්පත් සුපර් ට්‍රේඩින් (පුද්) සමාගම, දොඩංගොඩ	06	39,600
05	අපනයන වෙළෙඳපොළ සඳහා ප්ලයිවුඩ් ලෑලි සහ ප්ලයිවුඩ් දොරවල් නිෂ්පාදනය කිරීමේ පුහුණු වැඩසටහන	05	51,750
06	ෆයිබර්ග්ලාස් සවි ගැන්වීමේ තාක්ෂණය - පර්ස්ටාෆ් හෝල්ඩින්ස් පුද්. සමාගම	10	70,600
07	කෝපි සැකසීම සහ අලෙවිකරණය	10	46,230
08	ශ්‍රී ලංකාවේ ඛනිජ කර්මාන්ත සඳහා අගය එකතු කිරීමේ අවස්ථා සහ උපාය මාර්ග පිළිබඳ සම්මන්ත්‍රණය	85	867,000
එකතුව		**151**	**1,191,100**

- කාර්මික සහතික පුහුණු පාඨමාලා පැවැත්වීම

4.8.2 වගුව: වැඩසටහන් සාරාංශය

අංකය	සහතික පත්‍ර පාඨමාලාවේ නම	සහභාගීවූ සංඛ්‍යාව	ආදායම (රු.)
01	බතික් තාක්ෂණය - දින 03	15	225,000
02	කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන තාක්ෂණය - දින 10	30	1,050,000
03	PLC & HMI - දින 04	14	210,000
04	බතික් තාක්ෂණය - දින 03	15	225,000
05	පරිගණක දෘඩාංග සහ ජාලකරණ පාඨමාලාව - මාස 03	07	144,900
06	පානීය ජලය බෝතල් කිරීම - දින 06	13	208,000
07	පරිගණක දෘඩාංග සහ ජාලකරණය - දින 30	10	256,000
08	බතික් තාක්ෂනය - දින 03	08	144,000
09	පානීය ජලය බෝතල් කිරීම	17	374,000
10	තේ සහ අගය එකතු කිරීමේ තාක්ෂණය	25	628,500
11	බතික් තාක්ෂණය	11	99,000
12	පරිගණක දෘඩාංග සහ ජාලකරණය	13	312,000
එකතුව		**178**	**3,876,400**

- දේශීය හා විදේශීය තාක්ෂණයන් අත්පත් කර ගැනීම සහ බෙදා හැරීම

4.8.3 වගුව: වැඩසටහනේ සාරාංශය

අංකය	පුහුණු වැඩසටහන / වැඩමුළුව	සහභාගීවූ සංඛ්‍යාව	ආදායම (රු.)
01	මාර්ග සලකුණු කිරීමේ තීන්ත	12	60,000
02	තේ රස බැලීම සහ තේ ශ්‍රේණිගත කිරීම	28	98,000
03	පොල් වතුර ඇසුරුම් කිරීමේ තාක්ෂණය	60	360,000
04	කෝපි සඳහා අගය එකතු කිරීම	50	250,000
05	සුවඳ විලවුන්, බොඩි ස්ප්‍රේ සහ ළදරු ඕඩිකොලෝන් නිෂ්පාදනය	49	245,000
06	සූර්ය පැනල පද්ධතිය පිළිබඳ නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන	72	432,000
07	අර්ධ වශයෙන් බේක් කරන ලද ශීත කළ බේකරි නිෂ්පාදන	30	120,000
එකතුව		**301**	**1,565,000**

- **උණ බම්බු නිෂ්පාදන සංවර්ධන සහ පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන්**

4.8.4 වගුව: වැඩසටහනේ සාරාංශය

අංකය	පුහුණු වැඩසටහන	සහභාගීවූ සංඛ්‍යාව	ආදායම (රු.)
01	මෘදු දැව පිරියම් කිරීම සහ උණ දැව සංරක්ෂණය පිළිබඳ වැඩමුළුව	42	168,000
02	උණ දැව සංරක්ෂණය පිළිබඳ වැඩමුළුව	28	16,800
03	උණ බම්බු තාක්ෂණය පිළිබඳ වැඩසටහන - ඉන්දියාවේ INBAR විසින් පවත්වනු ලබන මාර්ගගත වැඩසටහන	42	-
04	Bamboo Scrimber, laminated composites සහ අගය එකතු කළ නිෂ්පාදන පිළිබඳ මාර්ගගත පුහුණුව - ඉන්දියාවේ INBAR විසින් පවත්වනු ලබන මාර්ගගත වැඩසටහන	ZOOM	-
05	උණ බම්බු ශිල්පීය තාක්ෂණය පිළිබඳ වැඩමුළුව	05	20,000
06	උණ බම්බු මත පදනම් වූ නිෂ්පාදන පිළිබඳ වැඩමුළුව - උණ බම්බු ගෘහ භාණ්ඩ	09	40,500
එකතුව			**245,300**

4.8.3 විශේෂ ව්‍යාපෘති

- **ව්‍යාපෘති: කාබනික සහතිකය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ආහාර සැකසුම්කරුවන් සහ/හෝ වෙළෙඳුන් සහ අපනයනකරුවන් හට මූල්‍යමය සහය ලබාදීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම - 2022**

කාබනික සහතිකය ලබා ගැනීම සඳහා කාබනික පිළිවෙත් අනුගමනය කිරීමට කැමැත්තක් දක්වන දේශීය ආහාර සැකසුම්කරුවන් සහ/හෝ වෙළඳුන් සහ අපනයනකරුවන් සඳහා සහය ලබාදීමේ යෝජනා ක්‍රමයක් IDB විසින් ක්‍රියාත්මක කරන ලදී. ජාත්‍යන්තර වෙළඳපොලට ආහාර සැපයීමේදී තරඟකාරී වීම සඳහා දේශීය ආහාර සැකසුම්කරුවන් අතර කාබනික සහතිකය ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ වන අතර එමගින් රටේ විදේශ විනිමය ඉපැයීම් වැඩි කරන අතරම ඔවුන්ගේ කාබනික නිෂ්පාදන සඳහා හොඳ මිලක් ලබා ගැනීමට ඔවුන්ට හැකි වේ.

මෙහිදී, කාබනික සහතික කිරීමේ මූලික පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා තෝරාගත් ආහාර සැකසුම් සහ/හෝ වෙළෙඳ සහ අපනයන කර්මාන්ත විසිපහක් (25) සඳහා උපරිම රු.250,000/- දක්වා ප්‍රදානයක් ලෙස ලබාදෙනු ලැබේ. මුල්‍ය ප්‍රදානය සඳහා ආහාර නිෂ්පාදන කර්මාන්ත 25ක් තෝරා ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් කර්මාන්ත විසින් EU Organic, USDA Organic, JAS Organic & Bio Sussise වැනි ජාත්‍යන්තර කාබනික සහතික ලබාගෙන ඇත. ජාත්‍යන්තර කාබනික කෘෂිකාර්මික ප්‍රමිතීන් සඳහා කර්මාන්ත සහතික කිරීමේ ප්‍රතිපාදනය ලත් සහතික කිරීමේ ආයතනයක් වන Control Union Inspections (Pvt.) Ltd සමඟ එක්ව ව්‍යාපෘති ප්‍රතිලාභීන් සඳහා කාබනික සහතික කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් ද පවත්වන ලදී.

- **ශ්‍රී ලංකාවේ ඛනිජ කර්මාන්ත සඳහා අගය එකතු කිරීමේ අවස්ථා සහ උපාය මාර්ග පිළිබඳ සම්මන්ත්‍රණය**

මිනිරන්, ක්වාර්ට්ස්, මැණික්, මයිකා, මැටි, හුණුගල්, ඩොලමයිට්, ෆෙල්ඩ්ස්පාර්, ඇපටයිට් වැනි වටිනා ඛනිජ සම්පත් රාශියක් ශ්‍රී ලංකාව සතුව පවතින අතර එමඟින් මෙරට ආර්ථික වර්ධනයට විශාල සහයක්

ලබාගැනීමේ හැකියාව පවතී. කෙසේ වෙතත්, ජාතික ආර්ථිකයට ඛනිජ ආශ්‍රිත කර්මාන්තවලින් ලබාගත හැකි උපරිම දායකත්වය තවමත් ලබාගෙන නොමැත.

එබැවින්, අදාළ ආයතන සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ එක්ව, IDB විසින් "ශ්‍රී ලංකාවේ ඛනිජ කර්මාන්තය සඳහා අගය එකතු කළ අවස්ථා සහ උපාය මාර්ග" පිළිබඳ සම්මන්ත්‍රණයක් දෙසැම්බර් 30 වැනි දින "කොළඹ 01, කින්ස්බරි හෝටල් පරිශ්‍රයේ දී 85 දෙනෙකුගේ සහභාගිත්වයෙන් යුතුව පවත්වන ලද අතර එමඟින් රු.867,000/-ක ආදායමක් උපයා ගන්නා ලදී.

ප්‍රමුඛ පෙළේ රාජ්‍ය ආයතන, කීර්තිමත් කර්මාන්තකරුවන් සහ ශ්‍රී ලංකාවේ ඛනිජ ක්ෂේත්‍රයේ පර්යේෂකයන් අතර මනා සම්බන්ධතාවයක් ඇති කිරීම මෙහි අරමුණ වේ. දේශීය ඛනිජ සම්පත්වල ශක්තීන්, ආර්ථික දායකත්වය, සීමාවන් සහ අභියෝග, කාර්මික අගය එකතු කිරීමේ අවස්ථා සහ ඛනිජ ක්ෂේත්‍රයේ නවෝත්පාදන පිළිබඳව මෙම අවස්ථාවේ දී සාකච්ඡා කෙරිණි.

මෙම වැඩසටහනට සමගාමීව, කර්මාන්තකරුවන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා TSD විසින් "මයිකා සහ ක්වාර්ට්ස් කාර්මික අගය එකතු කිරීම" පිළිබඳ ප්‍රකාශන දෙකක් එළිදක්වන ලදී.

- **තාක්ෂණික වාර්තා / අත්පොත් සකස් කිරීම**

1. මයිකාහි කාර්මික අගය එකතු කිරීම්
2. ක්වාට්ස්හි කාර්මික අගය එකතු කිරීම්
3. කෝපි වල අගය එකතු කිරීම්
4. තැඹිලි වතුර බෝතල් කිරීමේ තාක්ෂණය පිළිබඳ තාක්ෂණික වාර්තාව


- **ව්‍යාපෘති යෝජනා සකස් කිරීම**

1. ආහාර අපනයනකරුවන්ගේ ඇසුරුම් සංවර්ධනය සඳහා මූල්‍ය ආධාර යෝජනා ක්‍රමය
2. IDB හි ඇසුරුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම
3. නවෝත්පාදන සහ තත්ත්ව වැඩිදියුණු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ රූපලාවන්‍ය කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

4.8.4 ආදායම් සාරාංශය -2022


4.8.5 වගුව: ආදායමේ සාරාංශ විස්තරය

අංකය	ක්‍රියාකාරකම	ආදායම (රු.)
01	තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ ආදර්ශන පැවැත්වීම	14,136,000
02	අංශය පදනම් කරගත් සකස් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීම	1,191,100
03	කාර්මික සහතික පුහුණු වැඩසටහන් පැවැත්වීම	3,876,400
04	තාක්ෂණය අත්පත් කර ගැනීම සහ බෙදා හැරීම	1,467,000
05	තාක්ෂණික වාර්තා සකස් කිරීම	23,100
06	උණු බම්බු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය - තාක්ෂණ නුවමාරු පුහුණු වැඩසටහන් පැවැත්වීම	245,300
එකතුව		**20,938,900**



4.8.6 වගුව: සත්‍ය ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම

වර්ෂය	සත්‍ය ආදායම (රු.)
2019	18,607,832
2020	8,107,910
2021	3,788,750
2022	20,938,900



තාක්ෂණික සේවා අංශය මඟින් තාක්ෂණික සේවා සපයන අතර, හැකිතාක් කාර්යක්ෂම, ඵලදායී සහ නව්‍ය ආකාරයෙන් භෞතික හා අතථ්‍ය තොරතුරු සම්පත් අත්පත් කර ගැනීම, සංවිධානය කිරීම, සංරක්ෂණය කිරීම, නඩත්තු කිරීම සහ ප්‍රවේශය ලබා දීම මගින් අනාගත ව්‍යවසායකයින්ට සහාය වීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ඕනෑම වෙළඳපල අංශයක ප්‍රමුඛ බලවේගය ලෙස තාක්ෂණය හඳුනාගත හැකි අතර, ගෝලීය ක්ෂේත්‍රය තුළ තරඟකාරීව සිටීම සඳහා වාණිජ භාවිතයේදී දියුණු තාක්ෂණයන් භාවිතා කිරීමේ හැකියාව පරම අවශ්‍යතාවයකි. මෙම අංශය මඟින් කර්මාන්තයේ ව්‍යාප්තිය, නවීකරණය සහ විවිධාංගීකරණය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් අනාගත ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දේ.

අංශයේ ප්‍රගති සටහනට අනුව, කොරෝනා වෛරසය හේතුවෙන් 2020 සහ 2021 වර්ෂයන්හි දී ආදායම් පහත වැටීමක් පෙන්නුම් කළ අතර, මෙය ලොව පුරා පාරිභෝගිකයින්, ව්‍යාපාර සහ ප්‍රජාවන් කෙරෙහි විශාල බලපෑමක් ඇති කර තිබේ. පුහුණු වැඩසටහන් නියමිත පරිදි පැවැත්වීමට නොහැකිවීම හේතුවෙන් මෙය TSD හි ප්‍රගතිය කෙරෙහි ද බලපා ඇත. පෙර වසරේ ආදායම් මට්ටම්වලට සාපේක්ෂව සත්‍ය ආදායමේ දැවැන්ත වර්ධනයක් අත්කර ගෙන තිබූ බැවින් 2022 වසර ඉතා වැදගත් වසරක් විය. මෙය තාක්ෂණය පිළිබඳව සිදුකරන ලද පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ ආදර්ශනවල ප්‍රතිඵලයක් විය. IDB හි ප්‍රධාන ඉලක්ක කණ්ඩායම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වන අතර එක් එක් අංශ වලින් පවත්වනු ලබන සියලුම පුහුණු වැඩසටහන් වලදී ඔවුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ජාතික නිෂ්පාදනය, රැකියා, රටවල් හි ක්‍රියාත්මක වන සමාගම්වල කොටස් සඳහා ඔවුන්ගේ දායකත්වය අනුව ආර්ථිකයන්හි වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඔවුන් ශ්‍රී ලංකා ආර්ථිකයේ කොඳු නාරටිය වන අතර මෙරට සෑම අංශයක් තුළම දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය දළ දේශීය නිෂ්පාදිතයෙන් 52% ක් සහ සමස්ත රැකියා ප්‍රමාණයෙන් 45% ක් වන අතර, එය මෙරට සමස්ත ව්‍යවසායන් සංඛ්‍යාවෙන් 75% කට අධික ප්‍රමාණයකි. ආර්ථික වර්ධනය කෙරෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සංවර්ධනයේ ඇති සාධනීය බලපෑම අවබෝධ කරගත් බොහෝ රටවල් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය දියුණු කිරීමට විශාල උත්සාහයක් දරයි. නමුත් කලාපයේ අනෙකුත් සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් හා සසඳන විට, ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට මෙම අංශයේ දායකත්වය තවමත් අඩු මට්ටමක පවතී.

කර්මාන්තකරුවන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම IDB හි තාක්ෂණික සේවා අංශයේ කාර්යභාරය වේ. තවද එය ආයතනයක නිපුණතා සහ නවෝත්පාදන වැඩිදියුණු කිරීමට හැකි වන පරිදි තාක්ෂණික දැනුම සපයන ප්‍රධාන ගාමක බලවේගයයි. මීට අමතරව, හැකිතාක් කාර්යක්ෂම, ඵලදායී සහ නව්‍ය ක්‍රමවලින් විභව ව්‍යවසායකයින්ට සහාය වීම සඳහා සකස්කළ පුහුණු වැඩසටහන්, උපදේශන, අදාළ මාර්ගෝපදේශ සහ තාක්ෂණික සේවා TSD විසින් සපයනු ලබයි. ශ්‍රී ලංකාවේ දැව ආශ්‍රිත කර්මාන්තයේ වෘත්තිකයන්ට සහ විභව ව්‍යවසායකයින්ට අවශ්‍ය කුසලතා සහ පුහුණුව ලබා දීම සඳහා IDB විසින් UNIDO සමඟ එක්ව 2019 දී අංග සම්පූර්ණ උණ බම්බු නිෂ්පාදන පුහුණු සහ සේවා මධ්‍යස්ථානයක් හඳුන්වා දෙන ලදී. ගුණාත්මක හස්ත කර්මාන්ත සහ ගෘහ භාණ්ඩ දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළට නිෂ්පාදනය කරන අතරම වැඩි අවස්ථා ලබා ගැනීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට හැකියාව ඇත. ඕනෑම අභියෝගාත්මක පරිසරයක දී වඩාත් කාර්යක්ෂමව කටයුතු කිරීමට සහ විශ්වාසය වැඩි කිරීමට තාක්ෂණික කුසලතා ඉතා වැදගත් වේ. ආර්ථික වර්ධනය කෙරෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ සංවර්ධනය මඟින් ඇති වන ධනාත්මක බලපෑම අවබෝධ කර ගනිමින්, විශේෂයෙන් ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි නිෂ්පාදන, ඛනිජ සහ ඉදිකිරීම් ද්‍රව්‍ය කෙරෙහි අවධානය යොමු කරමින් TSD විසින් ඵලදායිතාව, ව්‍යවසායකත්ව සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් සහ පුහුණු සැසි සපයනු ලබයි. මීට අමතරව, TSD විසින් නව තාක්ෂණයන්, නිෂ්පාදන සංවර්ධනය සහ නව්‍ය ව්‍යාපෘති යනාදිය පිළිබඳ උපදේශන සේවා සැපයීම මගින් ව්‍යවසායකයින්ට, විශ්ව විද්‍යාලවලට සහ වෙනත් පර්යේෂණ ආයතනවලට සහාය වේ.

4.9 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය

4.9.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් කර්මාන්තයේ දියුණුව සඳහා සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය 1998 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙරට සම්භාණ්ඩ කර්මාන්තයේ සංවර්ධනය සඳහා පවතින විශාල විභවයන් සැලකිල්ලට ගනිමින්, මෙම මධ්‍යස්ථානය විසින් පාවහන් සහ සම්භාණ්ඩ අංශයේ කෙටි කාලීන හා දිගු කාලීන පාඨමාලා පවත්වනු ලබන අතර, පුහුණු ශ්‍රමිකයන්, අදාළ තොරතුරු සහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා පහසුකම් සැපයීම යනාදිය සිදු කරයි. තවද, සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් අංශයේ නියැලී සිටින (SME) කර්මාන්තකරුවන් සඳහා පොදු සේවා පහසුකම් සපයන අතරම, අපනයනය කිරීම සඳහා ගුණාත්මක නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය සහ පුහුණුව මෙම මධ්‍යස්ථානය විසින් සපයනු ලැබේ. මෙම සියලුම සේවාවන් කටුබැද්ද ප්‍රධාන කාර්යාලය (CDLPF) හරහා සහ වාරියපොල ප්‍රාදේශීය මධ්‍යස්ථානය හරහා සපයනු ලබයි.

මධ්‍යස්ථානය මගින් සපයනු ලබන සේවාවන්,

- පාවහන් සහ සම් භාණ්ඩ පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩමුළු පැවැත්වීම
- පාවහන් සැලසුම් සහ මෝස්තර සකස් කිරීමේ පුහුණුව
- වෙළඳ සහ යන්ත්‍රෝපකරණ තොරතුරු සැපයීම
- ඉන්කියුබේටර් පහසුකම් සැපයීම
- කර්මාන්ත සඳහා පුහුණු ශ්‍රමය
- රාජ්‍ය සහ පෞද්ගලික අංශය අතර සබඳතා ඇති කිරීමට සහාය වීම
- යන්ත්‍රෝපකරණ සේවා සහ සැකසුම් පහසුකම් සැපයීම
- විකුණුම් සහ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම

4.9.2 2022 වර්ෂයේ විශේෂ කටයුතු

1) අමාත්‍යාංශ, පළාත් සභා සහ සහභාගී වූ අභ්‍යාසලාභීන්ගේ මූල්‍ය දායකත්වයෙන් දිවයින පුරා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
   අ) පාවහන් නිෂ්පාදනය පිළිබඳ මූලික මට්ටමේ පුහුණු වැඩසටහන් 10ක් පවත්වන ලද අතර පාවහන් නිෂ්පාදන අංශය සඳහා ව්‍යවසායකයින් 106 දෙනෙකු පුහුණු කරන ලදී.
   ආ) බෑග් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ මූලික මට්ටමේ පුහුණු වැඩසටහන් 03ක් පවත්වන ලද අතර බෑග් නිෂ්පාදන අංශය සඳහා ව්‍යවසායකයින් 40 දෙනෙකු පුහුණු කරන ලදී.
   ඇ) ඉහත වැඩසටහන් හරහා ක්ෂේත්‍රයේ නවකයින්ගේ කුසලතා වර්ධනය කර ඇති අතර එමඟින් රු.1,353,118 ක ආදායමක් උපයා ඇත.
   ඈ) පාවහන් නිර්මාණ ශිල්පීන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ක්ෂේත්‍රයේ පුද්ගලයින් 22 දෙනෙකු පුහුණු කර රු.285,014ක් උපයා ඇත.
   ඉ) දැනට පවතින කර්මාන්තවල නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා පුද්ගලයින් 39 දෙනෙකු පුහුණු කර රු.1,123,364ක් උපයා ඇත.
   ඊ) ඉහත පුහුණු වැඩසටහන් මගින් වසර පුරා පුහුණුව ලැබූ මුළු සංඛ්‍යාව 225 කි.

2) පාවහන් සහ සම් භාණ්ඩ කර්මාන්තය හා රජය සමඟ සම්බන්ධීකරණය. මේ යටතේ ආනයන ප්‍රතිපත්ති සම්පාදනය, සෙස් බදු සංශෝධනය, අයවැය යෝජනා වැනි කටයුතුවලට මැදිහත් වීම. පාවහන් සහ සම්

භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය සහ වයඹ පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය සමඟ ක්‍රියාකාරීව කටයුතු කිරීම.

3) වර්තමානයේ අමුද්‍රව්‍ය හිඟයට සහ වැඩි වන මිලට ප්‍රතිචාරයක් ලෙස, පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමයේ නිර්දේශය මත IDB විසින් ඉන්දියානු ණය මාර්ගය හරහා අමුද්‍රව්‍ය ආනයනය කිරීමට ආනයනකරුවෙකුට අවශ්‍ය සම්බන්ධීකරණය ලබා දෙන ලදී.

4) ඉන්දීය රජය විසින් ඇමෝනියම් සල්ෆේට් අපනයනය තහනම් කිරීම හේතුවෙන් දේශීය සම් පදම් කිරීමේ කර්මාන්තය විශාල අර්බුදයකට ලක් විය. එබැවින් තායිලන්තයෙන් ඇමෝනියම් සල්ෆේට් ආනයනය කිරීම සඳහා අප විසින් පෞද්ගලික අංශයට සහයෝගය ලබා දෙන ලදී. ශ්‍රී ලංකාවේ සම් පදම් කිරීමේ අංශයට දිගු ඉතිහාසයක් ඇති අතර දේශීය නිෂ්පාදකයින් විසින් ලොව පිළිගත් මට්ටමේ මනා නිමි සම් භාණ්ඩ සැකසීම සිදු කරයි. 1980 දශකයේ සිට, ඔවුන් විසින් සියලු සම්භාණ්ඩ නිෂ්පාදකයින්ට තම නිෂ්පාදන සඳහා සුදුසු එක් ස්ථානයක් සොයමින් සිටි අතර IDB විසින් මේ සඳහා මැදිහත් වී වාලච්චේන ප්‍රදේශයේ ඉඩම් කට්ටි නිදහස් කර ගැනීමට කටයුතු කරමින් සිටී.

5) වත්මන් තත්ත්වයන් පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම සඳහා අදාළ සංගම් සමඟ වරින් වර රැස්වීම් සංවිධානය කර ඇත.

6) විවිධ රාජ්‍ය ආයතනවල ඔවුන්ගේ පාවහන් සහ සම් භාණ්ඩ අවශ්‍යතා මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු වලට සහභාගී වීම.

7) සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ සහ මොරටුව විශ්වවිද්‍යාලයේ විලාසිතා නිර්මාණ විෂය මාලාව හදාරන සිසුන්ගේ අවසන් වසර ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම.

8) කර්මාන්තකරුවන්ට අවශ්‍ය යන්ත්‍ර සේවා පහසුකම් ලබා දීමෙන් ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මක බව ඉහළ නැංවීම මෙන්ම නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම. අදාළ කාලසීමාව තුළ මාසිකව කර්මාන්තකරුවන් 144 දෙනෙකුට සේවා සපයා ඇත. එමඟින් උපයාගත් ආදායම රු. 261,458/- කි.

9) කර්මාන්තයට අවශ්‍ය පුද්ගලයන් සහ ආයතන පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ පවත්වාගෙන යාම. මේ හරහා අවශ්‍ය පුද්ගලයන්ට අදාළ තොරතුරු ලබාගත හැකිය. ආයතන/ පුද්ගලයින් 540 කගේ තොරතුරු පද්ධතියක් යාවත්කාලීන කරමින් පවතී.


10) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන්ගේ අර්ධ වාර්ෂික හා වාර්ෂික විභාගවලට අදාළ ප්‍රශ්න පත්‍ර සකස් කිරීම සහ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම.

11) RPL හරහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ලබා ගැනීමට ව්‍යවසායකයින්ට පහසුකම් සලසා ඇත. මෙමඟින් පුද්ගලයින් 18 දෙනෙකු NVQ සහතික ලබා ගන්නා ලදී.

12) 2022 වර්ෂයේ මධ්‍යස්ථානයේ මුළු ආදායම රු.3,200,136.00 කි.


4.9.1 වගුව: 2022 වර්ෂයේ ප්‍රගති සාරාංශය

අංකය	ක්‍රියාකාරකම	මූල්‍ය ප්‍රගතිය (රු.)
1	**නව ව්‍යාපාර නිර්මාණය කිරීම**	
1.1	පාවහන් තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම	1,064,986
1.2	බෑග් නිෂ්පාදන තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම	235,132
1.3	සම් භාණ්ඩ තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම	53,000
2	**පවතින කර්මාන්ත / ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම**	
2.1	තත්ත්ව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම	1,123,364
2.2	කර්මාන්තකරුවන්ට සැකසුම් පහසුකම් ලබාදීම	261,458
2.4	ව්‍යවසායකයින් / කර්මාන්තකරුවන් / රාජ්‍ය සහ බාහිර සංවිධාන සඳහා සකස් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම	285,014
3	**විශේෂ සේවා**	
3.1	NVQ සහතික ලබා ගැනීමට පහසුකම් සැලසීම	27,000
3.3	අමුද්‍රව්‍ය විකුණුම් මධ්‍යස්ථානය	150,182
එකතුව		**3,200,136**



4.9.2 වගුව: සත්‍ය ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම

වර්ෂය	Vat සහ NBT නොමැතිව සත්‍ය ආදායම (රු.)
2019	6,476,884
2020	5,200,839
2021	4,892,789
2022	3,200,136



පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය ඉහළ ශ්‍රම ශක්තියක් අවැසි කර්මාන්තයක් වන අතර රැකියා උත්පාදනය කිරීමට සහ විදේශ විනිමය ඉපැයීමට එයට විශාල හැකියාවක් ඇත. සම්භාණ්ඩ අංශය යනු අගය එකතු කළ ඉහළ අපනයන ගුණාත්මකභාවයකින් යුත් සියුම් භාණ්ඩ නිෂ්පාදනය කරන අත්‍යවශ්‍ය අංශයකි. තවද, මෙම මධ්‍යස්ථානය විසින් අපනයන විභවයන් උපයෝගී කර ගුණාත්මක නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය සහ පුහුණුව යන දෙකම ලබා දෙන අතරම, වර්ණවත් රබර් තොන්ග් වල සිට උසස් තත්ත්වයේ අව්‍යාජ සම් සපත්තු දක්වා නිෂ්පාදන මාලාවක් නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. ශ්‍රී ලාංකීය පාවහන් නිෂ්පාදකයින්, හුදු නිෂ්පාදකයා ඉක්මවා යමින් නිර්මාණාත්මක නිර්මාණ සහ නිෂ්පාදන විසඳුම් සපයන්නන් බවට පත්වී ඇත. පාවහන් අඩි (sole crepe) සහ විශිෂ්ට සම් නිෂ්පාදනය කිරීම සඳහා ස්වභාවික රබර් වැනි උසස් තත්ත්වයේ සම්පත් දේශීය වශයෙන් ලබා ගැනීමට ඇති හැකියාව; සහ තිරසාර නිෂ්පාදන ක්‍රියා පටිපාටි විසින් ශ්‍රී ලාංකීය පාවහන් නිෂ්පාදකයින්ට සෙසු අයට වඩා තරහකාරී වාසියක් ලබා දී ඇත. සකසන ලද සම් නිෂ්පාදනයට අමතරව, සම් නිෂ්පාදන නිෂ්පාදකයින් පරිසර හිතකාමී සහ තිරසාර නිෂ්පාදන තත්ත්වයන් යටතේ අපනයන වෙළෙඳපොළ සඳහා අත්වැසුම්, පසුම්බි, බෑග්, පර්ස් සහ අනෙකුත් උපාංග නිෂ්පාදනය කරයි. ශ්‍රී ලංකාවේ පාවහන් සහ සම්භාණ්ඩ කර්මාන්තය රටට අපනයන ආදායමක් උපයා දෙන අගය එකතු කළ නිෂ්පාදන අංශයක් ලෙස හඳුනාගෙන ඇත.

මෙම අංශයේ සත්‍ය ආදායම් විසරණ සටහන සම්බන්ධයෙන් ගත් කල, කාලයත් සමඟ ආදායම ක්‍රමයෙන් අඩු වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. මෙම පහත වැටීමට එක් හේතුවක් වන්නේ ශ්‍රී ලාංකීය පාවහන් නිෂ්පාදනවල මිලෙහි පවතින තරහකාරීත්වය හේතුවෙන් නඩත්තු කිරීම, තත්ත්ව පාලනය, ක්‍රියාවලි සැලසුම් කිරීම සහ පරීක්ෂා කිරීම යනාදිය සඳහා සම්මත තාක්ෂණික ක්‍රම යෙදීමේ දී පසුගාමී වීමයි. ජාත්‍යන්තර පාවහන් සමාගම් හා සසඳන විට තවදුරටත් නිෂ්පාදන සංවර්ධනය කිරීම පාවහන් කර්මාන්තයේ ප්‍රායෝගිකව නොපවතී. මූල්‍යමය බාධාවන් හේතුවෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ නොහැක. අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා නිෂ්පාදන සංවර්ධනය වැදගත් වුවද, මහා පරිමාණ නිෂ්පාදකයින් පවා නිෂ්පාදන සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමට මැලිකමක් දක්වයි. අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් හා සසඳන විට පාවහන් කර්මාන්තයේ පුහුණුව සඳහා ඇති පහසුකම් අවම වේ. මෙයට හේතුව පුහුණු ආයතන නොමැතිකමයි. මේ සඳහා එක් පුහුණු මධ්‍යස්ථානයක් පමණක් පවතින අතර එය IDB යටතේ පවතී. පහසුකම් නොමැතිකම සහ පවතින සම්පත් පිළිබඳ දැනුවත්භාවය නොමැතිවීම හේතුවෙන් පිරිනමන ලද පුහුණු පාඨමාලා සඳහා ද සහභාගිවන්නන් සංඛ්‍යාව අඩුය.

නිෂ්පාදන ක්‍රියාවලියෙන් හොඳම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා අමුද්‍රව්‍ය ගුණාත්මක තත්ත්වයේ තිබිය යුතුය. පාවහන් කර්මාන්තය සඳහා විශේෂයෙන් අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීම, තත්ත්ව පරීක්ෂණය සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය රසායනාගාර පහසුකම් නොමැතිකම හේතුවෙන් ශ්‍රී ලාංකේය නිෂ්පාදකයන්ට ගෝලීය තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමට අපහසු වේ. මීට අමතරව, දේශීයව නිෂ්පාදනය කරන නිෂ්පාදන කෙරෙහි මහජනතාවගේ පවතින සෘණාත්මක ආකල්ප හේතුවෙන් ද ශ්‍රී ලාංකේය පාවහන් කර්මාන්තය පීඩා විඳී. යන්ත්‍රෝපකරණ නිෂ්පාදකයින් ද මෙම ගැටලුවට මුහුණ දෙති. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගුණාත්මක මට්ටමින් පැවතිය ද දේශීය පාරිභෝගිකයින් විසින් මෙම නිෂ්පාදන ප්‍රතික්ෂේප කරනු ලබයි. චීනය, තායිලන්තය, වියට්නාමය, හොංකොං වැනි රටවලින් අඩු මිලට පාවහන් රැගෙන ඒම නිසා දේශීය පාවහන් කර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල වී තිබේ. නවීන තාක්ෂණය භාවිතය සහ වැඩි ප්‍රමාණයන්ගෙන් නිෂ්පාදනය කිරීම හේතුවෙන් ඒවායේ නිෂ්පාදන පිරිවැය ශ්‍රී ලංකාවේ කර්මාන්තයට වඩා බෙහෙවින් අඩුය.

අතීතයේ දී මෙම කර්මාන්තයේ ව්‍යාප්තිය ක්‍රමානුකූලව සිදු වූ අතර, අද වන විට උසස් තත්ත්වයේ පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන පෙළක් මෙරට තුළ නිෂ්පාදනය කරනු ලබයි. සම්භාණ්ඩ කර්මාන්තය ඉහළ ශ්‍රම ශක්තියක් සහිත කර්මාන්තයක් බවට පත්වන අතරම, රටේ ආර්ථිකයට ප්‍රධාන දායකයෙකු වීමේ හැකියාව පෙන්නුම් කරයි. අපනයන සංවර්ධන මණ්ඩලයෙන් ලබාගත් දත්තවලට අනුව, මේ වන විට කර්මාන්තය තුළ සෘජුව සහ වක්‍රව 40,000ක් පමණ රැකියාවේ නිරත වන අතර, එයට විශාල සමාගම් 5ක්, මධ්‍ය පරිමාණ සමාගම් 30ක් සහ කුඩා පරිමාණ නිෂ්පාදකයින් 3000ක් පමණ ඇතුළත් වේ. කැන්වස් සහ රබර් බූට්, පටි, ක්‍රීඩා සපත්තු, ලෙදර් සපත්තු ආදී නවීන පාවහන් රාශියක් විවිධ අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදනය කෙරේ.

මෙම අංශය ශක්තිමත් කිරීම සඳහා, පිරිස් පුහුණු කිරීම සහ තාක්ෂණය ලබාදීම සඳහා වෙනම උපාය මාර්ග භාවිතා කිරීමට සිදු විය හැකිය. පාවහන් නිෂ්පාදකයින්, උපාංග සැපයුම්කරුවන්, සම්භාණ්ඩ නිෂ්පාදකයින්, පාවහන් නිෂ්පාදන යන්ත්‍රෝපකරණ නිෂ්පාදකයින්, විශ්ව විද්‍යාල සහ වෙනත් පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ රබර් කර්මාන්තය ශ්‍රී ලංකාවේ පාවහන් නිෂ්පාදන අංශයේ ප්‍රධාන කොටස්කරුවන් ලෙස හඳුනාගෙන ඇත. මෙම අංශය දියුණු කිරීම සඳහා ඉහත සඳහන් කළ සියලුම පාර්ශ්වකරුවන් වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. මෙම අංශයේ අභිවෘද්ධිය සඳහා පර්යේෂණ හා සංවර්ධනය අත්‍යවශ්‍ය අංගයක් වන බැවින්, කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇඟලුම් ආයතනය (SLITA) සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA) ඇතුළු ආයතන ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන ලෙස සම්භාණ්ඩ කර්මාන්තයේ ප්‍රගතිය වේගවත් කිරීමට සාමූහිකව මූලිකත්වය ගත යුතුය.

4.10 රබර් භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය

4.10.1 හැඳින්වීම

දේශීය රබර් ආශ්‍රිත කර්මාන්ත වලට සහාය වීම සඳහා ලෝක බැංකුවේ උපදෙස් හා මූල්‍ය ආධාර යටතේ 1980 දී පැලියගොඩ රබර් නිෂ්පාදන සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. රබර් නිෂ්පාදන කර්මාන්තය සමස්ත ජාතික අපනයනවලින් 8%ක් වන 4 වැනි විශාලතම අපනයන උපයන කර්මාන්තය වන අතර එහි ගුණාත්මකභාවය සහ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් ජාත්‍යන්තරව කීර්තියක් අත්කර ගෙන ඇත. අමු රබර් පිරිසැකසුම් කිරීම මගින් අගය එකතු කළ රබර් නිෂ්පාදන ගණනාවක් ශ්‍රී ලංකාව නිෂ්පාදනය කරනු ලබයි. මහා පරිමාණ මෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ කාණ්ඩ යටතේ රබර් නිෂ්පාදන නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් සිටී. අපනයනය ඉලක්ක කරගත් රබර් කර්මාන්තශාලා බොහොමයක් මහා හා මධ්‍ය පරිමාණයේ ඒවා වන අතර ඒවා ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාත තුළ විසිරී පවතී. ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගුණාත්මක භාවයෙන් යුතු අමු රබර් පිරිසැකසුම් කිරීම මඟින් අගය එකතු කළ රබර් නිෂ්පාදනය කිරීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මූලිකත්වයෙන් කටයුතු කරනු ලැබේ.

රබර් භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය විසින් තාක්ෂණ සේවා සහ තොරතුරු, විශේෂඥ උපදේශක සේවා සහ රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධ උපදෙස් සේවා ආදිය සපයා දෙනු ලබයි. මෙම අංශය සතුව රබර් පටි, බීඩින්, වෛද්‍ය, කාර්මික සහ ගෘහ අත්වැසුම් වැනි රබර් කිරි ආශ්‍රිත නිෂ්පාදන, හෝස්, වාහන අමතර කොටස්, කාර්මික උපාංග, ටයර්, ටියුබ්, මෝටර් රථ ටයර් වැනි කාර්මික නිෂ්පාදන, සහ පාපිසි, බුමුතුරුණු, ක්‍රීඩා භාණ්ඩ, පාවහන්, උණු වතුර බෝතල් සහ ඒ ආශ්‍රිත උපාංග වැනි සාමාන්‍ය රබර් නිෂ්පාදන ආදියෙන් සමන්විත පුළුල් පරාසයකට අයත් නිෂ්පාදන පෙළක් පවතී.

මෙම අංශයෙහි සිටින විවිධ දක්ෂතාවයන් සහ පළපුරුද්ද සහිත තාක්ෂණවේදීන් සහ මෝස්තර නිර්මාණ ශිල්පීන් නිසා රබර් භාණ්ඩ නිෂ්පාදකයින්ට වෙළඳ පොළෙහි පවතින දැඩි සහ තරහකාරී අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි නිෂ්පාදන සිදු කිරීමට අවස්ථාව උදා වී ඇත. තවද, රබර් සහ රබර් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා ආයතන කිහිපයක් හරහා රජය තම සහය ලබාදේ. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, කර්මාන්ත අමාත්‍යාංශය, කාර්මික සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු රාජ්‍ය ආයතන විවිධ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරමින් මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනයට සම්බන්ධ වේ.

එම අංශය මඟින් සපයනු ලබන අනෙකුත් සේවාවන් කිහිපයක් පහත දැක්වේ.

- නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය.
- පරීක්ෂණ පහසුකම් සහ තත්ත්ව සහතික ලබා දීම.
- තාක්ෂණික උපදේශන සහ ව්‍යාප්ති සේවා සැපයීම.
- අර්ධ වාණිජ සේවා සැපයීම.
- අධ්‍යාපනික, පර්යේෂණ සහ සංවර්ධන ආයතන හා කර්මාන්ත අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

4.10.2 අංශයේ ක්‍රියාකාරකම්

\

$ • ව්‍යාප්ති සහ උපදේශන සේවා

  ✓ ව්‍යාපෘති සැකසීම සහ ඇගයීම

- ✓ පිරියත සහ යන්ත්‍රෝපකරණ සැලසුම සකස් කිරීම
- ✓ නිෂ්පාදන ක්‍රියාවලි පිළිබඳ තාක්ෂණික දැනුම ලබා දීම
- ✓ තාක්ෂණික ගැටළු සඳහා විසඳුම් ලබාදීම
- ✓ වැඩසටහන් පැවැත්වීම (දැනුවත් කිරීමේ වැඩසටහන්, ආදර්ශන, තාක්ෂණ හුවමාරු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු)
- ✓ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම
- ✓ වෙළඳපොල පිළිබඳ මූලික උපදෙස් සහ උප කොන්ත්‍රාත් ලබාදීම
- ✓ යන්ත්‍රෝපකරණ සහ අමුද්‍රව්‍ය තෝරා ගැනීම

\

$ • තත්ත්ව පාලනය සහ නිෂ්පාදන පරීක්ෂා කිරීම

- ✓ තත්ත්ව සහතික - රබර් සංයෝග
- ✓ ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව අමුද්‍රව්‍ය, රබර් සංයෝග පරීක්ෂා කිරීම

\

$ • නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය

- ✓ රබර් නිෂ්පාදන සහ සංයෝග සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම
- ✓ නියැදි නිෂ්පාදනය කිරීම
- ✓ ඩයි සහ අච්චු පරීක්ෂාව පිළිබඳ උපදෙස් ලබා දීම

$ • අර්ධ වාණිජ ක්‍රියාකාරකම්

- ✓ රබර් කිරි සහ වියළි රබර් සංයෝග සැපයීම
- ✓ ලෝහ බන්ධන සහ අච්චු ගැලවුම්කර ද්‍රව්‍ය සඳහා රබර් ලබා දීම
- ✓ පවතින යන්ත්‍ර භාවිතය සඳහා පහසුකම් සැපයීම



4.10.1 වගුව: 2022 වර්ෂයේ මධ්‍යස්ථානයේ කාර්යසාධනය

#	සේවාවන්	මිනුම් දර්ශකය	සංඛ්‍යාව
අ)	තාක්ෂණය හුවමාරු කිරීම 1. ප්‍රායෝගික ආදර්ශ 2. වැඩමුළු : රබර් කොහු නිමැවුම් නිෂ්පාදන කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 3. දැනුවත් කිරීමේ වැඩසටහන් (MPI සමග අවබෝධතා ගිවිසුම් යටතේ)	වැඩසටහන් / සේවාලාභීන් සංඛ්‍යාව	(10/28) (04/58) (02-මොණරාගල, කුරුණෑගල/ 48)
ආ)	පරීක්ෂණ පහසුකම් (මීට අපනයන වෙළෙඳපොළ සඳහා රබර් නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් සඳහා පරීක්ෂණ පහසුකම් ලබා දීම ඇතුළත් වේ.)	රැකියා සංඛ්‍යාව පරීක්ෂණ සංඛ්‍යාව	30 142
ඇ)	නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය	රැකියා සංඛ්‍යාව	12

4.10.3 සංවර්ධන ක්‍රියාකාරකම්:

2022 වර්ෂය තුළ පහත සඳහන් සංයෝග නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම, තත්ත්ව වැඩිදියුණු කිරීම සහ නිෂ්පාදන සංවර්ධන කටයුතු නිම කිරීම ද මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදී.

අ)	**සංයෝග සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම** **විශේෂ රැකියා සඳහා සිදුකරන ලද නිෂ්පාදන**
i	බෝල කපාටය
ii	කෙසෙල් කෙඳි කොහු බඳුන
iii	ඇඹරුම් රබර් මුදුන
iv	යන්ත්‍ර සඳහා භාවිතා කරන රබර් ගෑස්කට්
v	මඩ රෝදය
vi	පිරවුම් යන්ත්‍ර වැස්ම
vii	තෙල් මුද්‍රාව (Oil Seal)
viii	ජැක් සීල්
ix	මිල් ටැංකි රබර් ඇසුරුම්
x	ගෑස්කට් මුද්‍රාව
ආ)	**තත්ත්ව වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් - සහතික 142**
	විශේෂ නිෂ්පාදන
i	ටයර්වල නැවත පිරවුම සඳහා භාවිතා වන ටයර් පතු - CTB
ii	ටයර්
iii	රබර් රේල් පෑඩ්
iv	ලේටෙක්ස් බෙන්ඩ්
v	රබර් හැන්ඩ්ල්
vi	ආරක්ෂිත සපත්තු අඩි
vii	රබර් බීඩිං
viii	ජල මුද්‍රාව
ix	බර කිරන යන්ත්‍ර සඳහා රැඳවුම
x	පිහිනුම් තොප්පි

ඇ)	**ප්‍රධාන නිෂ්පාදන සංවර්ධනය කිරීමේ රැකියා**
	නිෂ්පාදනය
i	රබර් බිලෝ
ii	පිඩන බැලූන්
iii	රබර් බුෂ්
iv	ජල මුද්‍රාව
v	සෝපානය සඳහා රබර් රැඳවුම්
vi	බරැති ට්‍රක් රථ සඳහා රබර් රැඳවුම්
vii	O හැඩති රබර් මුද්‍රාව
viii	බ්‍රේක් වොෂර්
ix	ෆ්ලෙට් සීල්
x	යන්ත්‍ර කොටස්
xi	රබර් තීන්ත (කාබන් දැලි විසරණ)

නව ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම සහ දැනට සිටින ව්‍යවසායකයින් විසින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා වියළි රබර් සහ රබර් කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ ආදර්ශන 10ක්, වැඩමුළු 04ක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් මධ්‍යස්ථානය විසින් පවත්වා ඇත.

4.10.4 වර්ෂය තුළ සිදු කරන ලද ව්‍යාපෘති

- **නව ව්‍යාපාර ඇති කිරීම:**

අයිස් හොකී ක්‍රීඩාවේදී භාවිතා වන් පන්දු, රබර් O- මුද්‍ර, කඳු තරණය කිරීමේදී භාවිතා කරන සපත්තු, ලිප් සීල්, රබර් කප්ලින්, වැනි රබර් නිෂ්පාදනවල ආනයන ආදේශන සඳහා නව කර්මාන්ත හයක් නිර්මාණය කරන ලදී.



මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය

4.10.5 වාර්ෂික ආදායම:

පහත දැක්වෙන පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් යටතේ වාර්ෂික ආදායම උත්පාදනය කිරීමට මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් දායක විය. වර්ෂය තුළ දී මෙම මධ්‍යස්ථානය ස්වයං මූල්‍ය සපයාගනු ලබන ඒකකයක් බවට පත්වීමේ අරමුණ ඉටුකර ගැනීම උදෙසා සතුටුදායක ප්‍රගතියක් අත්කරගෙන තිබේ. ඒ අනුව තාක්ෂණික හා වාණිජ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයාගත් වැට් රහිත ආදායම රු.මි. 26.4ක් විය.


4.10.2 වගුව: භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවි කිරීම්

	ප්‍රමාණය (කි.ග්‍රෑ.)	විකුණුම් වටිනාකම (රු.)	එකතුව (රු.)
විකුණුම්			
අර්ධ වාණිජ කටයුතු	30,600	25,505,668	
			25,505,668
සේවාවන්			
i. ව්‍යාප්ති සහ උපදේශන (302) (ආදර්ශනය/ වැඩමුළුව/උප කොන්ත්‍රාත්තුව)		207,850	
ii. තත්ත්ව පාලනය සහ රසායනාගාර පරීක්ෂණ		443,694	
iii. නිෂ්පාදන සංවර්ධනය		285,828	**937,372**
එකතුව			**26,443,040**
වැට 8%			**2,992,011**
බදු සමඟ එකතුව			**29,435,051**

4.10.3 වගුව : සත්‍ය ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම

වර්ෂය	වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිත සත්‍ය ආදායම (රු.)
2019	21,508,696
2020	18,275,053
2021	23,469,556
2022	26,443,040

4.10.1 ප්‍රස්ථාරය : වාර්ෂික සත්‍ය ආදායම සංසන්දනය කිරීම



ශ්‍රී ලංකාව ලොව පුරා බොහෝ කර්මාන්තවල විප්ලවීය වෙනසක් ඇති කළ ලෝකයේ ප්‍රමුඛතම ස්වාභාවික රබර් නිෂ්පාදකයෙකි. ගුණාත්මක ස්වභාවික රබර් කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා කීර්තියක් උසුලන ශ්‍රී ලංකාවේ, ස්වභාවික රබර් නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් ගෝලීය වෙළෙඳපොළ සඳහා සන ටයර්, සපත්තු සඳහා සෝල් ක්‍රේප් සහ උසස් තත්ත්වයේ ශල්‍ය අත්වැසුම් වැනි රබර් නිෂ්පාදන තිරසාර ලෙස නිෂ්පාදනය කිරීම සඳහා විශේෂත්වයක් ලබා ඇත. IDB හි රබර් භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ වන්නේ දේශීය රබර් භාණ්ඩ නිෂ්පාදන නිෂ්පාදකයින් සඳහා නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනයට පහසුකම් සැලසීමයි. IDB හි රබර් භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ වන්නේ දේශීය රබර් නිෂ්පාදකයින්ගට නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමයි. මීට අමතරව, ගනුදෙනුකරුවන්ගේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා සපයනු

ලබන වෙනත් සේවාවන් වනුයේ රබර් කිරි සහ වියළි රබර් සංයුත කරණය, රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් සැකසුම් කාරක සිල්ලර අළෙවිය, විශේෂ කාර්ය කෘතිම රබර් සංයෝග අළෙවිය, බන්ධන සහ ගැලවුම්කර ද්‍රව්‍ය සැපයීම, නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන යා හැකි යන්ත්‍රෝපකරණ කුලියට දීම යනාදිය වේ. මෙම අංශයේ පසුගිය වසර කිහිපයේ ප්‍රගතිය සලකා බැලීමේදී, ඔවුන්ගේ ආංශික ක්‍රියාකාරකම්වල කාර්ය සාධනයේ අනුක්‍රමික ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර, ව්‍යාපෘති සහ උපදේශන (ආදර්ශන/වැඩමුළු/උප කොන්ත්‍රාත්), තත්ත්ව පාලනය, රසායනාගාර පරීක්ෂණ සහ නිෂ්පාදන සංවර්ධනය යන කාණ්ඩ එම ක්ෂේත්‍රයන්හි අන්තර්ගත වේ. COVID-19 යනු ජීවිත අවදානමක් ඇති කරන ඉතා ඉහළ ආසාදන අනුපාතයක් සහිත වසංගතයක් බැවින් ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සීමා පැනවීමට රජයට සහ සෞඛ්‍ය බලධාරීන්ට සිදු විය. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඕනෑම බාහිර බලපෑමකින් වඩාත්ම අවදානමට ලක්වන බැවින්, මෙම වසංගතයේ බලපෑම 2021 වර්ෂය තුළ ද දක්නට ලැබුණි. කෙසේ වෙතත්, සෘජු තර්ජනය කාලයක් පුරා පැවති නමුත්, සාධාරණ කාල සීමාවක් තුළ බොහෝ අංශ වලට යථා තත්ත්වයට පත් වීමට හැකි විය. පසුගිය වසර කිහිපය තුළ ආදායමේ ප්‍රගතිය අනුව, 2020 වසරේ සිට 2022 දක්වා ආදායම්වල ස්ථාවර වර්ධනයක් දක්නට ලැබේ. පසුගිය දශක තුන තුළ, පුද්ගලික හිමිකාරීත්වය සහිත ශ්‍රී ලාංකීය කර්මාන්ත, අගය එකතු කළ රබර් නිෂ්පාදන සමඟින් ගෝලීය වෙළෙඳපොළට ප්‍රවිෂ්ඨ වී ඇත. ස්වභාවික අමු රබර් පිරිසැකසුම් කිරීම මගින් අගය එකතු කළ රබර් භාණ්ඩ නිෂ්පාදන ගණනාවක් ශ්‍රී ලංකාව විසින් නිෂ්පාදනය කෙරේ. අපනයන සංවර්ධන මණ්ඩලයේ දත්ත වලට අනුව, 2022 වසරේ ශ්‍රී ලංකාවේ සමස්ත ස්වභාවික රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 70,867 කි. මේ වන විට ලෝක ඉල්ලුමෙන් 28.8%ක් සපුරාලනු ලබන ලෝකයේ ප්‍රමුඛතම ඝන ටයර් අපනයනකරු ශ්‍රී ලංකාව වේ. ගෝලීය වෙළෙඳපොළ තුළ රබර් කිරි පදනම් කරගත් අත්වැසුම් සඳහා ද ශ්‍රී ලංකාව ප්‍රසිද්ධියක් උසුලයි.

රබර් යනු පරිසර හිතකාමී අමුද්‍රව්‍යයක් වන අතර, ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ, රබර් නිමැවුම් නිෂ්පාදනය කිරීම සඳහා බාධාවකින් තොරව ස්වභාවික රබර් ලබා ගැනීම, පුහුණු කළ හැකි පුහුණු ශ්‍රම බලකායක් පැවතීම ජාත්‍යන්තර වෙළඳපොලේ අවශ්‍යතා සපුරාලීමට උපකාරී වන අතර, සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා යටිතල පහසුකම් සහ රජයේ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම මෙම කර්මාන්තයේ ව්‍යාප්තිය සඳහා ඇති විභවයන් කිහිපයකි. මීට අමතරව, අමු රබර් නිෂ්පාදන වැඩි කිරීම සහ නිෂ්පාදිත රබර් නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා IDB විසින් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කරයි. තවද ශ්‍රී ලංකාවේ මෙන්ම ලොව පුරා රබර් අංශය සඳහා ස්ථාපිත වූ කර්මාන්තයක් පවතින අතර, ස්වාභාවික රබර් ලබාගත හැකි වීම, නිෂ්පාදන කර්මාන්තයේ පුහුණු ශ්‍රම බලකාය, විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට දිරිගැන්වීම්, ශ්‍රම බලකායක් පැවතීම, ශ්‍රම ප්‍රමිතීන්ට සහ සදාචාරාත්මක පරිචයන්ට අනුකූල වීම රබර් කර්මාන්තය සතු වාසි කිහිපයක් වන අතර එය මෙම විශේෂිත අංශයේ කැපී පෙනෙන කාර්ය සාධනය සඳහා හේතු වී ඇත. අනෙක් අතට, අමුද්‍රව්‍ය ප්‍රමාණවත් නොවීම, මිල උච්චාවචනය වීම, පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රමාණවත් නොවීම, පරීක්ෂණ සඳහා සහ සහතික ලබා ගැනීම සඳහා අධික පිරිවැය, යන්ත්‍රෝපකරණ සහ තාක්ෂණ හුවමාරුව සඳහා දැරිය නොහැකි පිරිවැය, බලශක්ති පිරිවැය සහ නිෂ්පාදන පිරිවැය මෙම අංශයේ නිරත වන නිෂ්පාදකයින් මුහුණ දෙන බාධාවන් වේ.

මෙම අංශය සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මෙම අංශය මුහුණ දෙනු ලබන බාධාවන් මුලිනුපුටා දැමීම සඳහා රජයේ සහයෝගය ඉතා වැදගත් වන අතර, රබර් සහ රබර් නිෂ්පාදන කර්මාන්තයේ සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා පිහිටුවා ඇති ආයතන කිහිපයක් හරහා එම සහයෝගය ලබාදෙනු ලබයි. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, කර්මාන්ත අමාත්‍යාංශය, කාර්මික සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු රාජ්‍ය ආයතන එම බාධක ජය ගැනීම සඳහා විවිධ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වී ඇත.



(05) මූල්‍ය සමාලෝචනය

5.1 විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

5.2 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

5.3 හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය

5.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

5.5 වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ගණන්දීමේ නිලධාරියාගේ සහතිකය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) මූල්‍ය ප්‍රකාශන 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ අංක 35 වගන්තියෙන් නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රය සහ ආකාරය අනුව 1971 අංක 38 මුදල් පනත, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKASs) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs) අනුව සකස් කර ඇති අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සහ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සඳහන් සටහන් සහ උපලේඛන සමඟින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

රේඛීය අමාත්‍යාංශය වන කර්මාන්ත අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය වැනි අනෙකුත් නියාමන ආයතන විසින් නියම කරන ලද මූල්‍ය නීති රීති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව කටයුතු කර ඇති අතර, ගනුදෙනුවල යෝග්‍යතාවය සහ සියලු වියදම්වල කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා පාලන පද්ධති හැකිතාක් ප්‍රායෝගිකව පවත්වා ගෙන ගොස් ඇත. මගේ දැනුම සහ විශ්වාසයන් අනුව, මූල්‍ය ප්‍රකාශන සතුටුදායක ලෙස සකස් කර ඇති අතර, ඒවා මණ්ඩලයේ (IDB) මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරයි.

වෛද්‍ය සාරංග අලහප්පෙරුම
සභාපති
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

2023 ඔක්තෝබර් 25

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	සටහන	2022	2021 (නැවත ප්‍රකාශිත)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**14**	502,360,689	513,322,135
ආයෝජන දේපළ	**15**	1,184,511,500	1,115,563,290
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	**16**	38,614,504	88,041,066
		1,725,486,692	**1,716,926,491**
ජංගම වත්කම්			
බඩු තොග	**17**	48,008,293	25,947,972
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	**18**	25,300,172	24,546,068
වෙනත් ජංගම වත්කම්	**19**	44,914,025	48,626,679
තැන්පතු සහ කළින් කල ගෙවීම්	**20**	79,033,112	68,612,747
ලැබිය යුතු - විශේෂ ව්‍යාපෘති	**21**	9,348,448	13,556,140
මුදල් සහ මුදල් හා සමාන දෑ	**22**	344,946,349	220,045,122
		551,550,398	**401,334,727**
මුළු වත්කම්		**2,277,037,091**	**2,118,261,218**
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
විලම්බිත ප්‍රාග්ධන ප්‍රදාන	**23**	258,785,672	304,455,733
ප්‍රාග්ධන සංචිත		6,243,013	6,243,013
පවරා දෙන ලද වත්කම් වල වටිනාකම	**24**	13,447,061	13,447,061
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය	**25**	960,696,320	960,696,320
විලම්බිත රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන ව්‍යාපෘති	**26**	581,577,397	556,547,142
		1,820,749,463	**1,841,389,269**
සමුච්චිත පාඩු	**27**	(86,208,374)	(206,316,490)
මුළු හිමිකම්		**1,734,541,090**	**1,635,072,778**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	**28**	206,829,087	206,131,395
විශේෂ ව්‍යාපෘතිය සඳහා ප්‍රදාන	**29**	661,300	-
		207,490,387	**206,131,395**
ජංගම වගකීම්			
රජයට ගෙවිය යුතු හිඟ	**30**	54,929	74,854
සංස්ථාවලට ගෙවිය යුතු හිඟ	**31**	7,759,526	8,195,765
උපචිත වියදම් හා වෙන්කිරීම්	**32**	327,191,159	268,786,425
		335,005,614	**277,057,044**
මුළු හිමිකම් සහ වගකීම්		**2,277,037,091**	**2,118,261,218**

පිටු අංක 06 සිට 33 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

ජේ.එම්.ආර්.එස්.ජයසිංහ
අධ්‍යක්ෂ (මුදල්)
දිනය: 2023/10/25

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන්නේය. මෙම මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් 2023 ඔක්තෝම්බර් 25 දින අත්සන් කරන ලදී.

වෛද්‍ය සාරංග අලහප්පෙරුම	සුරංග මෙන්ඩිස්	එච්.එම්. රන්ජිත් කිරිඇල්ල
සභාපති	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	සටහන්	2022	2021 (නැවත ප්‍රකාශිත)
ආදායම	05	496,373,430	394,565,726
අලෙවි සහ සේවා පිරිවැය	06	(319,298,547)	(278,614,556)
දළ ලාභය		**177,074,883**	**115,951,170**
පොලී ආදායම	07	14,955,664	5,812,667
වෙනත් ආදායම්	08	168,171,224	106,106,069
රජයේ පුනරාවර්තන ප්‍රදාන	09	505,400,000	465,750,000
පරිපාලන වියදම්	10	(693,725,247)	(624,810,763)
විකිණීම සහ බෙදා හැරීමේ වියදම්	11	(67,189,699)	(8,902,791)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල		**104,686,825**	**59,906,352**
මූල්‍ය පිරිවැය	12	(1,070,001)	(588,050)
බදු ගෙවීමට පෙර ශුද්ධ ආදායම / (පාඩුව)		**103,616,824**	**59,318,302**
වෙනත් විස්තීර්ණ ආදායම්	13	15,052,636	15,123,409
වර්ෂය සඳහා ශුද්ධ ආදායම / (පාඩුව)		**118,669,460**	**74,441,711**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
අරමුදල් සහ සංචිත වෙනස්වීම් ප්‍රකාශය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	විලම්භිත ප්‍රාග්ධන ප්‍රදාන	ප්‍රාග්ධන සහ සංචිත	පවරා දෙන ලද වත්කම් වටිනාකම	ප්‍රත්‍යාගණන අතිරික්තය	විලම්බිත රජයේ ප්‍රදාන - ව්‍යාපෘති	සමුච්චිත අතිරික්තය / හිඟය	එකතුව
2021 ජනවාරි 01 දිනට ශේෂය	**341,681,267**	**6,243,013**	**13,447,061**	**960,696,321**	**565,219,549**	**(272,134,396)**	**1,615,152,814**
පෙර වර්ෂයේ ගැලපීම්	-	-	-	-	-	(8,623,806)	(8,623,806)
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	74,441,711	74,441,711
රජයේ ප්‍රදාන	32,230,000	-	-	-	42,097,219	-	74,327,219
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය	(69,455,534)	-	-	-	(50,769,626)	-	(120,225,160)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**304,455,732**	**6,243,013**	**13,447,061**	**960,696,321**	**556,547,142**	**(206,316,491)**	**1,635,072,778**
2022 ජනවාරි 01 දිනට ශේෂය	**304,455,732**	**6,243,013**	**13,447,061**	**960,696,321**	**556,547,142**	**(206,316,491)**	**1,635,072,778**
පෙර වර්ෂයේ ගැලපීම් (සටහන 26.1)	-	-	-	-	-	1,438,656	1,438,656
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	118,669,460	118,669,460
රජයේ ප්‍රදාන	24,000,000	-	-	-	48,251,112	-	72,251,112
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය	(69,670,060)	-	-	-	(23,220,857)	-	(92,890,917)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**258,785,673**	**6,243,013**	**13,447,061**	**960,696,321**	**581,577,397**	**(86,208,375)**	**1,734,541,090**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	2022	2021 (නැවත ප්‍රකාශිත)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ		
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (පාඩුව)	103,616,824	74,441,711
ගැලපීම්:		
අපහරණ ලාභය	(348,249)	-
ක්ෂයවීම්	64,234,191	58,159,938
ණය සහ අත්තිකාරම් සඳහා වෙන්කිරීම්	-	(426,929)
කම්කරු නඩු සඳහා වෙන්කිරීම්	-	4,294,311
කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනා සඳහා වෙන්කිරීම්	9,860,000	6,831,000
කපා හරින ලද දිගුකාලීන ණයගැති ශේෂයන්	-	1,490,585
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	(92,861,917)	(93,427,864)
බොල් සහ අඩමාන ණය	(312,089)	1,153,440
පොළී ආදායම	(16,464,444)	(7,250,829)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	30,802,998	15,589,728
	98,527,315	60,855,091
ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	(15,052,670)	(12,430,323)
වෙනත් විස්තීර්ණ ආදායම්		
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)	**83,474,645**	**48,424,768**
තොග (වැඩිවීම)/අඩුවීම	(22,060,321)	(7,000,709)
ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම	(442,015)	8,095,903
අනෙකුත් ජංගම වත්කම් (වැඩිවීම)/අඩුවීම	3,712,654	2,355,153
පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම	(10,420,365)	(12,830,097)
ලැබිය යුතු මුදල් - විශේෂ ව්‍යාපෘති (වැඩිවීම)/අඩුවීම	-	(2,444,258)
ණයහිමියෝ සහ ගෙවිය යුතු වියදම් වැඩිවීම/(අඩුවීම)	48,544,733	43,032,253
බැංකු ණය ශේෂය වැඩිවීම/(අඩු වීම)	-	(2,725,171)
සංස්ථාවලට ගෙවිය යුතු මුදල් වැඩිවීම/(අඩුවීම)	(456,164)	881,432
පෙර වර්ෂයේ ගැලපීම්	1,438,656	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**103,791,824**	**77,789,274**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ		
ස්ථාවර තැන්පතු වල ආයෝජන	-	80,029,718
කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ මත ආයෝජනය කල මුදල	(45,431,201)	7,363,811
ආයෝජන දේපළ මත ආයෝජිත වටිනාකම්	(361,737)	-
පොළී ආදායම	16,464,444	7,250,829
අපහරණ දේපළවලින් ලැබූ මුදල්	348,975	-
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම/ඉදිකිරීම	(27,002,180)	(137,294,301)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**(55,981,700)**	**(42,649,943)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ		
ලැබුණු ප්‍රදාන - ප්‍රාග්ධන/විශේෂ ව්‍යාපෘති	63,554,716	44,894,869
ලැබුණු ප්‍රදාන - ප්‍රාග්ධන	24,000,000	32,230,000
විශේෂ ව්‍යාපෘති වල ආයෝජනය	(10,463,612)	(30,442,913)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**77,091,104**	**46,681,956**
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/අඩුවීම	124,901,227	81,821,287
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	220,045,122	138,223,834
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (යොමු සටහන 22)	**344,946,349**	**220,045,121**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. සාමාන්‍ය තොරතුරු (නෛතික ආකෘතිය සහ ස්ථීර ලිපිනය)

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යනු 1969 අංක 36 දරන කර්මාන්ත සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා සහාය වීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යයන් වේ.

2. වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

2.1. සකස් කිරීමේ පදනම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKASs) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනමකින් සකස් කර ඇති අතර වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් හැර, මෙම කාල පරිච්ඡේදය පුරාවට අනුකූල වන ලෙස සංගත භාවයකින් මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගෙන ඇත. අදාළ සටහන් යටතේ ඇති සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් සුදුසු හෙළිදරව් කිරීම් සිදු කරන අවස්ථා හැර, මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර ඇත.

මණ්ඩලයේ මූල්‍ය කාලසීමාව ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා මාස දොළහක (12) කාල සීමාවක් නියෝජනය කරයි.

2.2. දේපළ, පිරියත හා උපකරණ

2.2.1. වත්කම්වල වටිනාකම

සියළුම දේපළ, පිරියත හා උපකරණ මූලික වශයෙන් පිරිවැයට වාර්තා කරන අතර තවදුරටත් ඓතිහාසික පිරිවැයෙන් ක්ෂයවීම් අඩුකර සඳහන් කරනු ලැබේ. අදාළ අයිතම අත්පත් කර ගැනීම සඳහා සෘජුවම දරන ලද පිරිවැය ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන අතර, අයිතමය අත්පත් කර ගන්නා අවස්ථාවේ හෝ කිසියම් කාල පරිච්ඡේදයක් ඇතුළත තොග උපදවීම හැර වෙනත් කාර්යයන් සඳහා එම කාල පරිච්ඡේදය තුළ එම අයිතමය භාවිතා කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනයක් දරනු ලබන බැඳීම වන එම අයිතමය ගලවා ඉවත් කර එම අයිතමය තිබූ ස්ථානය යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා මූලිකව ඇස්තමේන්තු කරන පිරිවැය ද ඓතිහාසික පිරිවැයට ඇතුලත් වේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී, ධාරණ වටිනාකමෙහි යම් වැඩිවීමක් සිදු වුවහොත්, එය පූර්වයෙන් වියදමක් ලෙස හඳුනාගන්නා ලද එම වත්කමටම අදාළ පූර්ව ප්‍රත්‍යාගණන අඩු වීමකට ප්‍රතිවර්තනය නොවන්නේ නම්, එය සෘජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලැබේ. මෙවැනි අවස්ථා වලදී, වැඩිවීම පූර්වයෙන් ලියාගෙන ඇති ප්‍රමාණයට ආදායමක් ලෙස හඳුනාගෙන තිබේ. ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ වටිනාකම අඩුවූ විට, එම අඩුවීම එම වත්කමට අදාළ පූර්ව වැඩිවීමක් ප්‍රතිවර්තනය නොකරන්නේ නම් එය වියදමක් ලෙස හඳුනාගනු ලබන අතර එවැනි අවස්ථාවකදී එම අඩුවීම එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි දරනු ලබන මුදල ඉක්මවා නොයන මට්ටමට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තයක් තිබේ නම් එම අතිරික්තයෙන් එය අයකරනු ලැබේ. වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි කිසියම් ශේෂයක් ඉතිරි වී තිබේ නම්, එය එම වත්කම ඉවත් කිරීමේදී හෝ බැහැර කිරීමේදී සෘජුවම සමුච්චිත ලාභයට / (අලාභයට) මාරු කරනු ලැබේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.2.1. ඉතිරි කොටස....

අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ප්‍රවාහය වීම සිදුවිය හැකි නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණක්, ඉන්පසුව දරනු ලබන පිරිවැය යෝග්‍ය පරිදි වත්කම් ධාරණ වටිනාකමට ඇතුලත් කිරීම හෝ වෙනම ම වත්කමක් ලෙස හඳුනා ගැනීම සිදුකරනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසේ ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. සියලුම අලුත්වැඩියා සහ නඩත්තු වියදම්, එම වියදම් දරන ලද මූල්‍ය කාල පරිච්ඡේදය ඇතුළත ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

2.2.2. ක්ෂයවීම්

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් භාවිතා කිරීම සඳහා සූදානම්ව තිබීම ආරම්භ වූ දිනයේ සිටම ක්ෂයවීම් අඩුකිරීම ආරම්භ වන අතර එම අයිතමය ඉවත් කරන තුරු එම කාල පරිච්ඡේදය තුළ එම උපකරණය ප්‍රයෝජනයට නොගෙන තිබුණ ද, අඛණ්ඩව ක්ෂයවීම් අඩුකරනු ලැබේ. ක්ෂයවීම සරල රේඛීය පදනමකින් දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයේ ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට අය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කිරීම සිදු නොකෙරේ. ඇස්තමේන්තු කල ප්‍රයෝජනවත් ජීවිත කාලයන් පහත සඳහන් පරිදි වේ:

1. ඉඩම් වැඩිදියුණු කිරීම් සහ ගොඩනැගිලි	2.5% (වසර 40)
2. පරිගණක මෘදුකාංග	7% (වසර 14)
3. පිරියත සහ යන්ත්‍ර සූත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, කාර්යාලීය උපකරණ, විද්‍යාගාර උපකරණ, ලී බඩු සහ සවිකිරීම්, පාපැදි, විවිධ වත්කම්, උපයෝජ්‍ය සේවා, PABX පද්ධති සහ වෙනත් වත්කම්	10% (වසර 10)
4. පරිගණක සහ මෝටර් වාහන	20% (වසර 05)
5. මෙවලම්, පොත් සහ ගමන් මලු	25% (වසර 04)

වත්කම් වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් එක් එක් ගිණුම්කරණ කාලය අවසානයේදී සමාලෝචනය කර යෝග්‍ය වන්නේ නම් ගැලපීම් සිදු කරනු ලැබේ.

වත්කමක ධාරණ වටිනාකම එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි නම්, එකෙණෙහිම එම වත්කමෙහි ධාරණ වටිනාකම එහි නැවත අයකර ගත හැකි වටිනාකමට ලියා තබනු ලැබේ.

බැහැර කිරීමේදී සිදුවන ලාභය/පාඩුව බැහැර කිරීමෙන් ලබන මුදල ධාරණ වටිනාකම හා සංසන්දනය කිරීමෙන් තීරණය කරනු ලැබේ. එවැනි ලාභ/පාඩු ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබේ.

2.3. ප්‍රාග්ධනිත නොකරන ලද ඉඩම් පිළිබඳ විස්තර

පහත සඳහන් ඉඩම් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පරිහරණය කරනු ලබන නමුත් මණ්ඩලයට එම ඉඩම් වල නීත්‍යානුකූල හිමිකමක් නොමැති බැවින් මණ්ඩලය ඒවා ප්‍රාග්ධනිත කර නොමැත:

අංකය	ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කය	වර්ගඵලය			භාවිතා කරන කාර්යය	භුක්තිය ලබා ගත් දිනය	අත්පත් කර නොගැනීමට හේතුව	අත්පත් කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය
		අක්කර	රූඩ්	පර්චස්				
1	අනුරාධපුරය		1	20	ප්‍රාදේශීය කාර්යාලය	1971 සිට	රජයේ ඉඩමකි	බුක්තිය ලබා දී ඇත, නමුත් අයිතිය පවරා දී නොමැත
					පොදු සේවා මධ්‍යස්ථානය		රජයේ ඉඩමකි	බුක්තිය ලබා දී ඇත, නමුත් අයිතිය පවරා දී නොමැත.
2	පොළොන්නරුව		3	26.6	ප්‍රාදේශීය කාර්යාලය සහ සංචාරක බංගලාව	1992 සිට	රජයේ ඉඩමකි	දිස්ත්‍රික් ලේකම් වෙත භාර දී ඇත.
3	මාතර	1	1	6.2	ප්‍රාදේශීය කාර්යාලය සහ පොදු සේවා මධ්‍යස්ථානය			අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් - මාතර විසින් ලිපියක් මඟින් මණ්ඩලයට බුක්තිය පවරා දී ඇත.
4	හම්බන්තොට				ප්‍රාදේශීය කාර්යාලය	2006 සිට	ඉඩම සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.	
					සම් භාණ්ඩ මධ්‍යස්ථානය, විතාරන්දෙණිය			ඉඩම අත්පත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.
5	මොණරාගල			48	ප්‍රාදේශීය කාර්යාලය		රජයේ ඉඩමකි	ඉඩම භාවිතා කිරීම සඳහා ලිපියක් මඟින් මණ්ඩලයට බුක්තිය ලබා දී ඇත.
6	බදුල්ල			50	“ගම් උදා” මධ්‍යස්ථානය - මහියංගනය	1997 සිට	නාගරික සංවර්ධන අධිකාරිය විසින් බුක්තිය පවරා ගෙන ඇත.	NADA වෙත භාර දී ඇත.
7	කොළඹ	හෙක්ටයාර 1.2953			ප්‍රධාන කාර්යාලය		රජයේ ඉඩමකි (මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)	ඉඩම අත්පත් කර ගැනීම සඳහා අදාල ආයතන වලට ලිපියක් මඟින් ඉල්ලීම් කර ඇත.
					නවබිම මධ්‍යස්ථානය			
8	කොළඹ	හෙක්ටයාර 0.4046			රබර් සංවර්ධන මධ්‍යස්ථානය	1980 සිට	99 අවුරුදු බදු පදනම් මත	
9	අම්පාර				ප්‍රාදේශීය කාර්යාලය		රජයේ ඉඩමකි	ලිපියක් මඟින් පවරා දී ඇත.
10	කොළඹ	13	2	6	කාර්මික ජනපදය, පානඵව	2006 සිට		නිදහස් දීමනා පත්‍රයක් හරහා හිමිකාරිත්වය IDB වෙත ලබාගෙන ඇත. (2023 පෙබරවාරි 23 දින අත්පත් කර ගන්නා ලදී)
11	බද්දේගම	1	2	0.5	කාර්මික ජනපදය	1992 සිට		ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් පැවරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අතර සාකච්ඡා පවත්වා ඇත.
12	බෙලිඅත්ත	10	0	29.2	කාර්මික ජනපදය	1995 සිට		

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.4. ආයෝජන දේපළ

ආයෝජන දේපළ ආරම්භයේ දී පිරිවැයෙන් හඳුනාගනු ලබයි. ප්‍රධාන අලුත්වැඩියාවන් සහ වැඩිදියුණු කිරීම් සඳහා වන පිරිවැය ප්‍රාග්ධනීත කර ඇත. නඩත්තු කිරීම්, අළුත්වැඩියා කිරීම් සහ සුළු වැඩිදියුණු කිරීම් සඳහා වන පිරිවැය, එය සිදු වූ අවස්ථාවේ දී, ලාභ හා අලාභ තුළ හඳුනා ගැනේ. ආයෝජන දේපළක් බැහැර කිරීමේදී, බැහැර කිරීමෙන් ලැබෙන මුදල සහ ධාරණ වටිනාකම අතර වෙනස ලාභ හා අලාභ තුළ හඳුනා ගනු ලැබේ.

ක්ෂය කිරීම සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සියලු දේපළවල පිරිවැය හෝ තක්සේරුව මත සරල රේඛීය පදනමක් භාවිතා කිරීමෙනි. වාර්ෂික ක්ෂයවීම් අනුපාතය පහත පරිදි වේ:

ඉඩම් වැඩිදියුණු කිරීම් සහ ගොඩනැගිලි - 2.5%

2.5. මූල්‍ය වත්කම්

2.5.1. වර්ගීකරණය

කාර්මික සංවර්ධන මණ්ඩලය මූල්‍ය වත්කම් අත්පත් කර ගත් කාර්යය පදනම් කර ගෙන එහි මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු මුදල් වශයෙන් වර්ග කර ඇත.

ණය සහ ලැබිය යුතු මුදල්:

ණය සහ ලැබිය යුතු මුදල් සක්‍රීය වෙළඳ පොළක මිල ගණන් ප්‍රකාශ නොකළ ස්ථාවර හෝ නිශ්චය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ඒවා ශේෂ පත්‍ර දිනෙන් පසු, මාස 12 ට වැඩි කල්පිරීම් හැරෙන්නට වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වශයෙන් ජංගම වත්කම් වල ඇතුළත් කර ඇත.

2.5.2. මූල්‍ය වත්කම් හඳුනාගැනීම

ණය සහ ලැබිය යුතු මුදල් ආරම්භක අවස්ථාවේදී සාධාරණ වටිනාකමට ගණුදෙනු පිරිවැය එකතුකළ අගයට හඳුනාගනු ලබන අතර ඉන්පසුව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කල පිරිවැයට ගෙනයනු ලැබේ.

2.5.3. මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළහැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වත්කම උපලබ්ධි කර වගකීම් පියවීමේ චේතනාවක් ඇති විට මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම ශේෂ පත්‍රයේ වාර්තා කරනු ලැබේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.5.4. මූල්‍ය වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය කල පිරිවැයට ගෙන යනු ලබන වත්කම් (ණය සහ ලැබිය යුතු මුදල්)

සෑම වාර්තාකිරීමේ කාල පරිච්ඡේදයක් අවසානයේදී ම කාර්මික සංවර්ධන මණ්ඩලය එහි මූල්‍ය වත්කමකට හානි සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවූ සිද්ධීන් (අලාභ සිද්ධි) එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස එම වත්කම් හානිකරණය වී ඇති බවට වෛෂයික සාක්ෂි ඇත්නම් පමණක් සහ එම අලාභ සිද්ධිය (සිද්ධීන්) විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලනයන්ට බලපෑමක් ඇතිකරන්නේ නම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් හානි වී ඇති බවට සලකනු ලබන අතර මණ්ඩලය හානිකරණ පාඩු දරනු ලැබේ. හානිකරණට අදාළ වෛෂයික සාක්ෂි පවතින්නේ ද යන්න කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින්ම තක්සේරු කරයි.

ණය සහ ලැබිය යුතු මුදල් සඳහා අලාභයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකමෙහි සහ වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලනයන් හි (දැනට අලාභය දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස මනිනු ලැබේ. වත්කමෙහි ධාරණ අගය අඩු කරනු ලබන අතර අලාභයෙහි වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

පසුව එළඹෙන කාල පරිච්ඡේදයකදී හානිකරණ අලාභයෙහි වටිනාකම අඩු වන්නේ නම් සහ එම අඩුවීම වෛෂයිකව හානිකරණය හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමකට (ණයගැතියාගේ ණය ශ්‍රේණිගත කිරීමෙහි වර්ධනයක් වැනි) අදාළව විය හැකි නම්, පූර්වයෙන් හඳුනා ගන්නා ලද හානිකරණ අලාභය ප්‍රතිවර්ත කිරීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ පරීක්ෂා කිරීම 2.8 වැනි සටහනෙහි විස්තර කර ඇත.

2.6. මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් වලට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ණයට ගැනීම් ඇතුළත් වේ. ණය හැර අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් ආරම්භක අවස්ථාවේදී ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනා ගනු ලබන අතර ඉන්පසුව, වට්ටම් කිරීමෙහි ප්‍රතිඵලය නොසැලකිය හැකි මට්ටමේ නොමැති නම්, සඵල පොළී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය කල පිරිවැයට ඒවා මනිනු ලබන අතර එවිට ඒවා පිරිවැයට සඳහන් කරනු ලැබේ.

2.7. තොග

තොග වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග තක්සේරු කරනු ලැබේ. සාමාන්‍ය පිරිවැය ක්‍රමය (AVCO Method) යොදා ගනිමින් පිරිවැය තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහි දී තොග විකිණිය හැකි මිලෙන් නිම කිරීමේ ඇස්තමේන්තු කල පිරිවැය සහ විකිණීම සිදුකිරීම සඳහා ඇස්තමේන්තු කල පිරිවැය අඩු කළ විට ලැබෙන මිලයි. තොග ඒවායේ වර්තමාන පිහිටීමට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද පිරිවැය පහත සඳහන් පරිදි ගිණුම්ගත කරනු ලැබේ.

අමුද්‍රව්‍ය	--- පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට
නිම් භාණ්ඩ	--- පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට
ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ	--- සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම් කර ගත් නිෂ්පාදන පොදු කාර්ය වලින් යෝග්‍ය කොටසක පිරිවැයට.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.8. වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියේ දී විකුණන ලද භාණ්ඩ සඳහා හෝ ඉටුකරන ලද සේවා සඳහා ගණුදෙනුකරුවන් ගෙන් අය වීමට ඇති මුදල් වේ. එක් වර්ෂයක් හෝ එයට අඩු කාලයක් තුළ අය කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී එයටත් වැඩි කාලයක් නම්), එම මුදල් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. නොඑසේ නම් ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිය යුතු දේ වලට අදාළ මුල් කොන්දේසි අනුව අයවීමට ඇති සියලුම වටිනාකම් අය කර ගැනීමට නොහැකි වනු ඇතැයි වෛෂයික සාක්ෂි ඇති විට, වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදනයක් පිහිටුවනු ලැබේ. ණයගැතියාගේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බංකොලොත්භාවයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඉඩ තිබීම, ගෙවීම් පැහැර හැරීම හෝ කඩ කිරීම ආදිය වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බව පෙන්නුම් කරන සාධක වේ. ප්‍රතිපාදනයෙහි වටිනාකම, වත්කමෙහි ධාරණ වටිනාකම සහ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කළ ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලනයන් හි වර්තමාන වටිනාකම අතර වෙනස වේ. 2018 වර්ෂයේ සිට පහත සඳහන් පරිදි ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ:

වයස		ප්‍රතිපාදන %
ප්‍රවර්තන වර්ෂය	-	0%
වසර 01 - 02	-	10%
වසර 03 - 05	-	25%
වසර 05 ට වැඩි	-	100%

2.9. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑට අත ඉතුරු මුදල්, බැංකු වල ඇති ඒක්ෂණ තැන්පතු, මාස 03ක හෝ ඊට අඩු මුල් කල්පිරීමේ කාලයක් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහල ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන සහ බැංකු අයිරා ඇතුළත් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ බැංකු අයිරා සෘණ ශේෂයන් ලෙස පෙන්වා ඇත.

2.10. ප්‍රතිපාදන

කාර්මික සංවර්ධන මණ්ඩලයට අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඇති විට, එම බැඳියාව බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලායාමක් සිදුවීම අවශ්‍ය විය හැකි විට සහ බැඳියාවෙහි වටිනාකම විශ්වාසනීය ලෙස තක්සේරු කල හැකි විට ඒ සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

2.11. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ ඉල්ලූ විට හෝ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට නියමිතව ඇති ගෙවිය යුතු දෑ වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණ කර ඇති අයිතම වන්නේ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වර්ෂයකට වැඩි කාල පරිච්ඡේදයක දී ගෙවීමට නියමිතව ඇති වගකීම් වේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.12. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යන්නෙන් අදහස් කරන්නේ සේවකයෙකු විශ්‍රාම ගැනීමේ දී එම සේවකයාට ලැබෙන ප්‍රතිලාභයෙහි වටිනාකම වන අතර එය සාමාන්‍යයෙන් සේවය කර ඇති වසර ගණන සහ වන්දි මුදල (වේතනය) වැනි සාධක එකක් හෝ වැඩි ගණනක් මත රඳා පවතී. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම 1983 අංක 12 දරන පනත යටතේ ලබාදෙන පාරිතෝෂිකයෙන් සමන්විත වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ දිගුකාලීන ස්වභාවය හේතුවෙන්, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ.

නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUC) භාවිතා කර වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ප්‍රතිලාභ ගෙවනු ලබන ව්‍යවහාර මුදලින් බලපවත්වන රජයේ බැඳුම්කර වල පොළී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තු කරන ලද සහ කල්පිරීම සඳහා අදාළ විශ්‍රාම බැඳියාවෙහි කොන්දේසි වලට ආසන්නවන කොන්දේසි සහිත අනාගත මුදල් ගලා යෑම් වට්ටම් කරමින් නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවෙහි වර්තමාන වටිනාකම තීරණය කරනු ලැබේ.

අත්දැකීම් ගැලපීම් සහ ආයු ගණක උපකල්පනයන් හි වෙනස්කම් මඟින් හටගන්නා ආයු ගණක ලාභ සහ පාඩු එම ලාභ හෝ පාඩු හටගන්නා කාල පරිච්ඡේදය තුළ පරිපූර්ණ ආදායමෙහි ස්කන්ධයට අය කිරීම හෝ බැර කිරීම සිදු කරනු ලැබේ.

සැලැස්මෙහි සිදු කරන වෙනස්කම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා (පැවරීමේ කාල පරිච්ඡේදය) සේවයේ රැඳී සිටින සේවකයින්ට කොන්දේසික නොවන්නේ නම් අතීත සේවා පිරිවැය එකෙණෙහි ම පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. මෙසේ කිරීමේ දී, අතීත සේවා පිරිවැය පැවරීමේ කාල පරිච්ඡේදය පුරා සරල රේඛීය පදනමකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.13. නිශ්චිත දායක සැලැස්ම

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම ස්ථිර සහ කොන්ත්‍රාත් සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි (EPF) සහ සේවක භාරකාර අරමුදලෙහි (ETF) සාමාජිකයින් වන අතර, ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අනුපිළිවෙලින් එවැනි සේවකයින්ගේ මූලික වේතනය හෝ වැටුප සහ ජීවන වියදම් දීමනා වලින් 12% සහ 3% බැඟින් දායක මුදල් ගෙවනු ලැබේ.

2.14. ආයෝජන

ආයෝජන, තනි ආයෝජන පදනමින් තීරණය කරන ලද පිරිවැයට ගෙනයනු ලැබේ.

2.15. රජයේ ප්‍රදාන

රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන අතර මෙහි දී ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ කණ්ඩායම ඒ සම්බන්ධිත සියලු කොන්දේසි වලට එකඟ වනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇත.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන මඟින් හිලව් කිරීමට අපේක්ෂිත පිරිවැය සමඟ ගැලපීමට අවශ්‍ය කරන කාල පරිච්ඡේදය පුරා එම ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි විලම්භනය කර හඳුනා ගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ වලට අදාළ රජයේ ප්‍රදාන, විලම්භිත රජයේ ප්‍රදාන ලෙස ජංගම නොවන වත්කම් වල ඇතුළත් කර ඇති අතර, අදාළ වත්කම් වල අපේක්ෂිත ජීවිත කාලය පුරා සරල රේඛීය පදනමකට ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.16. පරිත්‍යාග

පරිත්‍යාග යනු සාමාන්‍යයෙන් අන්‍යෝන්‍ය නොවන මාරුකිරීම් වේ. කෙසේ වුවත්, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් දායකයා වෙත නාම මාත්‍ර ප්‍රතිෂ්ඨාව ලබා දෙන අවස්ථා තිබිය හැක. එවැනි පරිත්‍යාග සඳහා, දායකයින් වෙත ලබාදී ඇති ප්‍රතිෂ්ඨාව, අසාධාරණ හුවමාරු ගනුදෙණුවක් ප්‍රතිඵලය වන තරමට, ලැබුණු පරිත්‍යාගයෙහි ප්‍රතිෂ්ඨාවට වඩා සැලකිය යුතු තරමින් අඩු නම්, ඒවා ලැබුණු පරිත්‍යාග ලෙස හඳුනා ගත යුතුය.

2.17. ආදායම් හඳුනාගැනීම

2.17.1. විකුණන ලද භාණ්ඩ සහ ඉටුකරන ලද සේවා

හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා දී ඇති විට භාණ්ඩ අලෙවි කිරීමෙන් උපයාගත් ආදායම ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. අයවීමට ඇති ප්‍රතිෂ්ඨාව, ආශ්‍රිත පිරිවැය අයකර ගැනීම හෝ භාණ්ඩ ආපසු එවිය හැකි වීම පිළිබඳ සැලකිය යුතු අවිනිශ්චිතතාවයන් තිබේ නම් කිසිදු ආදායමක් හඳුනාගනු නොලැබේ.

2.17.2. පොළී ආදායම

පොළී ආදායම කාල සමානුපාත පදනමකින් හඳුනාගනු ලබන අතර එවැනි ආදායම කාර්මික සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් සිදුකිරීමේ දී විකුණනු ලබන භාණ්ඩ සඳහා හෝ ඉටු කරනු ලබන සේවා සඳහා ලැබෙන හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකමෙන් සමන්විත වේ. එකතු කළ අගය මත බද්ද (VAT), ප්‍රතිලාභය, ප්‍රතිදානය සහ වෙළඳ වට්ටම් තිබේ නම් ඒවායේ ශුද්ධ අගය මඟින් ආදායම පෙන්වනු ලැබේ.

2.18. වියදම් හඳුනාගැනීම

2.18.1. මෙහෙයුම් වියදම්

වියදම් උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ. කාල පරිච්ඡේදය සඳහා ලාභය ගණනය කිරීමේදී සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහි දී සහ කාර්යක්ෂම තත්ත්වයෙන් දේපොළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙහි දී දරන ලද සියලු වියදම් ආදායමට අය කරනු ලැබේ.

2.18.2. ශුද්ධ මූල්‍ය පිරිවැය

ශුද්ධ මූල්‍ය පිරිවැය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබන ණයට ගැනීම් සඳහා ගෙවිය යුතු පොළිය, ආයෝජනය කරන ලද අරමුදල් වලින් ලැබිය යුතු පොළිය සහ විදේශ විනිමය ලාභ සහ පාඩු වලින් සමන්විත වේ.

ණයට ගැනීම් සම්බන්ධයෙන් දරන ලද සියලු පොළී සහ අනෙකුත් පිරිවැය ශුද්ධ මූල්‍ය පිරිවැයෙහි කොටසක් ලෙස වියදම් දරා ඇත.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

3. මූල්‍ය අවදානම් කළමනාකරණය

3.1. මූල්‍ය අවදානම් සාධක

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය උපකරණ බැංකු ණය, කෙටි කාලීන තැන්පතු සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණ වල ප්‍රධාන අරමුණ වන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙහෙයුම් වල ද්‍රවශීලතාව ඉහළ නැංවීම සහ පවත්වා ගෙන යාම සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංචිත මත ලැබෙන ප්‍රතිලාභය උපරිම කිරීමයි. කාර්මික සංවර්ධන මණ්ඩලයට එහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වලින් සෘජුව ම ඇතිවන ලැබිය යුතු වෙළඳ සහ ගෙවිය යුතු වෙළඳ ආදී වශයෙන් වූ වෙනත් විවිධ මූල්‍ය උපකරණ ද තිබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලය විවිධ වූ මූල්‍ය අවදානම් රැසකට නිරාවරණය වී ඇත. අනෙකුත් ඒවා අතර, විදේශ විනිමය අවදානම්, ණය අවදානම්, පොළී අනුපාත අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් මෙයට අයත් වේ. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආර්ථික දර්ශනය සහ මෙම අවදානම් වලට එහි ඇති නිරාවරණය පදනම් කර ගෙන කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලය කලින් කලට විවිධ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායයන් අනුමත කරයි.

සාමාන්‍යයෙන් ණය අවදානමට භාජනය වන මූල්‍ය වත්කම් වල උපරිම අවදානම් තත්ත්වය ඒවායෙහි ධාරණ අගයට සමාන වේ. පහත වගුව මඟින් උපරිම අවදානම් තත්ත්වයන් පෙන්නුම් කර ඇත. (2022.12.31 දිනට)

	වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	මුදල් සහ මුදල් හා සමාන දෑ	එකතුව
අවදානම් නිරාවරණය			
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	25,300,172	-	25,300,172
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	344,946,349	344,946,349
	25,300,172	**344,946,349**	**370,246,521**

3.1.1. පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාතවල සිදුවන වෙනස්කම් නිසා මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ගලනයන් උච්චාවචනය විය හැකි වීමේ අවදානමයි. කාර්මික සංවර්ධන මණ්ඩලය වෙළඳ පොළ පොළී අනුපාත වෙනස් වීමේ අවදානමට ඇති නිරාවරණය මූලික වශයෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි පාවෙන අනුපාත සහිත ණය බැඳීම්වලට අදාළව වේ. කාර්මික සංවර්ධන මණ්ඩලය දෛනිකව මුදල් ගලනයන් අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම, ණයට ගැනීම් අවම මට්ටමක තබා ගැනීම, සහ ණයට ගැනීම හා තැන්පතු සඳහා වාසිදායක අනුපාතයන් ගිවිස ගැනීම ආදී ක්‍රම මඟින් එහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කරයි.

කාර්මික සංවර්ධන මණ්ඩලය විචල්‍ය පොළී අනුපාත යටතේ ණය ලබා ගෙන නොමැති නිසා 2022 දෙසැම්බර් 31 වැනි දිනට කාර්මික සංවර්ධන මණ්ඩලය පොළී අනුපාත අවදානමකට නිරාවරණය වී නොමැත.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

3.1.2. ණය අවදානම

මුදල් සහ මුදල් හා සමාන දෑ, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, සහ බැංකු හා මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම හිඟ ලැබිය යුතු දෑ සහ සිදුකල ගණුදෙනු ද ඇතුළත්ව විදේශ ගණුදෙනුකරුවන්ට ඇති ණය නිරාවරණයන් ආදියෙන් ණය අවදානම ඇතිවේ.

3.2. ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ දී, කාර්මික සංවර්ධන මණ්ඩලයේ අරමුණු වන්නේ කොටස්කරුවන්ට ප්‍රතිලාභ ලබාදීම සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට ප්‍රයෝජන සලසා දීම පිණිස ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට කාර්මික සංවර්ධන මණ්ඩලය සතු හැකියාව ආරක්ෂා කිරීමත්, ප්‍රාග්ධන පිරිවැය අඩුකිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීමත් ය.

කර්මාන්තයේ නියැලී සිටින අනෙකුත් කර්මාන්තකරුවන් හා අනුකූලව, කාර්මික සංවර්ධන මණ්ඩලය තෝලන අනුපාතය පදනමින් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුළු හිමිකම් වලින් මුළු ණයට ගැනීම් ලෙස ගණනය කරනු ලැබේ. මුළු ණය ගැනුම් වලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා ඇති පරිදි ජංගම නොවන සහ ජංගම ණයට ගැනීම් ඇතුළත් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මුළු හිමිකම් හි දක්වා ඇති පරිදි 'මුළු හිමිකම' ගණනය කරනු ලැබේ.

2022 දෙසැම්බර් 31 දිනට තෝලන අනුපාතය පහත සඳහන් පරිදි විය.

	2022	**2021**
මුළු ණයට ගැනීම්	542,496,001	483,188,440
මුළු හිමිකම්	1,734,541,090	1,635,072,778
තෝලන අනුපාතය	**31.28%**	**29.55%**

4. අවිනිශ්චිතතාවයන් සහ විනිශ්චයන් තක්සේරු කිරීමේ ප්‍රධාන මූලාශ්‍ර පිළිබඳ තොරතුරු

තක්සේරු සහ විනිශ්චයන් අඛණ්ඩව ඇගයීම් කරනු ලැබේ. ඒවා ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි, අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ද ඇතුළත් අනෙකුත් සාධක මත පදනම්ව ඇත.

4.1. ඉතා වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන

කාර්මික සංවර්ධන මණ්ඩලය අනාගතය සම්බන්ධ ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ගිණුම්කරණ ඇස්තමේන්තු, ස්වභාවයෙන්ම අදාළ සත්‍ය ප්‍රතිඵල වලට සමාන වන්නේ කලාතුරකිනි. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම් වල ධාරණ වටිනාකමට ප්‍රමාණික ගැලපීමක් සිදු කිරීමට හේතු වන සැලකිය යුතු අවදානමක් සහිත ඇස්තමේන්තු සහ උපකල්පන පහත අනාවරණය කර ඇත.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

4.1. ඉතිරි කොටස...

4.1.1. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන වටිනාකම උපකල්පන කිහිපයක් භාවිතා කරමින් ආයු ගණන පදනමකින් තීරණය කරනු ලබන සාධක කිහිපයක් මත රඳා පවතී. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමේදී යොදාගනු ලබන උපකල්පන වලට වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක අනුපාතය, මරණ අනුපාතිකය, කාර්යභාරයෙන් ඉවත් වීමේ සහ ආබාධිත වීමේ අනුපාතයන් සහ විශ්‍රාම ගැනීමේ වයස ඇතුළත් වේ. මෙම උපකල්පන වලට සිදුකරනු ලබන කිසියම් වෙනස්කමක් මඟින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල ධාරණ වටිනාකම මත බලපෑමක් ඇති කරනු ඇත.

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය (PCU) භාවිතා කරමින් ස්වායක්ත ආයු ගණකයින් අනුව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකම ආයු ගණක තක්සේරුකරු විසින් නිසි පොළී අනුපාත යොදා ගනිමින් ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලා යෑම් වට්ටම් කිරීමෙන් තීරණය කරනු ලැබේ.

විශ්‍රාම බැඳීම් සඳහා වන අනෙකුත් ප්‍රධාන උපකල්පන පවතින වෙළඳපොළ තත්ත්වයන් මත ද අර්ධ වශයෙන් රඳා පවතී. අමතර තොරතුරු 27 වැනි සටහනෙහි අනාවරණය කර ඇත.

4.1.2. දේපළ, පිරියත සහ උපකරණ වල ප්‍රයෝජනවත් ජීවිත කාලයන්

කාර්මික සංවර්ධන මණ්ඩලය, ව්‍යාපාර සැලැස්ම සහ ක්‍රමෝපායයන්, අපේක්ෂිත භාවිත මට්ටම සහ අනාගත තාක්ෂණික වැඩිදියුණු කිරීම් වැනි සාධක පදනම් කරගෙන දේපළ, පිරියත සහ උපකරණ වල ඇස්තමේන්තු කල ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කරයි. ඉහත සඳහන් කල සාධක වල සිදුවන වෙනස්කම් හේතුවෙන් මෙම ඇස්තමේන්තු වල ඇති විය හැකි වෙනස්කම් මෙහෙයුම් වල අනාගත ප්‍රතිඵල වලට ප්‍රමාණික ලෙස බලපෑ හැකිය. දේපළ, පිරියත සහ උපකරණ වල ඇස්තමේන්තු කල ප්‍රයෝජනවත් ජීවිත කාලයෙහි අඩු වීමක් සිදුවීම මඟින් වාර්තාකර ඇති ක්ෂය කිරීම් වැඩිවිය හැකි අතර දේපළ, පිරියත සහ උපකරණ අඩුවිය හැක.

4.2. අවිනිශ්චිත වගකීම්

මුදල් වර්ෂය අවසාන වන විට නඩු 15ක් තිබුණි. කෙසේ වෙතත්, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ නීති අංශය විසින් සපයන ලද තොරතුරු වලට අනුව, මෙම නඩුවල ප්‍රතිඵලය ලෙස කිසිදු වන්දියක් ගෙවීමට සිදුවීමේ හැකියාවක් නොමැත. එබැවින්, ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කිරීමට තුඩුදෙන වගකීමක් පැන නැඟී නොමැත.

4.3. නැවත වර්ගීකරණය කිරීම් සහ සංසන්දනාත්මක සංඛ්‍යා

අවශ්‍ය තැන්හි දී ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනාත්මක බව වැඩිකිරීම සඳහා පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට යම් යම් නැවත වර්ගීකරණය කිරීම් සිදු කර තිබේ. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල කිරීම පිණිස සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත. රේඛීය අයිතමවල සිදු කරන ලද වෙනස්කම් පෙන්වන ඉදිරිපත් කිරීම පිටු 31 සිට 33 දක්වා පෙන්වා ඇත.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

05 ආදායම

5.1 විකුණුම්

	2022	2021 (නැවත ප්‍රකාශිත)
භාණ්ඩ විකිණීම (යොමු සටහන 5.1.1)	62,853,345	48,648,188
අඛලි ද්‍රව්‍ය විකිණීම	324,298,479	251,707,088
කැස්පර් විකිණීම	2,387,855	2,975,464
ප්‍රකාශන අලෙවිය	294,470	185,770
	389,834,149	**303,516,510**

5.1.1 භාණ්ඩ විකිණීම

	2022	2021 (නැවත ප්‍රකාශිත)
ඉංජිනේරු	35,310,417	22,755,969
සම්භාණ්ඩ	1,561,289	1,447,292
රබර්	25,981,639	24,264,348
තාක්ෂණික සේවා	-	180,579
	62,853,345	**48,648,188**

5.2 සේවා

	2022	2021 (නැවත ප්‍රකාශිත)
කුලී - කාර්මික ජනපද	67,065,688	67,646,156
ජල ගාස්තු	7,715,837	6,552,184
අධිභාර	3,519,824	3,001,528
ඉඩම් සහ ගොඩනැගිලි පැවරුම් ගාස්තු	2,022,001	1,550,000
පුහුණු වැඩසටහන්	21,918,414	8,769,408
ව්‍යාපෘති වාර්තා	4,297,517	3,529,941
	106,539,282	**91,049,216**
	496,373,430	**394,565,726**

06 විකුණුම් සහ සේවා පිරිවැය

	2022	2021 (නැවත ප්‍රකාශිත)
විකුණුම් පිරිවැය - සෘජු ද්‍රව්‍ය	44,027,253	23,763,033
විකුණුම් පිරිවැය - කාර්මික ජනපද	4,821,283	5,297,216
විකුණුම් පිරිවැය - අඛලි ව්‍යාපෘතිය	193,317,401	193,749,158
විකුණුම් පිරිවැය - කැස්පර්	1,596,500	2,203,700
විකුණුම් පිරිවැය - සෘජු ශ්‍රමය	5,679,652	5,393,247
විකුණුම් පිරිවැය - සෘජු නොවන ද්‍රව්‍ය	15,803	474,789
සාමාන්‍ය පොදුකාර්ය	1,709,037	1,784,735
යන්ත්‍ර පොදුකාර්ය	1,603,329	1,475,987
යන්ත්‍ර සහ පිරියත නඩත්තු කිරීම	36,000	88,728
විදුලිය	7,247,911	4,302,917
යන්ත්‍ර සහ පිරියත ක්ෂය	8,424,418	5,385,940
ආයෝජන දේපළ මත ක්ෂය - ඉඩම් වැඩිදියුණු කිරීම්	11,474,544	9,866,790
ආයෝජන දේපළ මත ක්ෂය - ගොඩනැගිලි	7,413,026	7,217,418
උපයෝගිතා සේවා ක්ෂය	3,240,396	3,201,740
ඉංජිනේරු වැඩ ගාස්තු	89,250	71,199
උප කොන්ත්‍රාත් ගාස්තු	49,000	124,791
ජල සැපයුම් නඩත්තු කිරීම	-	33,215
කාර්මික ජනපද නඩත්තු කිරීම	2,705,876	2,875,394
රසායනාගාර උපකරණ නඩත්තු කිරීම	468,090	79,745
මෙවලම් සහ අමතර කොටස් නඩත්තු කිරීම	1,028,885	88,962
ප්‍රවාහන ගාස්තු	2,395,245	1,678,455
පුහුණු වැඩසටහන්	20,578,915	9,457,398
"Get up Start up"වැඩසටහන	1,258,563	-
පිරිසැකසුම් ගාස්තු - රබර්	22,800	-
රසායනාගාර පරීක්ෂණ පිරිවැය	95,370	-
	319,298,547	**278,614,556**

07 පොළී ආදායම

	2022	2021 (නැවත ප්‍රකාශිත)
ස්ථාවර සහ කෙටි කාලීන තැන්පතු පොළිය	10,643,966	4,468,620
ඉතිරිකිරීම් පොළිය	4,311,698	1,344,047
	14,955,664	**5,812,667**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

08 වෙනත් ආදායම්

	2022	2021 (නැවත ප්‍රකාශිත)
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	92,861,917	93,427,864
2022 "කර්මාන්ත" ප්‍රදර්ශනය	61,609,386	-
විවිධ ආදායම්	1,574,760	830,336
කොමිස් - උප කොන්ත්‍රාත් හූවමාරු	144,404	-
කොමිස් - ලක්කම් මධ්‍යස්ථාන	7,581,283	3,528,183
කොමිස් - සම් භාණ්ඩ මධ්‍යස්ථානය	142,146	608,430
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,116,000	1,559,300
නොතාරිස් ගාස්තු	186,452	518,862
දඩ	103,448	123,666
වෙබ් අඩවි පළකිරීම් ආදායම	-	2,500
ස්ථාවර වත්කම් අලෙවිකිරීමෙන් ලැබූ ලාභය	348,249	-
රසායනාගාර පරීක්ෂණ සඳහා සේවා ගාස්තු	683,115	656,593
කාර්ය මණ්ඩල ණය පොළිය	1,508,780	1,438,162
ලක්කම් වෙළඳ ප්‍රදර්ශන ආදායම	-	1,707,242
ලක්කම් වෙළඳ ප්‍රදර්ශන වියදම්	-	(1,518,891)
විදුලි ගාස්තු වෙනස් කිරීම් ආදායම	92,273	16,000
උපදේශන ගාස්තු - කුළුබඩු සැකසුම් මධ්‍යස්ථානය,ඇඹිලිපිටිය	-	2,933,333
ධාරිතා අභිප්‍රේරණ දීමනාව / වියදම	(138,400)	(1,079,467)
කාර්ය මණ්ඩල අභිප්‍රේරණ වැඩසටහන සඳහා අනුග්‍රහය	-	255,000
සූර්ය බලශක්ති විකිණීමෙන් ලද ආදායම	357,412	1,041,304
ව්‍යාපෘති පරිපාලන වියදම් ආවරණය	-	57,650
	168,171,224	**106,106,069**

09 ප්‍රදාන

	2022	2021 (නැවත ප්‍රකාශිත)
වැටුප් සඳහා රජයේ ප්‍රදාන	462,000,000	420,000,000
වෙනත් පුනරාවර්තන සඳහා රජයේ ප්‍රදාන	43,400,000	45,750,000
	505,400,000	**465,750,000**

10 පරිපාලන වියදම්

	2022	2021 (නැවත ප්‍රකාශිත)
මූලික වැටුප්	290,333,872	280,869,634
සභාපතිවරයාගේ වේතනය	751,855	900,000
ජීවන වියදම් දීමනාව	52,374,633	50,846,359
වෙනත් දීමනා (යොමු සටහන 10.1)	69,918,138	31,438,115
සේ.අ.අ. 12%	42,681,649	41,346,742
සේ.නි.හා.අ. 3%	10,670,412	10,336,685
මණ්ඩලයේ සේවකයන් සඳහා ප්‍රසාද දීමනා	9,860,000	6,831,000
පාරිතෝෂික (යොමු සටහන 28)	30,802,998	30,713,136
පූහුණු දීමනා	419,000	669,725
දෛනිකව වැටුප් හා දීමනා	2,361,143	2,100,568
භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	21,534,412	24,236,233
අතිකාල	27,233,540	21,498,545
නිවාඩු දින ගෙවීම්	1,647,230	1,132,528
ගමන් වියදම් (දේශීය)	3,271,243	2,413,994
ගමන් වියදම් (විදේශීය)	-	738,638
නවාතැන් වියදම්	19,480	8,985
සේවක සුබසාධනය	3,764,592	1,477,000
මණ්ඩලයේ සේවකයින් සඳහා දේශීය පූහුණු	1,734,387	620,700
ආයතනික සාමාජිකත්වය	-	31,589
වෘත්තියවේදී ආයතනවල සාමාජික ගාස්තු (දේශීය සහ විදේශීය)	25,462	125,380
කාර්ය මණ්ඩල නිල ඇඳුම්	3,553,182	1,502,001
වෛද්‍යාධාර යෝජනාක්‍රමය සඳහා දායකත්වය	2,360,200	2,390,900
ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	8,373,427	7,185,591
වෛද්‍ය පරීක්ෂණ ගාස්තු	5,001	6,205
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වියදම්	807,308	666,017
ඉන්ධන වියදම්	11,307,370	6,325,900
නඩත්තු වියදම් (යොමු සටහන 10.2)	17,919,716	14,201,668
විදුලි ගාස්තු	11,647,025	8,512,456
දුරකථන ගාස්තු	4,592,318	5,177,620
ආරක්ෂක ගාස්තු ගෙවීම්	25,415,945	26,902,835
තැපැල් සහ විදුලි පණිවුඩ	1,037,741	684,997

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

10 ඉතිරි කොටස...

	2022	2021 (නැවත ප්‍රකාශිත)
ජල ගාස්තු	938,036	942,820
කුලී, වරිපනම් සහ බදු	5,644,793	5,856,060
රක්ෂණ	187,287	726,059
පුවත්පත් සහ සඟරා	595,870	531,127
අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු	544,000	508,000
විගණන ගාස්තු	951,500	865,000
විශේෂ අවස්ථා සඳහා වියදම්	987,540	984,660
වෙළඳ දැන්වීම්	2,479,823	1,628,028
නීති ගාස්තු	1,132,284	140,362
වෙළඳ පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ ආදිය සඳහා ගාස්තු	43,859	296,437
බලපත්‍ර ගාස්තු	187,900	241,465
උපදේශක ගාස්තු	5,000	-
ප්‍රකාශන	69,965	192,843
ඡායාරූප	3,980	-
ණය සහ අත්තිකාරම් සඳහා වෙන් කිරීම්	-	(426,929)
කම්කරු නඩු සඳහා වෙන් කිරීම්	-	4,294,311
වාහන කුලියට ගැනීමේ ගාස්තු	135,000	270,000
විවිධ වියදම්	28,445	343,374
ලියාපදිංචි ගාස්තු	17,500	1,500
1995 සෘජු දුරකථන අංකය සඳහා වියදම්	609,255	-
නැවත වෙන් කිරීම් (යොමු සටහන 10.3)	(11,977,012)	(10,286,293)
කොවිඩ් 19 වියදම්	267,675	2,202,677
ක්‍රියාකාරී සැලැස්ම 2023	217,460	-
කා.ස.ම. බෞද්ධ සමාජය සඳහා පරිත්‍යාග	550,000	-
පරිත්‍යාග කිරීම - කොවිඩ් (යුෂ නිස්සාරකය)	-	1,119,469
ක්ෂයවීම (යොමු සටහන 10.4)	33,681,806	32,488,050
	693,725,247	**624,810,763**

10.1 වෙනත් දීමනා

	2022	2021 (නැවත ප්‍රකාශිත)
අතිරේක වැඩ	134,742	223,000
අධ්‍යක්ෂවරුන්ගේ ඉන්ධන දීමනාව	9,647,870	7,061,198
දුහුවිලි දීමනාව	332,896	155,438
වැඩ ආවරණ දීමනාව	863,376	561,777
දිරි දීමනාව	505,488	515,945
අතුරු දීමනාව	33,493,866	-
නිවාඩු දින දීමනාව	7,565,996	5,839,975
වෛද්‍ය දීමනා	125,827	124,479
වෘත්තීය දීමනා	12,971,900	12,840,194
සේවාස්ථාන දීමනාව	234,986	230,738
අධීක්ෂණ දීමනාව	42,000	42,000
දුරකථන දීමනාව	2,707,317	2,571,961
සුබසාධන දීමනාව	1,291,877	1,271,410
	69,918,138	**31,438,115**

10.2 නඩත්තු වියදම්

	2022	2021 (නැවත ප්‍රකාශිත)
ඉඩම්	382,845	225,068
ගොඩනැගිලි	1,780,132	2,353,745
යන්ත්‍ර සහ පිරියත	1,162,937	995,797
මුද්‍රණ යන්ත්‍ර	76,724	-
පරිගණක සහ උපාංග	1,218,844	669,870
මෝටර් රථ	6,761,160	7,397,644
කාර්යාල උපකරණ	3,160,474	1,214,870
කාර්යාල	402,738	196,732
ලී බඩු, උපාංග සහ කාර්යාල උපකරණ	12,560	1,700
බයිසිකල්	11,550	4,410
PABX පද්ධති	42,300	23,555
විවිධ වත්කම්	700	-
මෘදුකාංග, වෙබ් සහ ජාලකරණ	2,892,611	1,118,278
සූර්ය පැනල, උපයෝගිතා යනාදිය	14,142	-
	17,919,716	**14,201,668**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

10.3 නැවත වෙන් කිරීම

	2022	2021 (නැවත ප්‍රකාශිත)
යන්ත්‍ර පිරිවැය නැවත වෙන් කිරීම	(1,528,329)	(1,426,242)
පොදු කාර්ය නැවත වෙන් කිරීම	(1,709,037)	(1,693,068)
වැටුප් නැවත වෙන් කිරීම	(4,744,105)	(5,058,179)
කෙරිගෙන යන යන්ත්‍ර පිරිවැය අත්හිටුවීම	(682,216)	(195,055)
කෙරිගෙන යන පොදු කාර්ය අත්හිටුවීම්	(945,946)	(376,469)
කෙරිගෙන යන වැටුප් අත්හිටුවීම්	(2,367,380)	(1,537,280)
	(11,977,012)	**(10,286,293)**

10.4 ක්ෂයවීම්

	2022	2021 (නැවත ප්‍රකාශිත)
ඉඩම් වැඩිදියුණු කිරීම්	333,745	379,301
ගොඩනැගිලි	5,906,935	5,157,674
යන්ත්‍ර හා පිරියත	2,373,983	3,267,224
පරිගණක උපාංග	6,756,141	7,223,081
රසායනාගාර උපකරණ	8,720,189	7,755,060
මුද්‍රණ යන්ත්‍ර	460,000	503,641
මෝටර් රථ	673,916	693,976
කාර්යාල උපකරණ	3,882,139	3,688,115
ගමන් මලු	10,807	11,599
ලී බඩු සහ සවිකිරීම්	1,095,223	1,030,938
බයිසිකල්	6,686	14,827
මෙවලම් සහ අමතර කොටස්	1,055,785	554,770
පුස්තකාල පොත්	90,722	91,790
PABX පද්ධති	30,852	29,930
උපයෝගීතා සේවා	1,193,926	1,153,355
විවිධ වත්කම්	265,100	286,143
පරිගණක මෘදුකාංග	825,658	646,628
	33,681,806	**32,488,050**

11 විකිණීම සහ බෙදා හැරීමේ වියදම්

	2022	2021 (නැවත ප්‍රකාශිත)
බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම්	(312,089)	1,153,440
දිගු කාලීන හිහ ණයගැති ශේෂයන් කපා හැරීම	-	1,490,585
අලෙවිකරණ වියදම්	315,700	46,070
2022 "කර්මාන්ත" ප්‍රදර්ශනය සඳහා වියදම්	65,067,560	6,000,000
වෙනත් ප්‍රදර්ශන වියදම්	93,175	212,697
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	2,025,353	-
	67,189,699	**8,902,791**

12 මූල්‍ය පිරිවැය

	2022	2021 (නැවත ප්‍රකාශිත)
බැංකු ගාස්තු	1,029,588	588,050
බැංකු අයිරා පොලිය	40,413	-
	1,070,001	**588,050**

13 වෙනත් විස්තීර්ණ ආදායම්

	2022	2021 (නැවත ප්‍රකාශිත)
වර්ෂය සඳහා ආයුගණක ලාභය / (පාඩුව) - (යොමු සටහන 28)	15,052,636	15,123,409
	15,052,636	**15,123,409**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

14 2022/12/31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

	ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්	ගොඩනැගිලි	පිරියත, යන්ත්‍ර සූත්‍ර හා සවිකිරීම්	මුද්‍රණ යන්ත්‍ර	JICA ව්‍යාපෘති වත්කම්	කාර්යාලයීය උපකරණ
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය						
ආරම්භක ශුද්ධ පොත් අගය	**104,147,711**	**142,900,056**	**56,927,575**	**817,427**	**(1)**	**21,110,456**
එකතු කිරීම්	-	31,068,790	36,347,841	3,660,000	-	1,735,565
යළි ප්‍රකාශිත එකතු කිරීම්	-	-	-	-	-	3,161,689
බැහැර කිරීම්	-	-	-	-	-	-
අය කල ක්ෂයවීම් (යොමු සටහන 9)	(379,301)	(5,157,674)	(8,237,333)	(503,641)	-	(3,661,504)
යළි ප්‍රකාශිත සමුච්චිත ක්ෂය	-	-	(415,831)	-	-	(26,611)
අවසාන ශුද්ධ පොත් අගය	**103,768,411**	**168,811,172**	**84,622,251**	**3,973,786**	**(1)**	**22,319,595**
2021 දෙසැම්බර් 31 දිනට						
පිරිවැය	106,672,023	232,837,184	213,601,898	12,212,955	228,842,384	72,581,252
සමුච්චිත ක්ෂය	(2,903,613)	(64,026,012)	(128,979,646)	(8,239,170)	(228,842,385)	(50,261,658)
ශුද්ධ පොත් අගය	**103,768,411**	**168,811,172**	**84,622,251**	**3,973,786**	**(1)**	**22,319,595**
2022 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය						
ආරම්භක ශුද්ධ පොත් අගය	**103,768,411**	**168,811,172**	**84,622,251**	**3,973,786**	**(1)**	**22,319,595**
එකතු කිරීම්	-	8,123,904	2,595,000	-	-	4,967,056
බැහැර කිරීම්	-	-	-	-	-	-
බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂයවීම්	-	-	-	-	-	-
අය කල ක්ෂයවීම් (යොමු සටහන 9)	(333,745)	(5,906,935)	(10,798,400)	(460,000)	-	(3,882,139)
අවසාන ශුද්ධ පොත් අගය	**103,434,666**	**171,028,141**	**76,418,851**	**3,513,786**	**(1)**	**23,404,512**
2022 දෙසැම්බර් 31 දිනට						
පිරිවැය	106,672,023	240,961,088	216,196,898	12,212,955	228,842,384	77,548,309
සමුච්චිත ක්ෂය	(3,237,357)	(69,932,947)	(139,778,047)	(8,699,170)	(228,842,385)	(54,143,796)
ශුද්ධ පොත් අගය	**103,434,666**	**171,028,141**	**76,418,851**	**3,513,786**	**(1)**	**23,404,512**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

14 2022/12/31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

	රසායනාගාර උපකරණ	ගමන් මලු	ලී බඩු සහ සවිකිරීම්	බයිසිකල්	උපකරණ සහ අමතර කොටස්	පුස්තකාල පොත්	PABX පද්ධති
2021 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය							
ආරම්භක ශුද්ධ පොත් අගය	**58,194,792**	**18,662**	**5,503,499**	**255,617**	**1,120,421**	**311,296**	**136,813**
එකතු කිරීම්	7,582,181	15,800	408,657	-	2,442,985	9,835	10,109
යළි ප්‍රකාශිත එකතු කිරීම්	661,982	-	573,793	-	19,785	-	-
බැහැර කිරීම්	-	-	-	-	-	-	-
අය කල ක්ෂයවීම් (යොමු සටහන 9)	(7,734,831)	(11,599)	(1,017,456)	(14,827)	(550,081)	(91,790)	(27,360)
යළි ප්‍රකාශිත සමුච්චිත ක්ෂය	(20,230)	-	(13,483)	-	(4,689)	-	-
අවසාන ශුද්ධ පොත් අගය	**58,683,894**	**22,863**	**5,455,011**	**240,790**	**3,028,421**	**229,341**	**119,562**
2021 දෙසැම්බර් **31** දිනට							
පිරිවැය	91,575,823	1,348,355	22,878,149	316,860	17,480,499	13,522,465	4,412,919
සමුච්චිත ක්ෂය	(32,891,928)	(1,325,492)	(17,423,138)	(76,070)	(14,452,077)	(13,293,123)	(4,293,357)
ශුද්ධ පොත් අගය	**58,683,894**	**22,863**	**5,455,011**	**240,790**	**3,028,421**	**229,341**	**119,562**
2022 දෙසැම්බර් **31** දිනට අවසන් වර්ෂය							
ආරම්භක ශුද්ධ පොත් අගය	**58,683,894**	**22,863**	**5,455,011**	**240,790**	**3,028,421**	**229,341**	**119,562**
එකතු කිරීම්	5,520,507	16,000	3,825,991	-	841,258	151,497	603,603
බැහැර කිරීම්	-	(1,300)	-	-	-	-	-
බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂයවීම්	-	574	-	-	-	-	-
අය කල ක්ෂයවීම් (යොමු සටහන 9)	(8,720,189)	(10,807)	(1,095,223)	(6,686)	(1,055,785)	(90,722)	(30,852)
අවසාන ශුද්ධ පොත් අගය	**55,484,213**	**27,330**	**8,185,779**	**234,104**	**2,813,894**	**290,116**	**692,312**
